# රන් රසු

# නිර්මාණ සංග්‍රහය

ප්‍රකාශනය
පීය ප්‍රකාශන කමිටුව
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# රන්රසු

## නිර්මාණ සංග්‍රහය

**ප්‍රකාශනය**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**ගංගොඩවිල, නුගේගොඩ**

**2020**

# රන්රසු
## නිර්මාණ සංග්‍රහය

**සංස්කරණය**
ආචාර්ය ජයලතා මැදවත්ත

**සංස්කරණ සහාය**
සහාය කථිකාචාර්ය භාග්‍යා මාඹුලගේ
සහාය කථිකාචාර්ය සඳුනිකා රත්නායක

**ප්‍රකාශනය**
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ
**2020**

## රන්රසු නිර්මාණ විනිශ්චය මණ්ඩලය

**කෙටිකතා**

පළමු වැනි වටය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නේරංජ බණ්ඩාර
අවසන් වටය - ආචාර්ය කුමුදු කරුණාරත්න,
කොළඹ විශ්වවිද්‍යාලය

**කාව්‍ය නිර්මාණ**

පළමුවැනි වටය - සහාය කථිකාචාර්ය භාග්‍යා මාඹුලගේ
සහාය කථිකාචාර්ය සඳුනිකා රත්නායක
අවසන් වටය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ

## රන්රසු නිර්මාණ සංග්‍රහය

© සංස්කාරක : ආචාර්ය ජයලතා මැදවත්ත

උපදේශකත්වය : ආචාර්ය වසන්ත මෙන්ඩිස්

සංස්කරණ සහාය : සහාය කථිකාචාර්ය භාග්‍යා මාඹුලගේ
සහාය කථිකාචාර්ය සඳුනිකා රත්නායක

ප්‍රථම මුද්‍රණය 2020

ISBN 978-624-5360-12-3

| | | |
|---|---|---|
| සම්බන්ධීකරණය | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඉමංගා නදීෂානි |
| පිටකවරය නිර්මාණය | : | පැතුම් නිමන්ත (සිවුවන වසර විද්‍යාර්ථී) |
| පරිගණක පිටු සැකසුම | : | විජේවර්ධන ක්‍රියේෂන්ස් |
| ප්‍රකාශනය | : | මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>ගංගොඩවිල, නුගේගොඩ. |
| මුද්‍රණය | : | නිල්වාන් ග්‍රැෆික්ස්<br>නො. 73,<br>කොටා ගාර්ඩ්න්,<br>කොටා රෝඩ්, බොරැල්ල. |

රන්රසු නිර්මාණ සංග්‍රහයට ඇතුළත් නිර්මාණවල භාෂා භාවිතය හා පද බෙදීම් පිළිවෙළ ඒ ඒ නිර්මාණකරුවන්ගේ අභිමතාර්ථය පරිදි බව සැලකුව මැනවි.

# උපකුලපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ප්‍රකාශන දිනය නිමිත්තෙන් පළ කරනු ලබන **'රන්රසු නිර්මාණ සංග්‍රහය'** උදෙසා වත්මන් උපකුලපතිවරයා වශයෙන් සුබ පැතුම් පණිවිඩයක් එක් කිරීමට ලැබීම මහත් ගෞරවයකි.

ජාතික හා අන්තර්ජාතික වශයෙන් ඇගයීමට පාත්‍ර වී ඇති බොහෝ වියතුන්ගේ ජන්ම භූමිය වූ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය නවමු සත්කාර්ය සිදු කිරීමෙහිලා ප්‍රමුඛතාව ගෙන කටයුතු කරයි. පීඨයේ නාමය තවතවත් කීර්තියට පත් කරමින් මෙම වසරේදී සංවිධානය කරන්නට යෙදුණු 'පීඨ ප්‍රකාශන දිනය' එබඳු නව්‍ය සංකල්පයක අග්‍ර ඵලය වෙයි. සමස්ත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍ය ප්‍රජාවගේ ප්‍රකාශන කටයුතු ඇගයීමට ලක් කිරීමේ මූලික අභිලාසය සහිතව සංවිධානගත වී ඇති මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ප්‍රකාශන කමිටුව මෙම සංකල්පය ක්‍රියාවට නැංවීම උදෙසා කැප වී කටයුතු කරයි.

පීඨ ප්‍රකාශන දිනයට සමගාමීව ප්‍රකාශයට පත් කරනු ලබන මෙම රන්රසු නිර්මාණ සංග්‍රහයෙහි අන්තර්ගත වන්නේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ විද්‍යාර්ථීන්ගේ ස්වයං නිර්මාණයි. ඒ අනුව 'රන්රසු නිර්මාණ සංග්‍රහය' යනු නවක නිර්මාණකරුවන් සාහිත්‍ය ලෝකය වෙත ගෙන යනු ලබන අත්වැලයි.

එකී අත්වැල සවියක් කොට ගනිමින් ස්වකීය නිර්මාණ කුශලතාව මැනවින් ප්‍රගුණ කර ගැනීමට මෙම විද්‍යාර්ථීන් කටයුතු කරන්නේ නම් විශ්වවිද්‍යාලයක් ලෙස අප ලබන ඉහළම ප්‍රතිලාභය එය වනු නොඅනුමානය.

මේ වූ කලී සාමූහික ව්‍යායාමයක අවසන් ප්‍රතිඵලයයි. ඒ අනුව මෙකී කර්තව්‍ය මුදුන් පමුණුවා ගැනීමට මූලිකත්වය ගෙන කටයුතු කළ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි පීඨාධිපතිතුමා, පීඨ ප්‍රකාශන කමිටුවෙහි සභාපතිතුමිය ඇතුළු සාමාජික භවතුන් වෙසෙසින් අගයමින් මෙහිලා සහාය වූ විද්වතුන් හට මාගේ ප්‍රසාදය හා කෘතඥතාපූර්වක ස්තුතිය පුද කර සිටිමි. එසේම මෙම නිර්මාණ සංග්‍රහය උදෙසා නිර්මාණකරණයෙන් දායක වූ සියලු විද්‍යාර්ථීන්ගේ ඉදිරි කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා යැ'යි ශුභාශිංසන එක් කරමි.

**ජ්‍යෝෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ**
**උපකුලපති**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ පණිවිඩය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ප්‍රකාශන කමිටුව විසින් ප්‍රථම වරට සංවිධානය කරනු ලබන **'පීඨ ප්‍රකාශන දිනය'** පාදක කොට ගනිමින් ප්‍රකාශයට පත් කරනු ලබන **'රන්රසු නිර්මාණ සංග්‍රහය'** උදෙසා පණිවිඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

විශ්වවිද්‍යාලයකට පැමිණෙන සිසුන්ගේ මූලික අභිලාසය අධ්‍යාපනය ලැබීම වුවද, අප විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් සිසුන්ගේ පරිකල්පන ශක්තිය වර්ධනය කරනු වස් මෙවැනි කර්තව්‍ය රාශියක් සිදු කරනු ලබයි. එහි එක් ව්‍යායාමයක් ලෙස මෙම රන්රසු නිර්මාණ සංග්‍රහය හඳුන්වා දිය හැකිය. 2019 වර්ෂයේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යයෙහි කෙටිකතා හා කාව්‍ය යන තරග අංශ සඳහා ඉදිරිපත් වී, අවසන් වටයට නිර්දේශ වූ නිර්මාණ මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගත වෙයි.

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ ම ප්‍රකාශනයක් ප්‍රථම වරට එළිදැක්වීමට කටයුතු කිරීම පිළිබඳව පීඨ ප්‍රකාශන කමිටුවේ සභාපතිතුමිය ඇතුළු සියලුම කමිටු සාමාජිකයින්ටත්, 2019 වර්ෂයේ රන්රසු අභිනන්දන කලා මංගල්‍යයේ සියලුම කමිටු සාමාජිකයින්ටත්, මේ සඳහා නිර්මාණ දායකත්වය ලබා දුන් සියලු විද්‍යාර්ථීන්ටත් මාගේ ප්‍රසාදය හා කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනමමි.

**මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද**
**පීඨාධිපති**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**

# පීඨ ප්‍රකාශන කමිටු සභාපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ප්‍රකාශන දිනය නිමිත්තෙන් පළ කරනු ලබන 'රන්රසු නිර්මාණ සංග්‍රහය' වෙනුවෙන් ශුභාශංසන එක් කරනුයේ ඉමහත් සතුටිනි.

සාහිත්‍ය මාසය නිමිති කොට ගනිමින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ, අධ්‍යයන, අනධ්‍යයන හා ශිෂ්‍ය විද්‍යාර්ථීන් විසින් ප්‍රකාශිත කෘති ඇගයීමට ලක් කරනු පිණිස 'පීඨ ප්‍රකාශන දිනයක්' මෙසේ සංවිධානය කරනු ලබන්නේ ප්‍රථම වරට යි.

පීඨ ප්‍රකාශන දිනයට සමගාමී ව ස්ව අභිමතය පරිදි තෝරා ගත් මාතෘකා ඔස්සේ විද්‍යාර්ථීන් විසින් 'රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යය - 2019' සඳහා ඉදිරිපත් කරන ලද කෙටිකතා හා කාව්‍ය අතුරින් අවසන් වටය සඳහා තෝරා ගත් නිර්මාණ ද 'රන්රසු නිර්මාණ සංග්‍රහය' මගින් ප්‍රකාශයට පත් කෙරේ.

සැබවින් ම විද්‍යාර්ථීන්ගේ නිර්මාණ කෞශල්‍යය හා සාහිත්‍යය පිළිබඳ වන උනන්දුව අභිවර්ධනය කිරීමේ මූලික පරමාර්ථයෙන් යුතු ව එළි දැක් වූ මෙම කෘතිය නුදුරු අනාගතයෙහි ප්‍රශස්ත සාහිත්‍යධරයකු බිහි කිරීමේ මූලික අඩිතාලමක් වනු නොඅනුමාන ය.

පීඨ ප්‍රකාශන දිනයට සමගාමී ව 'දිසිවිදැසි පද්‍ය කාව්‍ය සංග්‍රහය' නමින් විද්‍යාර්ථීන්ගේ නිර්මාණ ඇතුළත් තවත් කෘතියක් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම **පීඨ ප්‍රකාශන දිනය** වත්මන් පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහාත්මාගේ සිහිනයක් මල් ඵල ගැන්වීමකි.

කලක් තිස්සේ සාකච්ඡා මට්ටමින් පැවැති මෙම කාර්යය කෝවිඩ් 19 ගැටලුව හේතුවෙන් මන්දගාමී වුවත් පීඨ ප්‍රකාශන කමිටු සාමාජිකයන්ගේ මහත් කැපවීම හේතුවෙන් මෙය සාර්ථක කරගැනීමට හැකි වූ බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙකී සත්කාර්යය මුදුන් පමුණුවා ගැනීම සඳහා අනුග්‍රහය ලබා දුන් උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මැතිඳුන්ට, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මැතිඳුන්ට, පීඨ ප්‍රකාශන කමිටුවේ සියලු සාමාජික භවතුන්ට හා විවිධාකාරයෙන් සහයෝගය ලබා දුන් සැමට ප්‍රණාමය පුද කර සිටිමි. 'රන්රසු නිර්මාණ සංග්‍රහය' මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ සියලු නිර්මාණවල කතුවරු අනාගතයේ දී මහා සාහිත්‍යධරයන් බවට පත්වෙත්වා!

මේ අපගේ හෘදයංගම ප්‍රාර්ථනාව යි.

**ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල**
**සභාපති**
**පීඨ ප්‍රකාශන කමිටුව**

# සංස්කාරක සටහන

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ප්‍රකාශන කමිටුව විසින් ප්‍රථම වරට සංවිධානය කරනු ලබන පීඨ ප්‍රකාශන දිනය වෙනුවෙන් රන්රසු නිර්මාණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමට ලැබීම අපගේ ඉමහත් සතුටට මෙන්ම ප්‍රසාදයට හේතු වෙයි. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් විසින් ස්ව අභිමතය පරිදි නිර්මාණය කරන ලදුව, 2019 වසරේ පැවති රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යයේදී කෙටිකතා හා කාව්‍ය නිර්මාණ අංශවලින් අවසන් වටය සඳහා සුදුසුකම් ලැබූ කෙටිකතා හා කාව්‍ය මෙම නිර්මාණ එකතුවෙහි ඇතුළත් වෙයි.

විද්‍යාර්ථීන්ගේ නිර්මාණ කුශලතා ඔප් නැංවීම සඳහා දිරි දීම මෙම නිර්මාණ එකතුව ප්‍රකාශයට පත් කිරීමේ අරමුණයි. මෙහි ඇතුළත් නිර්මාණවල ගුණාත්මක භාවයෙහි අඩුලුහුඩුකම් පවතින නමුදු, ආධුනික නිර්මාණකරුවන්ගේ දායකත්වය හා කුශලතාව මෙහිලා වෙසෙසින් අගය කළ යුතුය. එමෙන්ම මෙම නිර්මාණ එකතුව අනාගතයේදී වඩාත් පරිසමාප්ත නිර්මාණ බිහිවනු දැකීමේ අභිලාසය පෙරදැරිව පළ කරනු ලබන්නකි.

මෙම නිර්මාණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම සඳහා දිරිදුන් වත්මන් උපකුලපති ජෝර්ජ් මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා, මාර්ගෝපදේශකත්වය සැපයූ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහතා සහ පීඨ ප්‍රකාශන කමිටුව වෙත අපගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමු. එසේම මේ සඳහා නිර්මාණ දායකත්වය සැපයූ සියලු විද්‍යාර්ථීන්ගේ අනාගත නිර්මාණ දිවිය සාර්ථක වේවා! යැ'යි ශුභ ප්‍රාර්ථනා එක් කරන්නෙමු.

**සංස්කාරක මණ්ඩලය**

# පෙළගැස්ම

පිටු අංක

1. අමුතු නැති අමුතු මල්........................................ 15
2. හීන ගොඩට ගේන මිනිස්සු...................................20
3. ඊෂාගේ ලෝකය................................................ 22
4. මනමෙ මං තව හිතනවා......................................31
5. චක්‍රපාද.......................................................... 32
6. නොවේ අභිසරු ලියක් නුඹ මට............................ 38
7. තරු ලකුණ.................................................. 39
8. අවුරුද්ද.......................................................... 45
9. තල මල පිපුණා................................................ 46
10. පුළුවන්ද මරාගෙන කන්න දරුවෙක්ව...................... 51
11. දං............................................................ 53
12. පෙන්නාපන් 'ප'යනු පුප්පාපන් පෙනය.................. 56
13. දෝතලු.......................................................... 58
14. සාවිත්‍රිගේ සිංහල අකුරු......................................... 68
15. රොකට් එක.................................................. 70
16. නෙළුමක් (නො) වෙමි..................................... 80

17. ලියුම් කඩදාසිය………………………………………… 81

18. සුදු හාමිනේ……………………………………….. 87

19. ලිලී මල ………………………………………….. 89

20. සැලුන් වාසේ……………………………………….. 99

# අමුතු නැති අමුතු මල්

ඕන ම කතාවකට පෙරවදනක් තියෙනවා. ඒත් පෙරවදනකට වඩා මගේ අදහස කියන්න කැමතියි.

හීන දකින්න පුළුවන් ඇස් පියාගෙන. ඒත් මං ඒ හීනය ඇස් ඇරගෙන දැකපු හීනයක්. කවුරුවත් හිතපු නැති වෙලාවක ඉස්කෝලේ දක්ෂම ශිෂ්‍යයා ඉස්ටේජ් එකට නැගලා එයාගේ 'අනාගත හීන' ගැන කතාවක් කරන කොට එයාගේ පස්සේ හැංගිලා ගිය මගේ හිත කියපු කතාව. පුංචි කාලේ හීනෙන් ඉස්ටේජ් එකට නැගපු මං හැමෝටම ඇහෙන්න මෙහෙම කතාවක් කිව්වා.

'' ලෝකේ මල් ගොඩක් පිපෙනවා. ඒ එක එක වෙලාවට. උදේට, රෑට, ඉර එළියට වගේ ම හඳ එළියටත්....... ඒත් කාටවත් අයිති නැති මලුත් පිපෙනවා හරි හරියට අවේලාවට.''

මං සනෝජා කාරියවසම්. මටත් හැමවෙලේම ලොකු ලොකු හීන තිබ්බා. වෙලාවකට ඕන වුණු. වෙලාවකට එපා වුණු. කාටහරි කිව්වොත් පිස්සු කියලා හිතෙන හීන.

*****

''කෙල්ලේ උඹ අර පීරිස් මහත්තයව බැඳපන්. දෙයියෝ බුදුන් බලනවා වගේ අපේ පිහිටට ඉන්නේ ඔය මනුස්සයා විතරයි. වයස කියන්නේ කසාදෙට බාධාවක් නොවෙයි.''

'' මට බෑ කිවුවහම බෑ ම තමයි.''

''ඇයි උඹට බැරි වෙන්න හේතුව මොකක් ද. ඇයි ඒ මිනිහාගේ අඩුව මොකක් ද. නොදකින් තොපිට කාලා ඇඳලා ඉන්න පින නැති හැටි.''

අම්මට ඕන වුනේ පීරිස් මුදලාලිට මාව බන්දලා දෙන්න. මගේ අකමැත්තට හේතුව මට වෙන සම්බන්ධයක් ඇති යැයි හිතපු එක නෙවෙයි. අම්මා ඒ පැත්තෙන් මාව විශ්වාස කළා ඉහටත් උඩින්. අම්මට කොහොමත් මාව තේරුම් ගන්න බැරි වුණා. ඒක නිසා අවසානෙදී භූත දෝෂ අරින්න තොයිලෙකුත් නැටුවා. ඒකටත් මුදලාලිගේ සල්ලි. කොහොමින් කොහොම හරි අන්තිමට අම්මගෙ කැමැත්ත ඉෂ්ට කරන්න මට සිද්ධ වුණා. මාව මුදලාලිට ම සින්න වුණා.

කොළඹආරගේ ජස්ටින් පීරිස්ගේ අතිනත ගත් වාසනාවන්තිය දිසානායක මුදියන්සේලාගේ ශ්‍රියානී සමරතුංග.

ඕනෑම කෙනෙක් ජීවිතේ ආසාවෙන් ගත කරන්න කැමතිම දවස මං අකමැත්තෙන් රැලි වැටුණු මස් පර්වතේකට යටවෙයි කියලා හීනෙන්වත් හිතුවේ නෑ. කොහොම නමුත් දවසින් දවස ඒ ජීවිතේට අකමැත්තෙන් උනත් මූණ දෙන්න මට සිද්ධ වුණේ සනුහරේ උන්ගේ පම්පෝරි මැද්දේ. මුදලාලිගේ සනුහරේට මගේ රූප සොබාව, තරුණ වයස ආඩම්බරේට කාරණාවක් වගේ ම මගේ නෑයන්ට මුදලාලිගේ මොනර කොළ ආඩම්බරයක් විය.

මොනවා වුණත් කාලයක් යද්දී මනුස්සයාගේ නමින් මගේ උකුලේ එකා දෙන්නා බර වෙන කොට මනුස්සයාගෙයි මගෙයි රූපයේ වෙනසක් නැති බව තේරෙන්න වුණා. පොඩිවුන්ගේ හිනා හඬ කොයි වේදනාවත් යට කරගෙන යනවා. යාන්තම් වයස විසි පහ වෙනකොට මගේ පපුව පැටවු හතර දෙනෙක්ට කිරි එරිලා ඉවරයි. ඒ වුණාට මහ මිනිහට ඒකෙන් කිසිම වැඩක් නෑ. ගෙදර වැඩ ළමයින්ගේ වැඩ අස්සේ මට මහ මිනිහව වෙලාවක් අවේලාවක් නැතුව නළවන්නත් වෙනවා. නැත්නම් මෙතන අම්ම මුත්තා සිහි කරලා ආඩපාලි නටන්න ලෑස්ති වෙයි. අම්මලා දන්නවා ද ඕවා. උන්දැලා හිතන්නේ හරියට උයා පිහා දෙන්නෑ කියලා. පොඩිවුන්

යහමගට ගන්න ඕන නිසා දැන් බැඳගත්ත බෙරේ ගහන්න ම වෙනවා.

**අමුතු මල්.............**

**ජීවිතය කියන්නේ යාත්‍රාවක්. මහ මුහුද නමැති සංසාරය දිගේ සැඩ සුළං, මහ රල ගෙඩි එක්ක තරග කරන දිනුම් කණුව නොපෙනෙන තරගයක්. දෑස් පෙනුණත් අන්ධයන් මෙන් හැසිරෙන, කන් ඇහුණත් බීරන් මෙන් සිටින මාළු මේ මුහුද පුරා සී සී කඩ ගමන් කරති.**

වටපිට බලලා මේසෙට ඉඳගත්ත මං ආපහු සැරයක් එකතු කර ගත්ත කොළ ටික එක හුස්මට කියවන්න ගත්තා අල්මාරියේ මුල්ලක හිරවෙලා හිටපු කඩදාසි මට හිනා වෙන්න ගත්තේ අනේ උඹෙ පණ්ඩිතකම් කියන්නා සේ ය. කටින් කියන්න බැරි දේවල් පෑනට කියන්න පුළුවන් කියලා දැන ගන්නේ පුංචි කාලේ දී රචනා තරගෙන් පළවෙනියා වුණු දවසේ.

**මේ ඇගේ කතාවයි. සුරම්‍යා හෙව්වේ කාටවත් අත නොපා ජීවත් වෙන්න මගක්. ඔව් ඇයට ලැබුණා මෝරපු ලොකු ගහක්. වැලක් වුණත් කැමති හයිය තියෙන, ඒත් තමන් එක්ක පැද්දෙන්න පුළුවන් ගස්වලට. ඒත් මේ ගහ හුළඟට තියා මහා මේසයකටවත් නොසෙල්වෙන ගහක්. වැලේ හුස්ම නොහඳුනන ගහක්.**

නැකැත් බලලා එළියට වඩම්මපු කඩදාසි දෙස තවත් ඇස් දෙකක් බලා හිඳී කියලා කවුද හිතුවේ. මුදලාලිගේ ඒ ඇස් වල තිබුණේ පැටලුණු ස්වභාවයක්. මගේ නෙත් ඒ නෙත්වල පැටලුණු ගමන් නිදා හුන් යක්ෂයා අවදි වුණා.

'' මේ ගෑනිට වෙන වැඩ නැද්ද සැපට ඉදගෙන ඉන්න. මං මේ තේ වතුර ටිකක් ගෙනෙයි කියලා බලාන උන්නේ. කොහෙද මෙතන විගඩම් නටන්න තියා ගත්තා. මෙහේ දීපිය ඔය ටික මෙහාට. කාටද බොල ගතු කියන්නේ...''

''කාටද තෝ මේ ලියන්නේ. හොර මිනිහට ද.''

කොණ්ඩයෙන් ඇද කම්මුලට පහරක් ගසා පුටුවකට ද පයින් ගැසූ ඔහු කඩදාසි ටික උනන්දුවෙන් කියවන්නට වුණා. ඉබේ ම ළඟ තිබුණ පුටුවක් මතට ඇඳ වැටී අසිහියෙන් හා කේන්තියෙන් පිටු පෙරළුවා.

**ඇය වේදිකාවට නැගලා ස්ත්‍රී චින්තනය ගැන මෙහෙම කතාවක් කිව්වා. ගෑනු කැමති පිරිමින්ට නොතේරෙන දේවල් කියන්න. ඒ කියන්නේ නොතේරෙන භාෂාවකින් තමන්ගේ හැඟීම් කියන්න. ඒක ගොඩක් පිරිමින්ට තේරුම් ගන්න අමාරුයි. මේක අපි දන්න සරල දෙයක්. ඇය දෙයක් එපා කියන්නේ ඒ එපා ම කියන දේ නොවෙන්න පුළුවන්. ඒ වගේ ම කැමැත්ත හඟවන්න හා කිව්වට ඒ තුළ අකමැත්ත පවතින්න පුළුවන්. එය ගැහැනිය හැසිරෙන ආකාරය මෙන් ම එම අවස්ථාව ද තේරුම් ගත යුතු දෙයක්.**

**ගැහැනියකට පුළුවන් ලෝකයක් මවන්න වගේ ම ලෝකයක් විනාශ කරන්න. එනිසා ගැහැනියක් පුරුෂාධිපත්‍යය තුළ ගිළී ජීවත් විය යුතු නැහැ. ඇයට ස්වාධීන චින්තනයක් මෙන් ම ස්වාධීන ජීවිතයක් උරුම විය යුතුයි. ගැහැනියට පවුල තුළ මෙන් ම සමාජය තුළ ද නිසි තැන හිමි විය යුතුයි. .......**

''ආහ්... මාව හදන්න ද උඹ දත කන්නේ. ඔව් හැමදේට ම පිරිමි වැරදියි. තොපිට කන්න අඳින්න දෙන කොට හොඳයි. උඹ දැන ගනින් ඔය බඩේ එකා නොහිටියා නම් මං තොට කරන දේ. ආවා මෙතන චින්තනේ හොයන්න.''

''මගේ නෙවෙයි ඕවා. මට පාරේ වැටිලා තිබිලා හම්බ වුනේ. නම ඇති අන්තිමට. මාත් බැලුවේ කාගෙද කියලා.''

**ඉතිං, නුඹ කාන්තාවක් ලෙස නුඹවම ගොඩ නඟා ගත යුතුයි.**

**සුරම්‍යා තමන්ගේ මංගල කතාව නිම කර වේදිකාවෙන් බැස ආවේ කවුරුත් නමක් නොදන්නා එහෙත් ලොව ම සුවඳවත් කරන නැවුම් මලක් මෙනි.**

**'කර්තෘ - සනෝජා කාරියවසම්'**

'' ඇයි උඹට මිනිහෙක් ඉන්නවා කියලා මතක නැද්ද? මේවා උඹට වැඩක් නෑ. මට කඩේට ගෙනත් දෙන්න තිබුණේ නැද්ද? කඩේ පත්තරත් ඉවර වෙලා.''

****

අප බලාපොරොත්තු වන හීන එක් රැයකින් එළි නොවෙනවා වගේ ම බිඳ වැටි වැටී ගොඩනැගෙන හීන අපූරුයි. සනෝජා කාරියවසම් වන මසිතේ ශ්‍රියානි සැඟවී ජීවත් වන බව සහෘද ඔබට කිව යුතුය.

''මං ආසයි කවුරුත් හිතන්නැති රහසක් කියන්න. වටපිට බලන්න. කවුරුත් නොහිතන තැනක රහසෙ ම නම් නැති අමුතු මල් පිපෙනවා අවේලාවට.''

**ඩී. එල්. එස්. යූ. ලියනගේ**
**සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**

# හීන ගොඩට ගේන මිනිස්සු

සේද සළුපිළි වාගෙ පෙනුණට රැල්ලෙ රුදු බව දන්නවා
පැද්දි පැද්දී යනව කිව්වට ගැහෙන හද බිය දන්නවා
අස්වැන්න ගොඩබිමට ඇද්දට පිරෙන පව් බර දන්නවා
පවෙන් මිදුණොත් ගෙපැල සා ගිනි හින්දා දූවෙනව දන්නවා

ඉගෙන ගන්නෙත් නැතුව කළ රැකියාව අද මම කරනවා
දරු පැටව් කුස පිරෙව්වම මගෙ හදෙහි ලතැවුල් මැකෙනවා
බිරිඳ සෙනෙහෙන් පිසින බත් පත ගමන පාළුව මකනවා
දරුවො දෙන්නගෙ වාසනාවට මුහුදෙ සම්පත ලැබෙනවා

මරුවා හිසමත තියාගෙන රෑ වෙන්න දියඹට ඇදෙනවා
යාන්තං ගැස්සුණත් ඔරුවම දරු පැටව් රුව මැවෙනවා
කුණාටුත් දියවැල් ද මගහැර රටට අස්වනු ගේනවා
ගේන මාළුත් රහට ගිලලා කරා කුලයට බනිනවා

නොයෙක් දුක් විඳ කරන රස්සා ලොවේ හැමතැන තියෙනවා
කාටවත් අත නොපා ඉන්නට උදව් මුහුදෙන් තියෙනවා
මුහුදු රස්සා පිහිට ලැබගෙන ගෙදර දොර ගොඩනගනවා
දිවිය රැකදෙන රස්සාව මගෙ මල් තියලා මම වඳිනවා

දරුවො ලොකුවෙලා දිනන දවසක රස්සාව අතහරිනවා
ලොකු පුතා දොස්තර කෙනෙකු වී බලා ගන්නවා කියනවා
මටත් බැරිවුණු අකුරු ගළපලා දරුවො උගතුන් කරනවා
මසුන් මරලා රැකෙන අපටත් හීන ලොකුවට තියෙනවා

දවස අරඹන හිරුගෙ අරුණලු රැගෙන ගොඩබිම පදිනවා
ඔරුව පුරවලා ගේන අස්වනු ධනලක්ෂ්මී වී වඩිනවා
ගෙදර කිරි පැණි ඉතිරිලා ඇති අයුරු සිහිනෙන් දකිනවා
හීන ඉටු වෙන දවස වෙනකම් මාත් මේ පව ගෙවනවා

**ජී. ඒ. අමිල නුවන් ශ්‍රී ශාන්**
**මානවවිද්‍යා අධ්‍යයනාංශය**

# ඊෂාගේ ලෝකය

වසන්තයේ පැහැබර හිරු එළිය කඳුකරයේ ළපලු සිඹිමින් පැතිර යද්දීත්, තණ පත් අතර පිපි කුඩා සුදු මල් අඳුර සමග මැලවී යද්දීත් කුඩා ඊෂාගේ රුව පාන්දරත්, සැන්දෑවේත් එකසේම මම කඳුකර වටපිටාවේ කොතැනකදී හෝ දුටුවෙමි. කුඩා වාටියකින් පමණක් පැහැය මේ යැ'යි හඳුනාගත හැකි පරණ රතුපාටැති ගවුම් පොඩියක් ඇඳ සිටි ඇය, දුර්වර්ණ වූ තොප්පියක් ද පැළඳ සිටියාය. එහි ගැටගසා තිබුණු විනිවිද පෙනෙන පීත්ත පටිය නැවුම් සුළඟේ නිදහසේ පාවෙන අයුරු මට මතකය. කොහෙන් කොයිබට දිවයන්නේ ද කාගේ කවර පණිවිඩ රැගෙන යන්නේදැයි නොදන්නා සීතල සුළඟ මා ගත සලිත කරවූවත් කුඩා ඊෂාගේ මොළකැටි අතපය සසල කරවීමට සමත් නොවීය.

එකල දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය සේවකයකු ලෙස සේවය කළ මා පාන්දර දුම්රියේ නැගී සේවයට ගොස් නැවත ගමට පැමිණෙන විට හැන්දෑවේ බැස යන හිරු පමණක් මගේ තනි නොතනියට සිටි බව මුල දී මම සිතා සිටියෙමි. එහෙත් තවත් අයෙකු ද ඒ අවටම සැබැවින් ම මා සමග විය. ඒ ඊෂා ය. ඕ හිමිදිරියේත්, හැන්දෑවේත් කඳුකර ගම්මානයේ කොයිබක හෝ දඟකාර ලෙස දුව ඇවිදිමින් සිටින බව මම දැන ගත්තෙමි. ඇගේ කෙළිලොල් රුව ඇස නොගැටුණත්, ඈ ගයන අරුත් සුන් වචන පෙළ සවනට නොවැටුණත් ඈ ගම්මානයේ කොතනක හෝ තනිව මුමුණමින් ගැවසෙන බව මම දත්තෙමි. ඊෂා අපූරු දැරියක වූවාය. ඇගේ මව කඳුකරයේ මල් වවමින් හා ඒවා එකතු කරමින් ඒ මල් නගරයට විකුණා ඊෂාගේ ඕනෑ එපාකම් පිරිමැසුවාය. ඈ

නොදන්නා මලක් ඒ ගම්මානයේ ගහක් යට, ගලක් යට, විලක, ඉවුරක පිපේදැයි මට සැකය. ඒ තරමට ඔවුන්ගේ ජීවිත පරිසරය හා බැඳී තිබුණි. ඔවුහු ජීවිතය වින්දාහ. පරිසරයට ඇලුම් කරමින් ජීවිතයේ වින්දනය ලදහ.

ඊෂා ස්වභාවයෙන්ම නිහඬ පිළිවෙතක් උරුම කරගත්තා ය. ළමා වියේ දඟකාර මානසිකත්වය වෙනුවට ඈ තුළ උපතින්ම ලැගුම්ගත් තැන්පත් චර්යාව මා සිත් ගැනීමට සමත් විය. ඈ සමග කුලුපග වීමට අපේක්ෂාවෙන් සිටි මම දිනක් මා යන පාරේ අයිනක ඈ සිටිනු දැක නතර වීමි. ඕ බොරලු පාරේ දණ ගසා ගෙන විමසිල්ලෙන් කුඩා මල් පඳුරක් දෙසට එබී සිටියාය. නතර වූ මම,

"ඊෂා මොනවද හොයන්නේ" යි ඇසීමි.

නැගී සිටි ඇය අතකින් දූවිලි පිස දමමින් හිස දෙපසට සැලුවාය.

"මොකුත් නෑ" පිළිතුරු ලෙස මා ලද්දේ එපමණකි. ඇය තම අනිත් අතින් කිසිවක් පිටුපසට කර සඟවා ගන්නා අයුරු මම දුටුවෙමි.

"මොකක්ද ඒ අතේ තියෙන්නෙ?"යි මා විමසිල්ලෙන් ඇසූ විටද ඈ පැවසුවේ එකම පිළිතුරක් විය.

"මොකුත් නෑ" ඇය සිනාසුණා ය. ඇගේ ළාමක මුහුණේ සිනාසෙන ළමා දැස් මට මතකය. සුළඟට දඟ දෙන ඇගේ සිනිඳු කෙහෙරැලි අතින් පසෙකට කරමින් ඈ නිහඬව සිටියාය.

පාරෙන් අයිනකට වී ඈ මට ඉඩ දී බලා සිටියේ මා එතනින් පියමං වනතුරුය. තනිව ඇවිදින, තනිව ගහකොළ සමග දොඩමලු වන මේ ළදැරියට වැඩිහිටියකු වූ මා සමග කතාව කිසිසේත් රිසි නොවීදැයි මට නිකමට සිතුණි. මල්, කොළ, කුඩා කෘමීන්, කුහුඹුවන්, පළඟැටියන් සමග වරු ගණන් ගෙවන ඊෂාගේ ළපටි ලෝකයේ මේ ලෝකයට අයිති නොවන ආකාරයේ අමුතු සෞන්දර්යයක් තිබුණි. ඈ සෙවූ ප්‍රීතියත් සැනසිල්ලත් ඇය ගහකොළ මල් අතරම

වින්දාය. ආයාසයෙන් හෝ සංවාදගත වී වචන අතරින් ඒ සුවය විඳීමට ඇය උත්සාහයක් නොගත්තීය.

පසුදිනද ඊෂා පාසල් යනවිට ඈ රුව මා නෙත ගැටුණි. රේල්ලුවට යන මා ඉදිරියෙන් ඇවිද ගිය ඇයට මග දිගටද රාජකාරි බොහොමයක් විය. නිදිකුම්බා පඳුරු නිදි කරවීම, මදටියා, කොට්ටන්, කජු ඇට ඇහිඳීම, කුරුලු පිහාටු සුළඟේ පා කිරීම සඳහා ඇයට නතර වීමට සිදුවූයේ වරක් දෙවරක් නොවේ. ඇය නිදහස් අහසේ සැරිසරන කිරිල්ලියක බඳු විය. අසීමාන්තික ලෝකයේ වින්දනීය නිදහසක් ලබන ඈ දෙස බලන වැඩිහිටි මගේ හිත පවා ලැබුවේ ආනන්දයකි.

පටු මාවතට හැරෙද්දී ඇගේ දෑත් අතර තුරුලු වී තිබූ කුඩා වීදුරු බෝතලයක් මම දුටුවෙමි. ඒ තුළ කිසිවක් වූ නමුත් ඒ කවරක්දැයි මම පැහැදිලිව නොදුටුවෙමි. කෙසේ වුවත් ගැමියන් වැඩිමනත් නොගැවසෙන පාලු කැලයේ ඊෂාගේ ඇවිදීම ගැමියන්ට ගැටලුවක් නොවුණ ද, මට අමුත්තක් විය. සතා සිවුපාවාගෙන් විය හැකි අනතුරු මෙන්ම වෙනත් භයානක දෙයක් සිදුවීමට කිසිසේත් ඉඩක් නැතැයි විශ්වාසයෙන් කිව හැක්කේ කාටද? ඊෂාගේ මව් හමු වූ මොහොතක මා ඇයට ඒ බව කී විට ඈ පැවසුවේ ඊෂාගේ නිදැල්ලේ ඇවිදීම නතර කිරීම තමාට උගහට බවයි. ඈ යන්තම් ඇවිදින කාලයේ සිට කැලේකොළේ ඇවිදීමටම යොමු වූ සිත මෙල්ල කිරීම තමාට නොව දෙවියන්ට පවා කළ නොහැක්කක් බව ඇය ඇදහුවා ය.

එවෙලේ මල් පාත්තියක තණ කොළ ගලවමින් සිටි ඕ හිස නොඔසවාම වැඩෙහි නිරත වෙමින් සිනාසුණාය.

"සමනල්ලු හදනවයි කියන්නෙ. ඉස්කෝලෙ ටීච කියා දුන්නයි කියල"

එපමණකි ඇය කීවේ. ඇගේ පිළිතුර කෙතරම් සැහැල්ලු වීද! බැද්දට වී කාලය ගෙවන තම සිඟිති දූ පොඩිත්තියට තරවටු කර ගහබැන ශිල්ප පිහිටුවීම ඇගේ මවගේ කාර්යයක් නොවීය.

සොබාදහමින් උපන් දරුවා එහිම දුවපැන එහිම කාලය ගෙවා ජීවිතය උගත්තාවේ යයි ඈ සිතා සිටි හැටියකි. අව්ව-වැස්ස කාලගුණ විපර්යාස හැර අනෙක් කිසිවක් ගැන ඕ උනන්දුවෙන් කතා නොකළාය. දරුවන්ගේ අනාගතය ගැන අහස උසට මාලිගා නොතැනූ අනෙකුත් ගම්වැසියන් සේම ඊෂාගේ මවද කල්පනා කළේ ඈට කන්න අඳින්න දීම ගැන පමණක් බව ඇගේ කතාවෙන් මම වටහා ගතිමි.

"නරකද දරුව මේ හරියෙ ඇහැට පේන මානෙක තියාගත්තොත්? ඉර බහින වෙලේ කැලේ කොළේ සත්තු සිව්පාවො ඉන්නත් බැරි නෑ."

"කතාකළොත් නම් ඒවි. ඒත් තප්පර කීයද මහත්තයො එකතැන ඉන්නෙ ඔය දරුව? එකතැන පාඩුවෙ තියාගන්න බෑ" යි සිනාසෙමින් කී ඇය හිස වටා ගැටගසාගෙන සිටි ලේන්සුව ගලවා නළල පිසදමා ගත්තාය.

"ඒකනම් එහෙම තමයි. ඒ වුණත් තනියම එහෙමෙහෙ ඇවිදින්න හොඳ වෙලාවක් නෙවෙයි නේද මේ පොඩි දරුවෙක්ට?"

මොහොතක් කල්පනාකාරීව බලාසිටි ඈ ඉනට අතගසා නැගී සිටියාය. හිස සලමින් ඊෂා ඇවිදිමින් සිටී යයි අනුමාන කරන ඉසව්වට ඇය ඇවිද ගියාය. තවත් සුළු වෙලාවකින් ඊෂාගේ මවගේ ආමන්ත්‍රණයත්, ඊෂාගේ පිළිතුරු හඬත් ඇසෙද්දී මම ඒ ඉමෙන් මෑතට පියමං කළෙමි.

සුමානයක පමණ කාලයකට ගමින් බැහැර කාර්යාලයීය වැඩකට පිටත්ව යන දවසේදීත් මා යන අතරමග දී මට ඊෂා මුණගැසුණි. ඈ තම අනර්ඝ වස්තුව, වීදුරු බෝතලය පිටුපසට කර ගනිත්ම මට සිනා පහළ විය.

"ඊෂා දැන් සමනල්ලු කීදෙනෙක්ට විතර කැලේට පාර කියා දුන්නද?" මම නතර වී ඇසුවෙමි.

පළමුව ඈ විස්මයෙන් බලා සිටියාය. පසුව ඈ ලජ්ජාවෙන් හිනැහුණාය. "තාම නෑ" යි පැවසූ ඇය වීදුරු බෝතලය ඔසවා මට පෙන්වූයේ සඟවාගෙන තිබූ රහස හෙළිවී හමාර වූ නිසාය. එතුළ කුඩා දළඹුවන් කිහිපදෙනෙකු ළා දලු කමින් ඔබමොබ චලනය වන අයුරු මම දුටුවෙමි. තමා උන්ට කෑම පිණිස ළා දලු එකතුකරන බවද උන් ලොකු වී සමනලුන් වන තුරුම තමා ළඟ තබාගන්නා බව ද, දැරිය මා සමග කීවාය. සමනලුන්ට මල් අවශ්‍ය බවත්, මල්වලට සමනලුන් අවශ්‍ය බවත් ඇය පැවසුවාය. තමා මල් වෙනුවෙන් සමනලුන් නිර්මාණය කිරීමට තීරණය කරගත් බවකි; ඇගේ කතාවෙන් මා වටහා ගත්තේ. ඈ තම කාර්යය ගැන කතා කළේ උද්දාමය පිරුණු හඬිනි. බොළඳ සිතිවිල්ලක් වුවද සොබාදහම විසින් ඒ කාර්යය පවරා ඇත්තේ නියම චරිතයට යයි මට සිතුණේ ඊෂා ඒ වෙනුවෙන්ම කැපවී සිටින සෙයක් මට දැනුණු හෙයිනි.

"ඊෂාගේ ටීච දන්නවද ඊෂා කරන දේ ගැන?"

"නැහැ මම කාටවත් කියල නෑ. ඒත් සමනල්ලු හැදුණම පෙන්වන්නයි ඉන්නෙ." ඕ උස් හඬින් කියා හිනැහුණාය.

තවත් බොහෝ දේ මා සමග ඒ පොඩි මිනිත්තු කීපය තුළ ඇය කතා කළාය. පමාවක් නොවූ හෙයින් මම ද ඈ අසලම වූ ගල් බැම්මක් උඩ වාඩි වී ඇගේ ළපටි අදහස්වලට පොඩියක් සවන් දුනිමි.

අලුත් ලෝකයට සමනලුන් පිටත් කිරීමට පෙර ඇය මටද ඔවුන් පෙන්වන බවට පොරොන්දු වූවාය. මා සිනා සී ඒ දවස ඉක්මණින් එළඹෙන්නට ප්‍රාර්ථනා කරන බව කියන විට ඇගේ දෙනෙත් මත බලාපොරොත්තු සහගත සිනාවක් පිපුණි.

හිරු සමග හිනැහෙන, සඳුට කතන්දර කියන, පළඟැටියන් තණකොලපෙත්තන් අමතන ඊෂාගේ ළමා මනස සොබාදහමට ආකර්ෂණය වූයේ ඈ වෙසෙන හුදෙකලා ගම්මානයේ අසිරිමත් නිර්මලභාවය ඈ තහංචි පවුරු නොමැතිවම අත්විඳි හෙයිනි.

හිරුට අයිති, හිරුගේ ලොවෙහිම තනිවූ කුසුමක් වැනි වූ දූරියට ඒ ලොවේ අරුණැල්ලත්, පවනැල්ලත් මිස වෙනත් සුවයක් නොවීය. දෙපයට සිනිඳු තණපත්, හිසට උදා අරුණලු රැස්, විහිදෙන දෑතට සිසිල් නල රැල් ඇගේ පාරාදීසයේ ඇට උරුම, ඇට අවැසි දෑ විය.

ඉන්පසු කිහිපවරක්ම මම ඊෂා සමග කතාබහ කළෙමි. මා දවස් තුන හතරක වැඩ හමාර කර නගරයෙන් නැවත ගමට එන හැන්දෑ වරුවේත්, ඒ දණ්ඩක් මත වාඩි වී දෙපා වතුරේ කලතමින් තම දළඹු නිවහන සමගින් කතා කරන පොඩිත්තියගේ රුව මම දුටිමි. ඕ හිරු එළිය දෙසට එය දිගුකරමින් එය හොඳින් පිරික්සමින් සිටියාය. අද හෙටම කලඑළි බැසීමට නියමිත සමනල පාරාදීසයේ නැවුම් රශ්මිය ඈත සිට බලා මම ද ප්‍රීතියට පත්වීමි.

බොහෝ සැන්දෑ වරුවල දවසේ රාජකාරි හමාරකර ආපසු පැමිණෙන මට ඈ සමග කතාබහ කිරීම මිහිරි වූත්, ප්‍රීතිජනක වූත් අත්දැකීමක් විය. ඉරුදින උදේ වරුවක මා විවේකයෙන් සිටින වෙලාවක ඊෂා මා හමුවීමට පැමිණියා ය. ඇගේ සිහින් හඬේ ආමන්ත්‍රණය අසා මම නැගිට ගොස් නිවසේ ප්‍රධාන දොර විවර කළෙමි.

කිසිත් නොපැවසූ ඊෂා දෝත මත වූ වීදුරු බෝතලය සාඩම්බරයෙන් ඔසවා සිනාසුණාය. සීමිත කුටියක සිරවී සිට නොඉවසිල්ලෙන් තටු සොලවන පුංචි සමනල පැටවුන් පස්-හය දෙනෙකු බෝතලය විනිවිද දකිද්දී මම ද ළමා වියේ මතකයන් අවදිකරමින් ඊෂා සමග එක් වී ප්‍රීතියෙන් සිනාසුණෙමි.

"අපරාදෙ ඊෂගෙ ටීච දැක්ක නම් සතුටු වේවි." මා පැවසූ විට "හෙට වෙනකන් මෙයාලව තියාගන්න විදියක් නෑ" යි සිහින් හඬින් ඕ තෙපලා ය.

දොර වසා එළියට බැසගත් මම ඊෂාගේ ගමන් මග දිගේම කඳුකරයේ තරමක් උස ගල් කුට්ටියක් මතට ඈ සමග නැග ගතිමි. පැහැබර හිරුගේ කිරණ සමග මුසු වූ හාත්පස සෞන්දර්ය අතිශය මනස්කාන්ත විය. හරිත පැහැයෙන් අලුත් දලු දමා තිබූ

තුරුවැල්වලද, පොකුරු මල් කිනිතිවල ද රැඳී තිබුණේ ලාලිත්‍යයකි. මා එතෙක් විසූ ගම්මානය දැක බලාගත්තේ එදායි.

"අර තියෙන්නෙ අම්මගෙ මල් ගොවිපළ" දුරට අත දිගුකර ඊෂා ඇගේ මවගේ ගොවිපළ මට පෙන්වූවාය. සමීපයට මල් ගොවිපළක් වූ එය දුරට සිතුවමක් සේ දිස් වූයේ කෙසේදැයි මම නොදනිමි. එහෙත් එය චමත්කාරජනක විය.

"ඊෂා නිතර මෙහෙ එනවද?"

"නෑ. නිතර නෙවෙයි. ඉඳහිට. අම්මත් එක්ක තමයි වැඩිපුරම එන්නෙ."

ඊෂාගේ මවගේ මල් වත්ත දෙස බලමින් අප ඉදිරියේ මැවුණු ක්ෂණික චමත්කාරය නැරඹීමට සුළු මොහොතක් ගතකළ මම අනතුරුව බලාපොරොත්තු සහගතව බලා සිටියෙමි. තටු සලන සමනලයකු සේම ඊෂාගේ සිත ද උද්දාමයෙන්, නොඉවසිල්ලෙන් ප්‍රමෝදයට පත් වී ඇති බවක් මට හැඟුණි.

ඕ තම ළපටි අතැඟිලිවලින් බෝතලයේ කඩදාසි වැස්ම හෙමින් සීරුවට ඉහළට එසවූවාය. විවර වූ කඩදාසි වැස්ම සහිතව තත්පර කිහිපයක් නිසලව පැවති බෝතල් මුව ඉන්පසු අතුරු සිදුරු නැතිව අලුත් ලොවට එබිකම් කරන සමනල සාමාජිකයන්ගේ දොරට වැඩීමෙන් කාර්යබහුල වන්නට විය. කහපාට, ළා කොළපාට සමනලුන්ගේ සැහැල්ලු ආගමනය දෙස බලාසිටීම ආස්වාදජනක වූවක් විය.

විස්මයෙන් ද, සන්තෝසයෙන් ද විවර වූ ඇගේ දෑසේ බැල්ම ඉහළ පහළ චලනය වෙමින් බෝතල් මුවින් පිටව යන සෑම සමනල් පැටවාම ලුහුබඳින්නට විය. අවසානයේ දී පිටව ගිය එකම එක සුදුපාට සමනල් පැටවාද ඉගිල යන විටත් ඊෂාගේ දෑසට විවේකයක් නොවීය. සුදු සමනල් තටු සුළං අතර ගහකොළ අතර, කඳු වළල්ලෙන් එහා තිතක් මෙන් නොපෙනී යන තුරුත් බලා සිටි ඊෂා, මඳ හසරැල්ලෙන් යුතුව මා දෙස හිස ඔසවා බැලුවාය. ඇගේ දෙනෙත් මත දඟකාර සතුටක ඡායාවක් කිසිසේත් නොවීය. එහි

වූයේ කුඩා දරුවකුට කලාතුරකින් උරුමවන ආකාරයේ අමුතුම සන්සුන් බවකි.

ඕ ළපටි වින්දනයක් ලැබුවකු ලෙස නොව මේ ලෝකයට, මහපොළවට මෙහෙයක් ඉටුකළ දැනුමැත්තියක ලෙසිනි මා ඒ මොහොතේ දුටුවේ. සියුම්, සුකුමාල, ආඩම්බරයක් ඒ පියකරු මුහුණ මත පිළිබිඹු විය. ඇය සතුටු වූවාය. සත්‍ය වශයෙන් මම ද සතුටු වීමි.

ඉන්පසු ද දෙතුන් වතාවක් ම ඊෂාගේ මහන්සියෙනුත්, ආදරයෙනුත් බිහි වූ සමනල් කැලක් ම ගහකොළ අතරට මුදා හැරුණමුත් ඒ වැඩි කාලයකට නොවේ. ගම්මානයේ ඊෂා හුදෙකලාවේ ඇවිදින ගස්කොළන්, බඩවැටි අතර කවුරුන් හෝ ගැවසෙන බව ගමේ බොහෝ දෙනෙකු අතර කටකතාවක් පැවතුණි. මා වරක් ඊෂාගේ මවට කළ අනතුරු ඇඟවීම ඇයට ද, ඒ වනවිට ඒත්තු ගැන්වී තිබුණෙන් ඕ ඊෂාට ඉන්පසු බැද්දේ ඇවිදීමට අවසර නොදුන්නාය. කිසිවක බරපතලක් ගැඹුරක් හරිහැටි නොතේරෙන වයසක පසු වූ කුඩා දැරියට ඇගේ මවගේ විරෝධය ද සෙල්ලමක් ම විය. එහි ප්‍රතිඵලය වූයේ ඊෂා තම මවට හොරෙන් කැලේකොළේ ඇවිද නිදහස සෙවීමයි. ඈ ඉන් ලද ආස්වාදය පෙරටත් වඩා වැඩි විය. එසේ ඇවිදින දැරිය මට ද කීපවරක් ම හමුවී තිබුණත් ඕ මා ගැන හෝ අන් කිසිවකු ගැන වගක්වත් නැත්තකු සේ ඔහේ පාවෙන සිතුවිලි සමග ඔබමොබ ඇවිද්දාය. තම නිදහසේ ඇවිදීම අත් නොහළ ඊෂාගේ විනෝදය අවසන කෙළවර වූයේ එක්තරා හැන්දෑවක කැලය ඇතුලේ නොහඳුනන මිනිස් රුවක් ඇගේ නෙතට ලක්වීමත් සමගයි. කීපවිටක්ම මේ ආගන්තුකයාගේ බැල්මට හසුවූ දැරියට අවසන තම මවට මේ ගැන අනාවරණය කිරීමට සිදුවිය.

ඊෂාගේ විනෝදයත්, සමනල් ලෝකයත් බිඳ වැටුණේ එසේය. ඇගේ ලෝකයට අමුතුවෙන් තහංචි පැනවීමට ඊෂාගේ මවට සිදුනොවිණි. ඕ කැලේකොලේ ඇවිදීම ටිකෙන් ටික නවතා දැම්මාය. සමනල කෝෂාගාර කාලයත් සමග සොබාදහමට ම නැවත

බාර වූ සෙයකි. කිසිවකු ඒ ගැන කරදර වූයේ ද නැත. අහිමි වූ සුන්දර මතකයක් විමසා සිත පෑරීම රිසි නොවූ හෙයින් මම ද ඊෂාගෙන් සමනලුන් ගැන කිසිත් නොවිමසුවෙමි.

පසුකලක මා ලද ස්ථාන මාරුවත් සමග ඊෂා සිටි ගමෙන් මා නගරයට පැමිණි නමුත් ගම්මානයත්, පොඩි දැරියගේ ඇසුරත් වරින් වර මට අපමණ වාරයක් සිහිවිය.

කවර කාලයක, කොතනක දී හෝ දැනෙන මල් සුවඳක් වුවද මට ඊෂාගේ මවගේ මල් ගොවිපළත්, ඒ ගම්මානයේ සුවඳ, පැහැය සියලු රස හෝරාවනුත් මුල සිට අගට ආවර්ජනය කරවීමට සමත් විය. කොපමණ කාලයකට පසු වුවද කුඩා සමනලයකු දකින මගේ මනසට ඒ සමනල් ආත්මයන් සමග කතාකිරීමට හුරුවූ කුඩා ඊෂාගේ සුරතල් රුව ද සිහියට නැගුණේ නිරායාසයෙනි. එපමණක් ද? ඒ එදා ඇගේ සමනල් නිවසින් පිටවූ සමනල් පැටවාම යයි විශ්වාස කිරීමට තරම් මගේ සිත මට බල කරන්නට ද විය.

**අයි. පී. එස්. හිමංසනා සිරිවර්ධන**
**ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය**

# මනමේ මං තව හිතනවා

බැන්ද සෙනෙහස වින්ද රජ සැප මතකයේ මුදුනත තියා
සින්ද නුඹෙ හිස බින්ද හදවත රැගෙන උකුලතෙහිම තියා
වැන්ද වැඳුමන් මන්ද නුඹ මගෙ රන් කඳට කෙරුවේ කියා
කෙන්ද විගසින් කන්ද කර හැර තිරය වහමින් උන් ගියා

හැඩවුණේ දැක වැදිට හැකි නුඹේ බව එඩි බල බිඳින්න යි
සිහිවුණේ නුඹ කියපු බව මග දිගට 'මට හරි පිපාස යි
හැඟවුණේ සටනට වඩා යුතු නුඹගෙ පණනල රැඳෙන්න යි
'දෙවියනේ මම කඩුව වැද්දට දුන්නෙ බේරී දුවන්න යි

මගේ අදහස නොදන්නා උන් තවම බැන අඬගහන වා
'ගෑනු කවුරුද වරදෙ නොබැඳෙන' කොනිකි ගහමින් අහන වා
නාටකේ අවසනදි වැද්දත් මාව ඇදගෙන දුවන වා
'දෙන්ට තිබුණේ නුඹටම ද කග?' මනමෙ මං තව හිතන වා

**ධනුෂි මහේෂා ලිහිණිකඩුව**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය**

# චක්‍ර පාද

වැහි බිඳු එක දෙක යාන්තමින් වැටී කමිසයේ තැනින් තැන තෙත් වී තිබුණි. අවට පරිසරය ද මලානික වී අඳුරුව වේගයෙන් ආ සුළඟින් කස ගස්වල කොළ සී සී කඩ විසුරුණි. මා සිටියේ සුමංගලයේ පියගැට පෙළ නගිමින්ය. මා දකුණත රැඳී තිබුණේ බෞද්ධ සමාජය හා මානුෂීයත්වය නමැති දේශනය සඳහා රැගෙන යන සටහන් පොතයි. ඉදිරියට යන්නට මා පා තබන විටම

''මලිඳු, මලිඳු''

යැයි මිහිරි කටහඬක් මගේ සවනත රැඳෙන්නට විය. එක්වරම මා පිටුපස හැරී බැලුවෙමි.

ලස්සනම ලස්සන ගෑනු ළමයෙක් දිවවිත්

''හායි'' ගුඩ් මෝර්නින් ඔයා අද උදේම ඇවිත් නේද?,

මම ඇය දෙස බලා සිනාසී ''ගුඩ් මෝර්නින්'' යැයි පැවසුවෙමි.

ඇය මගේ වම් අතේ සුළැඟිල්ලෙන් අල්ලා ගත්තාය. තවත් මොහොතක් මෙසේ රැඳෙන්නට සිත් වුවද, කිසිවෙකු දකීවි යයි බියක් දැනුණි.

''එහෙනම් අපි යමු'' යැ' යි මම පැවසූවෙමි.

ගතවූයේ නිමේෂයකි. ''ටක ටක කරාස් ඩොග්''

හඬක් ඇසුණි. දැඩි ආලෝකයකින් මගේ දෙඇස් නිලංකාර විය. සිදුවූයේ කුමක්දැයි සිතාගත නොහැකිය.

මම සෙමෙන් සෙමෙන් ඇස් හැර වටපිට බැලූවෙමි. මා සිටියේ ඇඳ මත වැතිරය. බිත්තියේ සවිකර තිබූ විදුලි පංකාව බිම පතිත වී තිබුණි.

මගේ කකුලෙන්ද දැඩි වේදනාවක් දැනෙන්නට විය. නිසල් ඇස් ලොකු කරගෙන එදෙස වික්ෂිප්තව බලා සිටියේය.

''අයියෝ ! මචං මාර වැඩේ වුණේ'' යයි ඔහු පැවසුවේය.

මම සිනාසුණා පමණි. කිසිවක් නොපැවසුවෙමි. මිනිත්තු කිහිපයක් මම ද එදෙස බලා සිටියෙමි. සුනුවිසුනුව ඇති පංකාව මෙන් මගේ සිතද විසිරී යන්නට විය. මම මතකයන් අතරේ නිමග්න වුණෙමි.

උපන්දා සිට එක්තැන් වී රෝද පුටුවක ලැග සිටි මා කිසිවකුගේ උපකාරයෙන් තොරව ඇවිද ගිය ප්‍රථම අවස්ථාවද සිහිනයක් වී හමාරය. මෙතෙක් මා ගෙවූ ජීවිතය ගැන මතක් කරන්නට මා තරමක් නොව බෙහෙවින් අකමැතිය. වසර විස්සක් පුරාවට නොමැරී මැරෙමින් ගත කළ ජීවිතය අතිශය කටුකය. ඇත්තෙන්ම මා කිසිදාක ඇවිද තිබුණේ නැත. මගේ මවත්, පියාත් සහෝදරයත්, සහෝදරියත් නොසිටින්නට මා මිය ගොස් වැළලූ තැන්වල විශාල වෘක්ෂයන්ද වැඩී තිබෙන්නට තිබුණි.

මා මෙහි පැමිණි කාලයේ නම් කොතැන ගියත් මා වටා කිහිප දෙනෙක් පැමිණෙති. අදට මා විශ්වවිද්‍යාලයට පැමිණ වසර එකහමාරකි. ඒ කාලය තුළ මෙහි සහෝදර සහෝදරියන් මා ගැන සොයා බලා උදව් උපකාර කළෝය. ඇතැම් දිනවල දිනකට එක් ආහාර වේලක් ගැනීමට සිදු වූ අවස්ථාද නොතිබුණා නොවේ. කිසිවකු එනතුරු නේවාසිකාගාර කාමරයේ බලා සිටි වාර අපමණය. මගේ දින චර්යාවෙන් වැඩි කොටසක් නිදා ගැනීමට වෙන් කෙරුවෙමි. දේශනයට යාමට කිසිවකු සිටියේ නැතිනම් දවසම නිදාගැනීම අතිශය ප්‍රිය විය. එයින් මගේ තනිකම පාළුව වියැකී ගියේය.

විශ්වවිද්‍යාලයේ පළමු වසර සිටින විට නම් බොහෝ අය මා පිළිබඳව සොයා බැලුවෝය. කල්යත්ම එම සැලකිලි සත්කාර අඩුවී ගියේය. මම ඒ කිසිවකුට දොස් නොතබමි. ඔවුන් ද මෙහි පැමිණියේ උසස් අධ්‍යාපනය ලැබීමට මිසක මා හට සාත්තු සප්පායම් කිරීමට නොවේ. මා හට උදව් කළද, නොකළද ඒ සැම කෙරෙහි මා සිත ඇත්තේ කාරුණික භාවයකි. ඒ සැමටම මම ස්තුතිය ප්‍රකාශ කරමි. මන්දයත් ඔවුන් නොසිටින්නට ජීවිතයේ වැදගත්ම පාඩම් කිහිපය මග හැරෙන්නට තිබුණි.

මගේ කකුලේ ඇති වී ඇති තුවාලය ගැන සඳහන් කිරීම ඔබට අපහසුවක් ගෙනදේ යැයි හැඟේ. අකමැත්තෙන් වුවද ඒ ගැන නම් කිව යුතුය. තුවාලය ඇති වන විට මා අටවැනි වියෙහි පසු විය. මා ඉපිද දින කිහිපයකදී කොඳු නාරටියෙහි කරන ලද සැත්කම හේතුවෙන් මෙතෙක් ඇවිදීමට නොහැකි විය. අටවැනි විය වන විට එහේ මෙහේ ගමන් කිරීමට මා සතුව රෝද සහිත දැති රෝද ඇති අතින් කරකවා යා හැකි රෝද පුටුවකට සමාන පාපැදියක් තිබුණි. දිනක් මිදුලෙහි එහේ මෙහේ එම පැදියෙන් යමින් සිටිය දී දකුණු කකුල ලිස්සා විත් විලුඹට පහළින් දැති රෝදයට හසු වී තුවාල විය. එය මෙතෙක් කල් කොතෙකුත් බෙහෙත් කළද සුව වූයේ නැත. තුවාලයට වසර දොළොසක් ගත වී ඇත. වෛද්‍යවරු නම් පැවසූයේ අවුරුදු හත අටකදී එය සුව වීමට ඉඩ ඇති බවයි. එම කාලය ඉක්මවා ගොස්ය. එහි වේදනාව ඉවසාගත නොහැකිව ඇඬූ වාර නම් හිසේ කෙස් ගානය. දැන් තුවාලය වර්ධනය වී එකම ස්ථානයේ තුවාල පහකි.

අතේ ඇඟිලි පහම එහි ඇතුළු කළ හැකි තරම් එය විශාලය. නිතර නිතර සැරව ඒම නිසා මම දිනකට තුන්වරක් පිරිසිදුකර බෙහෙත් දමමි. පැයක් දෙකක් ගතවන විට පුළුන් හා ගෝස් පොඟ වාගෙන සැරව එයි.

එවිට ද මම නැවත පිරිසිදු කර බෙහෙත් දමා, වාඩි වූ තැන බොහෝ වෙලා සිටිමි. මෑතක පටන් තට්ටමේ කුඩා තුවාලයකි. එයට බෙහෙත් දමා ගැනීමද අතිශය දුෂ්කරය.

කොතෙකුත් බෙහෙත් දමූව ද, දිනෙන් දින ඒවා වර්ධනය වීම මිසක අඩුවක් වූයේ නම් නැත. මා හට ජීවිතය පවා කලකිරුණි. ඇතැම් විට මට මාවම ප්‍රශ්නයක් විය. දේශනවලට යන විට දිව්‍යාංගනාවන් හා සම වූ තරුණියන් මා දැක ඉවත බලාග න්නා අයුරුත් මා සමීපයෙන් දුරක ඇති ආසන වෙත ඇදී යන අයුරුත් නිතර දක්නට ලැබේ. සමහරුන් රවාගෙන යයි. ඇතැමුන් නොදක්නා සේ යයි. දේශන අවසන් වූ පසු ඒමට කෙනෙකු එනතුරු බොහෝ වේලාවක් රැඳී සිටීමට ද සිදුවේ. මේ අතරින් සැබෑම දෙවියන් බඳු වූ කාරුණික මිනිසුන් ද නොසිටියා නම් නොවේ.

පසුගිය දිනක ආපන ශාලාවේ ඉතිරි වී තිබූ උණුසුම් රසවත් මිරිස් තුනපහ පදමට ඇති ආහාරයක් භුක්ති විඳීමෙන් පසුව රෝද පුටුවේම මල පහ විය. චින්තක සහ ලක්ෂිත මා ඔසවාගෙන ගොස් තම දෑතින්ම පිරිසුදු කළ අයුරු මතකයට නැගෙන විට මා දෑස කඳුළින් පිරේ.

මගේ තුවාලය මට පිළිකුලක් නොවූවද, එය අනිත් අයට නම් ඉවසිය නොහැකි පිළිකුලක් වන්නට ඇත. තුවාලය උත්සන්න වූ විට එහි සැරව දුගඳ මට ම දැනුණි.

එවැනි අවස්ථාවල මම උණ වැළඳී දින දෙක තුනක් ගතවන තුරු ආහාර ගැනීමටවත් නොහැකිව ඇඳේ ගුලිවී සිටින්නෙමි. මුත්‍ර කිරීමට අවශ්‍ය වූ විට බෝතලයක් මා ළඟ ඇත. ඒ සියලු දේ මම කිසිවෙකුට කරදර නොකර තනිවම කරගන්නෙමි.

පෙර දා කාමරය පුරා දැඩි දුගඳක් හමන්නට විය. යන එන අයද අඩු විය.

''අර කාමරේ ඉන්න එකාගේ කකුල කුණු වෙලාද දන්නේ නෑ? මෙච්චර ගඳ ''

අසල කාමර තුළින් මෙවැනි වදන් ඇසෙන්නට විය. විමසිල්ලෙන් බැලූ විට දුටුවේ මා අත සෝදන භාජනයේ ජලය මත පණුවන් නටමින් ඉන්නා බවයි.

මා පසුගිය අර්ධ වාර්ෂිකයේ විෂයන් තුනක් අසමත්ය. ඒවා සම්පූර්ණ කිරීමට ද මෙම අර්ධ වාර්ෂිකයේ සිදුවී ඇත්තේය. දේශන සඳහා හෝ වෛද්‍ය මධ්‍යස්ථානය වෙත යෑම සඳහා විශ්වවිද්‍යාලය තුළට යනවිට මම බොහෝ සේ පීඩා විඳිමි. ඇතැමෙකු,

''පව් අසරණ කොල්ලා! ගිය ආත්මේ ලොකු කරුමයක් කරන්න ඇති හොද දොස්තර කෙනෙකුට පෙන්නලා කකුල කපලා අයින් කරන්න තියෙන්නේ. අපිවත් එකතුවෙලා උදව්වක් කරමු''

ඒ මා හට නිරන්තරයෙන් ඇසෙන වදන්ය. ඊට පසුව ඔවුන් නම් කිසිවිටක මා හට හමුවන්නේ නැත.

මා වයසේ සිටින යහළු යෙහෙළියන් කෙළිදෙලෙන් හා ප්‍රේමයෙන් මුසපත්ව තැන තැන එක්ව කථා කරන විට සියුම් ඊර්ෂ්‍යාවක් මා පෙළයි. බංකු මත තුරුළු වී බත් කවා ගන්නා පෙම්වතුන් පෙම්වතියන් දකින විට මටත් මෙහෙම ඇවිදින්න පුළුවන් වුණානම්, මගේ තුවාලය සුව වුණානම් යැයි සිතේ. අපමණ වේදනාවන් අපහසුවෙන් වුවද  මම සිතෙහි යටපත් කරගන්නෙමි. මේ අතර අනුකම්පාව දනවන සිදුවීම්ද මා යන එන ස්වල්ප වේලාවේදී පවා දක්නට ලැබේ. ලස්සනම ලස්සන සූරියකාන්ත මලක වහලා රොන් අරගන්න බඹරෙකු තවත් සූරියකාන්ත මලක් සොයාගෙන ගිහින්. ලස්සනම ලස්සන සූරියකාන්ත මල දුකින් මැලවිලා අඬමින් ඉන්නවා මා ඕනෑ තරම් දැක තිබේ.

එකවරම ඇසුණ රෑං රෑං හඬ සමගම මා තිගැස්සිණි. සියුම් සීතලකින් මා ගත ද වෙළෙන්නට විය. විදුලි පංකාව ක්‍රියා කරමින් තිබුණු අතර එහි වේගය ද වැඩි වී තිබුණි.

නිසල් මා දෙස බලා දත් දෙතිසම පෙන්වා සිනාසී,

''ඔන්න දැන් වැඩේ හරි යැයි පවසා''

විදුලි පංකාවේ වේගයද මදක් අඩුකොට කාමරයේ විදුලි බල්බය ද නිවා දැමුවේය.

කාමරය පුරා  අඳුර රජයන්නට විය. මා සුව කළ හැකි ජීවක වෙදතුමෙකු මෙලොව කොහේ ඇතිදැ'යි සිතමින්ම මම සුපුරුදු පරිදි  ඇඳෙහි වකුටු වී නිදන්නට සැරසුනෙමි.

**මනෝරංජන ඥානතිලක**
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය**

# නොවේ අභිසරු ලියක් නුඹ මට...

ආල වඩන දෑස නුඹේ
සිත පටලයි කිමද හදේ
සලා දිගැස වත කමලේ
සිනා සලයි මිහිරි ලෙසේ

දැවෙන ගතින් රුසිරු ළඳේ
දහස් දනන් නිතර බැඳේ
සළඹ සලන අඳුරු රැයේ
රමණ කුසුම පුබුදු කළේ

ගුවන සරන සකල ලෙසේ
නිබඳ පහස විඳින දැලේ
ඔකද වෙවී කිම්ද ළඳේ
මුලා නොවී සරනු මැනේ

උනා සළුව රඟන රැයේ
තබා මිහිරි වදන් පෙළේ
යොමා වඩනු අනඟ ලියේ
සදා දුකයි ගින්න ළයේ

සුබ දුක පිරි දිවි ගමනේ
නැවතුම කොතැනක රැඳුණේ
විරාමයක් ලද විගසේ
පුරා සඳක් වනු රිසිසේ

**ජේ. පී. ඒෂානි**
**දේශපාලනවිද්‍යා අධ්‍යයනාංශය**

# තරු ලකුණ

'ඔහේගේ පුතා දේශපාලනය කරනවා'

'අනේ මහත්තයෝ උෟට ඕවා තේරෙන්නේ නෑ'

'ඒවා අපි දන්නේ නෑ. තමුන්ගේ පුතාට ඔය කරන වැඩේ වහාම නවත්තන්න කිවුවොත් හොඳයි. නැත්නම් තමුන්ගේ පුතා ගැන බලාපොරොත්තු අතහැර ගන්න වෙයි'

'හොඳයි මහත්තයෝ'

නිමලසිරි විශ්වවිද්‍යාලයට ඇතුළු වී දැන් ගෙවෙන්නේ තුන්වෙනි වසරයි. ඔහු ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයකු බවට පත් වූයේ පවතින සමාජ ප්‍රශ්න හමුවේ අන්ධයකු සේ සිටීම විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුට තරම් නොවන නිසාය. රටේ වගකිවයුත්තන් සමාජයේ මානව අයිතිවාසිකම් අමු අමුවේ නැති කරන විට කිසිවක් නොකර ඒ දෙස බලා සිටීමට වඩා කිසිවක් හෝ කළ යුතු යැයි ඔහු තරයේ ම සිතට ගත්තේ ය. ඒ සඳහා ඔහු තමාගේ සියලු අනාගත සැලසුම් වුව ද අතහැර දැමීමට සූදානම් ය.

'මචං, හෙට වැඩේට පෝස්ටර් ටිකක් අඳින්න ඕනි'

සුරංග තමා ළඟට එනතුරු ම නිමලසිරි දැන සිටියේ නැත. පසුදින අධ්‍යාපන පුද්ගලීකරණයට විරෝධය දැක්වීම සඳහා පාගමනක් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කර තිබිණ. ඒ සඳහා පෝස්ටර් ඇඳීමට සුරංග ඇතුළු සාමාජිකයන් රැසක් ලහි ලහියේ එක් රැස් විය.

'රෑටනෙ බං ඕවා අඳින්නේ. දැන් යමං තේ එකක් බොන්න.' තම කලිසම් සාක්කුවේ දෙඅත් ඔබා සාක්කු එළියට ගෙන ඔහු නිමලසිරිට පෙන්නුවේය.

'සතයක්වත් නෑ බං'

සුරංග අනුරාධපුරයේ සිට විශ්වවිද්‍යාලයට පැමිණියෙකි. ඔහුගේ පියා වකුගඩු රෝගය නිසා මීට තුන් මාසයකට උඩදී මිය ගියේය. ඔහුගේ එකම නැගණිය මෙවර උසස් පෙළ විභාග යට මුහුණ දීමට සූදානම් ය. මවද තරමක් අසනීප තත්ත්වයෙන් පෙළෙයි. නමුදු ඇය තම පවුල නඩත්තු කිරීම සඳහා අපමණ වෙහෙසක් දරයි. සුරංගගේ අධ්‍යාපන කටයුතුවලට මුදල් ඔහුම අමතර වෙලාවන්හිදී සුළු වැඩවල යෙදීමෙන් සොයා ගනී. ඔහු දවල් ආහාරය ගෙන නොමැති බව නිමලසිරි පුරුද්දෙන් මෙන් දනී.

'යමං යමං. උඹෙන් සල්ලි ඇහුවෙ නෑනෙ'

දෙදෙනාම සුමංගල මන්දිරයේ ඉදිරිපිට ඇති තෙල් බැම්මෙන් නැගිට කසය හරහා ගොස් කැලේ කඩේට ගියේ කිසිවක් කතා නොකර ගොළුවන් මෙනි.

'මචං, රාජේශ්වරීගෙයි මගෙයි සම්බන්ධෙට අම්මා කැමති නෑ.'

සුරංග තේ එක නිමලසිරි ඉදිරියෙන් තබා, අසල බංකුවේ ඉඳගන්න ගමන්ම පැවසුවේ ලොකු කතාවක් පටන්ගන්න සැරසෙමින්ය.

'ඇයි බං මොකද කියන්නේ?'

නිමලසිරි එහෙම ඇහුවේ සුරංගගේ කතාවට ඇහුම්කන් දීමට සැදී පැහැදී සිටින බව හඟවමින් ය.

'වෙන මොකක්ද බං. දෙමළ නිසා මිසක්'

සුරංග එසේ පැවසුවේ තරමක් කෝපයෙනි. ඒ කෝපය තම මෑණියන්ට පමණක් නොව මුළු මහත් සමාජයටම බව නිමලසිරි දනී.

'මොනවද බං. අපි ඔක්කොම මිනිස්සුනේ. දෙමළ කියන්නෙත් භාෂාවක්. සිංහල කියන්නෙත් භාෂාවක්. භාෂාව ඕනේ කියන දේ තේරුම් ගන්න මිසක් මිනිස්සු බෙදන්න නෙවෙයි.'

නිමලසිරි පැවසූ දේ සත්‍යයක් වුවත්, බොහෝ දෙනෙකු භාෂාව, ආගම, සංස්කෘතිය තමතමන්ගේ මිනුම් දණ්ඩක් කරගෙන ඇති බව සුරංග මෙන්ම නිමලසිරි ද දැන සිටියෝය.

'ඕක අපි දෙන්නට තේරුණාට අපේ අනික් උන්ට තේරෙනවයැ බං.'

සුරංගගේ මුහුණ සුදුමැලිය. ඔහු මේ උභතෝකෝටික ප්‍රශ්නවලට මුහුණ දීමෙන් හොඳටම කලකිරී සිටියේය. මේ ප්‍රශ්නෙට නිමලසිරි ළඟ විසඳුම් නැත. එහෙත් මිතුරාගේ කතාවට සවන් දිය යුතුය.

'දැන් ඕවා ගැන කල්පනා කරලා වැඩක් නෑ. ඉස්සරහට තියෙන වැඩ ගැන හිතමු. ගොඩක් ප්‍රශ්නවලට කාලය උත්තර දෙයි. යකඩ වුණත් තැලෙන්න ඕනනේ බං මුවහත් වෙන්න.'

දෙදෙනාම කැලේ කඩෙන් එළියට ආවේ ශිෂ්‍ය සංගම් කාර්යාලයට යෑම සඳහාය. කසය හරහා දෙදෙනාම ශිෂ්‍ය සංගම් කාර්යාලයට ගියේ පසු දින පැවැත්වෙන විරෝධතාව ගැන කතා කරමින්ය. ඔවුන් යන විටත් ඒ කටයුත්ත සැලසුම් කිරීම සඳහා බොහෝ දෙනෙක් එහි රැස්ව සිටියෝය.

'වරෙල්ලා....වරෙල්ලා.... මේ වැඩේ ඉවරයක් කරමු. උඹලා කොහෙද ගියේ?'

අමිල කෑ ගැසුවේ ඔවුන් දෙදෙනා කාර්යාලයට ඇතුළු වීමටත් පෙරය.

'හරි හරි බං. පටන් ගමු.'

සුරංග පැවසුවේ තැන් තැන්වල දමා ඇති පින්සල් කෑලි, තීන්ත බෝතල් එකතු කරමින් සිටි අමිලගේ පිටට පහරක් ගසමින්ය.

නිමලසිරි ශිෂ්‍ය සංගම් කාර්යාලයේ සවි කර ඇති දැන්වීම් පුවරුව ළඟට ගියේ අලුත් කිසිවක් එහි ඇතිදැයි බැලීමටයි. පුරුද්දක් වශයෙන් දිනපතා ඔහු එය සිදු කරයි. කිසිවෙකු විසින් ලියූ

නිර්නාමික කවි පෙළක් එහි අලවා තිබෙනු ඔහු දුටුවේය. කවදත් රස වින්දනයට කැමති නිමලසිරි එය කියවූයේ රසවත් ආහාරයක් ලැබුණෙකු පරිද්දෙනි.

'අන්න අර ගිරි හිසින්
නව සඳක් පායලා
ගිනිහුලෙන් දැවුණු සිත්
සඳ දියෙන් සේදිලා'

ඕක කවදා පායන හඳක්ද? නිමලසිරි එසේ හිතුවේ මිනිසුන්ගේ දුක් පීඩාවන් හොඳින්ම හඳුනන නිසාය. හදිසියේ දූරකථනය නාද වීමෙන් ඔහු තිගැස්සිණ.

'නිමලේ ඔයා කවද්ද ගමේ එන්නේ?'

ඒ කසුනිකා ය. ඇය නිමලසිරි විශ්වවිද්‍යාලයට ඇතුළුවන්නට පෙර සිටම ඔහුගේ හදවත සොරා ගත් එකම යුවතිය යි. ඇය හදිසියේම ඔහුට දූරකථනයෙන් අමතා එසේ ප්‍රශ්න කළේ 'අනිවාර්යයෙන්ම ගමේ පැමිණිය යුතුය; යන අදහස නොකියා කියමින්ය.

'දිනයක් නෑ. ඇයි හදිසියේ? මෙහේ වැඩ වගයක් තියෙනවා.'

'තියෙන වැඩ තිබුණාවේ. ඔයාගේ තාත්තා කිව්වා පුළුවන් තරම් ඉක්මනට එන්න කියලා.'

'මොකෝ කසූ ලෙඩක්ද?'

'දන්නෑ....කවුද මිනිස්සු වගයක් ඇවිත් තාත්තාට කෑ ගහලා ඔයා දේශපාලනේ කරනවා කියලා.'

නිමලසිරිට වහා කාරණය අවබෝධ විය. මේ දිනවල පවතින තත්ත්වය මත ආණ්ඩුවේ සහචරයන් විසින් සිසුන්ගේ ගෙවල්වලට ගොස් තර්ජනය කර දෙමව්පියන් බියට පත් කිරීම, විලාසිතාවක් බවට පත් කරගෙන ඇත. කෙසේ නමුත් ඔහුට ගමේ යෑමට නම් දැඩි උවමනාවක් ඇත. ඒ කසුනිකාගේ මුහුණ දැකීමටයි.

කොතරම් අරගලකාමී චරිතයක් වුවද, ඔහුටද හදවත නළවන ඒ සුකොමළ යුවතියගේ මුවකමල නොබලා සිටිය නොහැකිය. ඔහු ගමේ යා යුතුයැ'යි තීරණය කළේය.

'හොඳයි කසූ. මං එන්න තමයි හිතන් ඉන්නේ. ඔයාවත් කාලෙකින් දකින්න බැරි වුණානේ.'

'මං මොකටද අනේ... ඔය ඕන තරම් ඉන්නේ ඔහේ. ඉක්මනට ඇවිත් යන්න එන්න.'

ඇගේ වදන් අකීකරුය. වෙනදා තිබූ අහිංසක, විනීත බව ඇයගෙන් පලා ගොස් ඒ වෙනුවට ආඥා සහගත ස්වරූපයක් ගෙන ඇත. ඇය සමග තර්ක කර ඵලක් නැත. ඇයට මෙසේ කිසිවක් වටහා දීමටද නොහැක. ඔහු නිශ්ශබ්දව ඇයට කීකරු විය.

පසුදා විරෝධතාව නිම වී රාත්‍රියේම බදුල්ල බලා පිටත් වීම සඳහා කොටුව බස් නැවතුම්පළට පැමිණි ඔහුට මධ්‍යම රාත්‍රි 12.00 වන තෙක් බසයක් පැමිණෙන තුරු බලා සිටීමට සිදු විය. ඒ කාලය ඔහු කා දැමුවේ තැන තැන ඇවිදිමින් ය.

කොටුව නගරය පිටින් බලන විට මනරම් නගරයක් වුවද, නගරාන්තරය ගඳ ගසන ඉතා අපිරිසිදු නගරයක් බව ඔහු කල්පනා කළේය. තැන තැන කුණු කන්දල් උඩ වැටී සිටින මිනිස්සු සුව නින්දේ පසුවෙති. ඔවුන්ට කුණු ගොඩ වුවද තැකීමක් නැත. එයින් ඉවත් වීමටද උවමනාවක් නැත. ඔවුහු ජීවිතේ කුණු ගොඩේම දිය කර හරිති. තමා සිටින්නේ ගඳ ගසන කුණු ගොඩකයැ'යි ඔවුන් වටහා ගන්නා තුරු ඉන් ගැළවීමක් නැතැයි ඔහු කල්පනා කළේය.

තැන තැන සිටින නොයෙක් වෙළෙන්දන්ගේ කෑගැසිල්ලත්, එකිනෙකා කුණු හරුප කියමින් බැන අඬ ගසන හඬත් නිමලසිරි අසා සිටියේ කෝපයකින් නම් නොවේ. මිනිස් ජීවිතයේ පුදුමාකාර පැතිකඩක් ඒ තුළින් ඔහු අත් වින්දේය. මිනිසුන් අතරම ඇති උස් පහත් බව මෙන්ම ඔවුන් ජීවත් වීම සඳහා කරන අරගලය ද ඔහු දුටුවේය. මේ අතර තැනින් තැන පාර අයිනේ කුඩ කරකවමින් තම සිරුර විකුණා ජීවත් වන අභිසාරිකාවන් ද ඔහු නෙත ගැටිණ.

'කොහොම හරි මේ ක්‍රමය වෙනස් කරන්න ඕන'

ඔහු දැඩි සේ සිතට ගත්තේය. ඒ සංකල්පය ඵල දරන්නට නම් බොහෝ කැප කිරීම් කළ යුතු බව ඔහු දැන සිටියේය. ඔහු මේ යන ගමනද එයට බාධාවකි. තම පියා කිසිසේත්ම ඔහුට නැවත කොළඹ පැමිණීමට ඉඩ නොදෙන බව ඔහු දනී.

බදුල්ල බලා පිටත් වන බස් රථය ගමන් ආරම්භයට සැරසෙන බව කොන්දොස්තර මහතාගේ කෑ ගැසිල්ලෙන් නිමලසිරි වටහා ගත්තේය. ඔහු වහා දිව ගොස් බස් රථයට ගොඩ විය. එහෙත් ඔහුගේ සිත කුමක්දෝ වරදකාරී හැඟීමකින් බර විය. ඔහු අසුනේ ඉදගෙන ජනේලය වසා දැමුවේ පිටතින් එන සීතල වළක්වා ගැනීමටය. බස් රථය ගමන් ආරම්භ විය. එහෙත් නිමලසිරිගේ මනස තවමත් කොටුවේ ය. ඔහුට මනස ඉන් මුදවා ගත නොහැකි විය.

බස් රථය ඉතා ඉක්මනින් නුගේගොඩ පසු කර දෙල්කඳ හරහා පැමිණ විජේරාමයෙන් හැරී අන්දකාරයේ කළු සෙවනැලි අතරින් විශ්වවිද්‍යාලයටම පියමැන්නේය. දහසක් අඳෝනා ඔහුගේ මනසේ රැව්පිළිරැව් දුන්නේය.

**අතුල බණ්ඩාර**
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය**

# අවුරුද්ද

ස්වාමියා :-
මැණිකේ හිනැහී ඉන්න දැන්වත් - මදැයි ඔය හැඬුවා ඇතී
ඇඟපතේ වේදනා ඔහොමයි - මහලු වී ගත පණ නැතී
හන්දියේ වෙද නෝනා හම්බෙමු - එකතු කළ දාහක් ඇතී
හිනැහියන් පණ හෙටයි අවුරුදු - ඇඳේ උන්නා දැන් ඇතී...

බිරිඳ :-
හැඬුම නවතා ගන්නෙ කෙලෙසද - ජීවිතේ දුකමයි නිතී
ඇඟපතේ නොව හිතෙහි හටගත් - සෝ තැවුල් තව බෝ ඇතී
කොයි ලොවෙන් නෙක බේත් ගත්තත් - හදෙහි ගින්දර සුව නැතී
අවුරුද්ද ළඟ ළඟම ආවත් - දරුවෝ එන්නේ නැතුවැතී..

ස්වාමියා:-
උන්ට උන්ගෙත් දරුවො මැණිකේ - දුරු රටේ මහ වැඩ ඇතී
යළිත් මැටි ගෙට එන්ට උන්හට - කොහොමටත් සිත් නැතුවැතී
ගත්තු වෙහෙසක් උන් හදන්නට - අනේ මට නම් තව හතී
මමත් පරලොව ගියොත් විගහට - නොම හඬන් මගෙ ගුණවතී..

බිරිඳ:-
මහත්තයො ඔය කතා නපුරුයි - ඒව මට ඕනෑ නැතී
යන තැනක අපි එකට යමු මතු - එතකොටත් පාලුව නැතී
දරුවෝ උන්ගේ ලොවෙහි සිටියත් - තුනුරුවන් සරණයි නිතී
ළඟයි අවුරුදු අතුගාමු ගෙයි - කොළ වැටිල දූවිලි ඇතී..

**හිරුනි අමංගා දිසානායක**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය**

# තල මල පිපුණා

රාත්‍රී අන්දකාරය මාගල්ලේ වැව සිප ගන්නවාත් සමඟ ම ඉලව්ගෙය තුළ පැවති නොසන්සුන් බව කෙමෙන් වියැකී යන්නට විය. අප්පච්චි තැනූ පහන් පැල අසලින් එන සන අඳුර මුළු කොක් වත්තම එකවර වැළඳ ගන්නට විය. දහවලේ දී කුරුලු කොබෙයියන්ගේ නොයෙක් නාද රටා මුසු වූ කොක් වත්තේ දැන් ඇසෙන්නට ඇත්තේ තැනින් තැන ලතෝනි දෙන රැහැයියන්ගේ නැවතීමක් නැති විකාර නාදයයි. එකවර මාගල් වැව් ඉස්මත්තේ හිවලෙකුගේ හූ හඬ සමඟ මොර දෙන කිරලෙකුගේ හඬ තැලීම මගේ සිත පමණක් නොව ගත ද සලිත කරන්නට විය. වෙනදාට ඉනි වැට අද්දර දෙමට ගසේ මා බියපත් කරන බස්සා අද නොපැමිණීම මහත් අස්වැසිල්ලක් විය. දහවල පුරාවට ම පැවති අවිවේකී බව නිසාම කුප්පි ලාම්පුව පවා දැල්වීමට ගත වෙහෙස වීම මට මහත් පීඩාවක් ගෙන දුන්නේය. කුසගින්නේම බූරු ඇඳට වැටුණු මා හට අප්පච්චි සිහිවූයේ නිතැතින්මය.

තනි තරුවේ නුඹ බලන්න<br>
සඳ ඇවිදින් පිළිකන්නට<br>
ගණ අඳුරේ තනි ඇතින්න<br>
එන්න එපා මගේ පැලට

අප්පච්චිගේ හඬ තව තවත් තීව්‍ර වෙනවාත් සමග ම කොක් වත්තට ඉහළින් පුංචි බණ්ඩාගේ හඬ ඇසෙන්නට විය.

‘හත්වලාමයි! සේතන් උන්නැහේ’

'ඔන්න කොක් වත්ත පාමුල මහ එකී. සේතනෝ මේ පාර එන පොට හොඳ නෑ. මහ එකී යකා වෙලා.'

පුංචි සන්දියේ මාගල්ලේ වැව ඉස්මත්තේ රූස්ස කැලේට කොක් වත්ත යැ'යි නම පටබැඳුණේ කෙසේ දැ'යි අප්පච්චිගෙන් මම විමසීමි. එවිට අප්පච්චි; ඉස්සර මාගල්ලේ වැවේ ම ගන්දස්සාරේ බැරි වෙන්න කොක්කු ලැගලා තියෙනවා. කොක්කු ලැගපු වත්ත නිසා කොක් වත්ත වුණා' යැයි පැවසීය.

පුංචි බණ්ඩාගේ මොර දීම තාම නැවතී නැත.

'සේතන් උන්නැහේ; පත්තු කොරාපන් යකෝ ඔය ඉලව් ගිනි බටේ. මහ එකීට හොඳටෝම යකා වැහිලා. පත්තු කොරාපන් යකෝ.....'

පුංචි බණ්ඩාගේ මොර ගෑම ලේන් පඬියකට මායිම් නොකළ අප්පච්චි;

'රං එකෝ තෝ ඔන්න ඔහෙට වෙලා ඉඳින්. මං අර පළු කඳට ගිනි තියලා එන්නම්.'

අප්පච්චිගේ කීම නොඇසුණා සේ බලා සිටි මා හට තනි එකී දුටු විගසම බඩ මැද්දෙන් ඇඳ ගත් සරම ටිකෙන් ටික තෙත් වන අන්දම දැනෙන්නට විය. සෙමෙන් තෙත් වූ සරම අත ගා බැලූ මගේ අත නිරායාසයෙන් ම මගේ දෙතොලේ ගෑවුණු විගස පෙරේදා රාත්‍රියේ ලිප තැබූ ලුණු වැඩි වූ කිරි හොද්ද සිහි ගැන්වුණි. මම විගස සරම උණ්ඩි කොට ගත්තෙමි.

සැන්දෑ කාලයට මාගල්ලේ වැවේ උස් අහස රන් පැහැයෙන් දිළිසෙනවා සේම අප්පච්චි ගිනි දැල් වූ පළු කොටය දිළිසෙන්නට විය.

'අප්පච්චී......'

'ඔන්න බොල මහ එකී කඩාගෙන බිඳගෙන එනවා මේ පැත්තට'

මම යටිගිරියෙන් මොර දුන්නෙමි.

'අනේ අප්පච්චි මම මේ ගිනි බටේ පත්තු කොරන්ටද?'

මා කියූ බස් තඹ පිච්චියකට මායිම් නොකළ අප්පච්චි,

'මොකක් ද බොල තෝ කීවේ?'

රනෝ........ මං තොට දවසකුත් කීවා. තියාපිය ඔය ගිනි බටේ අහකින්. යකෝ මේකි කැලේ රැජින. බොල ඒකිට ද ගිනි බිඳින්ඩ හදන්නේ? කියන්නේ නෑ බොට මං ගිනි බිඳින එක.'

අප්පච්චි රං කොලුවා නොකියා රනේ යනුවෙන් හඬ තලන විට ම, උන්දැට මූලග්ගින්න තද වී ඇති වග මම තේරුම් ගත්තෙමි.

පසුවදා උදය වරුවේ ම මා අප්පොච්චිගෙන් ඇසූ සෑම පැනයකටම උන්දෑ හූ මිටි දුන්නා පමණි. අප්පොච්චි මහ එකී යැ'යි පවසන තනි ඇතින්නට ගිනි බිඳින්නට ඇසූ නිසා ඒ තරහා පහකරන බව මට පසක් විය.

එදා සැන්දෑ යාමයේ ගිනි බිඳ, ගෝන මස් ටිකක් නිකවැරටියේ ලොකු ඉස්කෝලේ මහත්තයාට ගොහින් දී නැවත සප්පායම් වන අප්පච්චිව මම දුටුවෙමි. කුඹුක් යායට මෙහා තුන්හිරියා පන් ගොල්ල අස්සෙන් හනිකට පැන ගොස්, ගෙදර ඇවිත් හෝරාවක් පමණ ගත වන විට අප්පච්චි එන වග මම දුටුවෙමි. ඔහුගේ තනි මකන්නේ පුංචි බණ්ඩාය.

'' සේතන් උන්නැහේ... මට කියාපන් බලන්න තෝ කවදාද බොල ඔය ගිනි බටේ තනි එකීට පත්තු කරන්නේ?''

''බොල පුංචි බණ්ඩෝ... මං දැන් වතාවක් කිව්වා. ඒකී තමා මේ වනයේ රැජින. ඉතින් ඒ ඇතින්නට ගිනි තලන්නද තෝ මට කියන්නේ?''

''අනේ බොල සේතනෝ. උඹේ මහ උන්දැට කොරපු හරිය මතක නැති ද ඔය තනි එකී. එදා තොගේ රං කොලුව බේරුණෙත් උගේ පෙර පිනකට.''

අප්පච්චිගෙන් මගේ අම්මා කොහිදැයි ඇසීම නැවැත්වූයේ ලොකු හාමුදුරුවන් සතුන් මැරීම අපායේ යන වරදක් වග කියා දුන් දිනේ පටන්ය. මා අම්මා ගැන අසන හැම විටම පිළිතුරු නොදෙන උන්දෑ ගිනි බටය ගෙන මාගල්ලේ වැව් ඉස්මත්තේ කුරුමානම් අල්ලන මාන කොකුන්ට ගිනි බින්දේය.

'කොලුවෝ ඕන්න බොල මෙදා පොටෙත් තොට අටමස්ථානේ යන්න පුළුවනි. කොක් වත්තේ තල මල පීදීගෙන එනවා.'

තල මල මෝදු වී ගෙන එන කාලෙට ඒ ගැන කවි ගොතන්න අප්පච්චි හරි රුසියාය. ඉහත වංගියේ තල මලට අප්පච්චි කියූ කවිය මට තාම මතකය.

''අටිය වඩන සූවිසි තල මල පිපුණා
තැටිය අලංකාරෙට මල පුබුදු වුණා
මග යන්නෝ මල දැකලා සතුටු වුණා
වැටියෙ ගෙදර තල මල පාරට පෙනුණා ''

'රං එකෝ තෝ බොල අද ගෙට වෙලා ඉඳපිය. මං බොට කන්න කහ කොරළි අල්ලා ගෙන එන්නම්.' යැයි පැවසූ අප්පච්චි කරක් ගෙඩිය රැගෙන මාගල්ලේ වැව දෙසට පියමං කළේ ගංතිය ඇළෙන් වැවට අලුත් වතුර ගලා එන නිසා වග මට වැටහුණි.

අප්පච්චි ගොහින් හෝරා කීපයක් ගත වනවාත් සමගම මට ඇසුණේ කොක් වත්ත පැත්තේ හඬ තලන උලමාගේ මූසල රාවයයි. ඔලුවේ සිට සරම පොරවාගත් මා එක් වර අවදි වූයේ උදහැනැක්කෙම වැව් ඉස්මත්තට දුවන ගම්මුන්ගේ හඬ නිසාය.

''හත්වලාමයි ! හිත හොඳ එකා.''

''දැන් ඉතින් අර කොලුවා තවත් අසරණ වෙනවා.''

''වැව පාමුලලු වැටිලා ඉන්නවා කියන්නේ''

''විගහට යමන් බලන්න''

උදෑසන වුවද තාමත් අප්පුච්චා පේන්නට නැත. උන්දැත් මේ එක්කම වැව් ඉහත්තාවට යන්නට ඇතැයි සිතූ මම ද උන් එක්කම ඒ පැත්තට සේන්දු වීමි.

කුඹුක් ගහ අසල නිකවැටියේ පොලෝසියේ මහත්තුරු දෙන්නෙකු එහාට මෙහාට යනු පෙනේ. මිනිසුන් වළල්ලක් සේ රවුම් ගැසී යමක් නරඹනු මම දුටුවෙමි. විගහට ඒ මන්දැ'යි බැලීමට සැරසුණු මම එකවරම කොටු ගිලිහී ගිය අප්පච්චිගේ කරක්ගෙඩිය දුටුවෙමි.

මුළු ලෝකය ම එකවර මගේ හිස මතට කඩා වැටුණා සේ දැනුණු මම කිසිත් කර කියා ගත නොහැකිව ලතෝනි දෙන්නට වීමි.

**එල්.එච්.කේ. හෂාන් විජේනායක**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය**

# පුළුවන්ද මරාගෙන කන්න දරුවෙක්ව

පොඩි කොල්ලටත් දැන් අවුරුද්දක්
විටමින් මදිලු තටු හයි වෙන්න
ලොකු කෙල්ල ගියෙ ගිය මාසෙ
ගිජුලිහිණියෙක් එක්කල හොරෙන්
දවසක් ගමනක් යද්දි රෑක
වැටිල තිබ්බා ඒකිගෙ පිහාටු
අනේ ගල් කුළකට යටින්
කිව්වේ නෑ මං දුකට
එයා ආයෙත් බඩින්...

කැදැල්ලේ හරි අඩුපාඩු
හිස් වුණ කැඩුණ තැන්වලට
ගලවා ගැහුවේම මගේ පිහාටු
කැලෑවේ වුණත් හරි හිඟයි දැන් ගොදුරු
කඳුළු නැතුවට තෙතක් තිබුණා
බඩගින්නකින් මවාපු...

කන්නට නැතුව මැරුණත්
පුළුවන්ද මරාගෙන කන්න දරුවෙක්
එයා හොඳටම බැන්නා
මම ආයෙ පොඩි එකා අරගෙන
අචිරවතියට පියැඹුවා
මගේ කරුමෙට පටාචාරා

නිවන් දැකලා තිබුණා
ඔව් සර්, ඇත්ත
මම තමයි පටාචාරගේ දරුවා උස්සපු උකුස්සා
මමයි ඒ නිවන් පුරයට යන්න බැරි වුණ තාත්තා

**ඩබ්ලිව්. එම්. නිලක්ෂි ජයනිකා වික්‍රමසිංහ**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය**

# දිං

මට ඕනි වුණේ කොටුවට යන්න. ඒත් එයාට වැල්ලවත්තට විතරයි. ඉතිං අපි ටිකට් ගත්තේ වැල්ලවත්තට. කොහොමහරි මං අන්තිමට 100න් බැස්සේ ගල්කිස්සෙන්. නෑ, මහ හෝටලේට යන්න නෙමෙයි මං එනකම් මගබලන් ඉන්න ටුක්කිට පණුවෝ නැති දං මල්ලක් ගන්න.

ඉතුරු සල්ලි එක්කෝ මට අමතක වුණා. නැත්තම් මං අමතක කළා. මොන කොන්දද මගින් බැහැලා යන වුන්ට ඉතුරු සල්ලි දෙන්න එන්නේ.

එතකොට එයා; එයාගේ පුයර සුවඳ ගල්කිස්ස පොළෙන් එන නරක් වෙන්න ළංවෙච්චි එලවළු ගඳට ගැළපෙන්නේ නෑ. එයා විතරක් නෙමෙයි මගේ යටි හිතත් ඒක දැනං හිටියා. හැබැයි උඩු හිතට මං කවදාවත් ඒක දැනෙන්න දුන්නේ නෑ. එයා සුරංගනාවියක් වගේ. මේ අව්වට පිච්චෙන්න එයාට බෑ. එයාව මගේ ළඟින්ම තියාගන්න මට කියලා කුඩයක්වත් නෑ.

*****

තව දවසක් අපි අයේම 100ට නැග්ගා. එදත් අර කොන්දමයි.

'මල්ලී අදත් මගින් බහින්නද කල්පනාව?'

මං එයත් එක්ක කතා කරන අතරේ මූ එනවා බාල්දි පෙරළන්න. කටින් මුකුත්ම නොකිය මං වැල්ලවත්තට ටිකට් දෙකක් ගත්තා. රෝස කුමාරි දිහා හිනාවෙලා බලන් හිටපු කොන්දා එක

ටිකට් එකකට විතරක් සල්ලි ගත්තා. යකෝ මුගේ මනමාලකම. ඒත් රෝස කුමාරි; එයා මුකුත් කිව්වෙත් නෑ. මට දීපු හිනාව කොන්දටත් ඇෑ වෙනසක් නැතිවම පා කර හැරියා.

'මුනිවත හොඳයි දෙබසින් දූක වැඩි හින්දා.'

බස් එකෙන් ඇහුණ ද නැත්නම් මගේ හිතෙන් ඇහුණ ද කියන්න මං දන්නේ නෑ. එදත් මං ගල්කිස්සෙන් බැස්සා. වැටකොළු, වට්ටක්කා, ලීක්ස්, කරවිල පහුකරන් ගිහින් අදත් ඇස් දෙක නතර වුණේ දං මල්ල ගාව.

ටුක්කි අදත් ඉන්නවා ඇද්ද? දං මල්ල දැක්කාම හිනාවෙවී මං ළඟට එයි ද? හැමදාම මං ගෙනියන දං කාලා ටුක්කිට ඇති වෙන දවසක් ආවොත් එදාට මං මොනවද අරන් යන්නේ?

ඒත් එක දෙයක් මට විශ්වාසයි. මං මුකුත්ම අරන් නොගියත් ටුක්කි මට දෙන ඒ හිනාව වෙන කාටවත් දෙන්නේ නෑ.

හෙම්හෙමින් මටත් නොදැනිම මං මුහුද දිහාට ඇවිදින්න අරං. මහ හෝටලේ ඉස්සරහ තියෙන ලස්සන පිටිපස්සේ නෑ. මැලියම් බැඳිච්ච දත් පේළියක් වගේ කහ ගැහිලා.

කහ පාට, කහ රතු පාට, රතු පාට කොඩි ගහලා වෙරළේ හැම තැනම. මට මතක් වුණේම සුනාමිය ආපු දවසේ මිනිස්සු වෙරළ පර්චස් කරගත්ත හැටි.

*****

ලොකු බෝඩ් එකක සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙනුත් ගහලා.

*කහ - නෑමට සුදුසුයි.
සුමුදු රල.

*කහ රතු- නෑමට සුදුසුයි.
සුමුදු හා මද රළු රල.
ප්‍රවේශම් වන්න.

*රතු - නැමට කිසිසේත්ම සුදුසු නොවේ.
රළු රල.
මුහුදට බැසීමෙන් වළකින්න.

රෝස කුමාරි ආයෙමත් ඇවිත්. මහ අව්වෙම මේ ලුණු රහ මුහුදු වතුර පාගන්න මා එක්කම ඇවිත්. කවදාවත් නැතිව එයාට දාඩිය දාලා. ඒත් ඒ පුයර සුවඳට දාඩිය ගඳ දැනෙන්නේ නෑ. මං ගාව විතරමයි ගඳ. මට මහ ලැජ්ජාවක් දැනුණා. අර හීන මානේ ආයෙමත් ඇවිත්.

එකපාරට රෝස කුමාරි මට සමච්චලේට හිනාවෙලා; මාවත් පහු කරගෙන රතු කොඩිය ළඟට දුවන්න ගත්තා.

'රෝස කුමාරි නවතින්න.'

මහ හඬින් මගේම කටහඬ මටම ඇහෙනවා. වෙරළේ ඇතින් හිටපු ආදරවන්තයෝ දෙතුන් දෙනෙක් ඇස් ලොකු කරන් මගේ දිහා බලන් ඉන්නවා.

'නවතින්න. යන්න එපා'

එයාලා මට විතරක් කෑගහනවා. ඇයි එයාලා රෝස කුමාරිව නවත්තන්නේ නැත්තේ??

මට බෑ මගේ රෝස කුමාරි මාව දාලා යනවා බලන් ඉන්න.

'රෝස කුමාරි. ඔහොම ඉන්න මං එනවා.'

ටුක්කි මට සමාවෙන්න. මට උඹව අමතක වුණේ නෑ. සත්තයි. අදත් මං දං ගත්තා.

කාටහරි පුළුවන් නම් මේ පුංචි දං මල්ල ටුක්කිට ගිහින් දෙන්න.

ජී. පී. එච්. සකුන්තලා ගීතාංජලී
තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය

# පෙන්නාපන් 'ප' යනු පුප්පාපන් පෙනය

සැපසේ ඉන්න ලොකු තුඹසක් මට තිබුණා
ගෙම්බෝ මීයො වැනි රස අහරත් තිබුණා
තිබහට දිය කඩිතිවල වතුරත් තිබුණා
මගෙමයි කියා ජීවිතයක් මට තිබුණා

මිනිසකු ඇවිත් දවසක් මගෙ ගේ කැඩුවේ
ඒ දැක පෙනය පුප්පන් මම කෑ ගැසුවේ
වෙන මිනිසුන් වගේ ඔහු නැහැ බය වූවේ
වලිගෙන් ඇදලා මල්ලකටයි මා දැමුවේ

බෙල්ලෙන් අල්ලලා මගෙ දත් ගැලවූවේ
මං හැඬුවා එනමුත් ඔහු නැහැ දුටුවේ
පොඩි නයි පෙට්ටියක් මගෙ නිවහන වූවේ
එදිනයි මගේ ජීවිතයම අඳුරු වුණේ

කැලයෙ දි ගොදුරුවලිනුයි කුස පිරෙන්නේ
දවසට එකම බිත්තරයයි දැන් දෙන්නේ
තිබහට නැතේ දිය උගුරක් ලැබෙන්නේ
මග යන්නට පණ නැතිවයි මම ඉන්නේ

පෙන්නාපන් 'ප' යනු පුප්පාපන් පෙනය
මට ටොකු අනින හැටි කාටත් නොපෙනේය
රිදුණත් කියන්නට මට කට හඬ නැතිය
මේ 'ප' යන්න මට ඇති එකමෙක හෙණය

නටපන් නයිහාමි නටපන් කියමින්නේ
මහ මග ගිනි අව්වේ ඇයි මට වද දෙන්නේ
නටනවා නොවෙයි මං වැනෙනවා කුස ගින්නේ
ඇයි මිනිසුනේ නුඹලට එය නොදැනෙන්නේ

හම ගැළවිලා මගෙ ඇඟ තැන තැන දන්නේ
මැස්සොත් අනේ මට ඔච්චම් කරන්නේ
පවු කළ නිසයි තිරිසන් වී උපන්නේ
මිනිසුනි කිමද එය තේරුම් නොගන්නේ

බුදු හිමි මුචලින්ද සෙවනේ වැඩ සිටියා ලූ
වැඩ නා ලොවට සුමියුරු දම් දෙසුවා ලූ
නා ලොව නා රජුත් මගෙ නෑදෑයෝ ලූ
මා බේරන්න අද ඒ කවුරුත් නැති ලූ

ගෙම්බො මීයො මා නැති කල සතුටු ඇතී
වේයො යළිත් මහ තුඹසක් බඳිනවැතී
තිත්තයො මඩ කඩිතිවල සතුටින් නටනු ඇතී
පූරුවෙ කළ පවක් මං මේ ගෙවනු ඇතී

කැලේ තුඹසෙ දිග ඇදිලා නිදන්නට
බඩ කට පිරෙන්නට රස කෑමක් කන්ට
පිහිනා දොළ පාරෙ සිත් සේ නාගන්ට
දවසක් එයිද ආයෙත් කැලයට යන්ට

**ප්‍රදීපා මහේෂිකා**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය**

# දෝතලු

මෙය හිතලුවක් හෝ ප්‍රබන්ධයකැ'යි කියවද්දී ඇතැම් විට ඔබට සිතෙන්නට පුළුවන. නමුත් එය එසේ නොවන බවත්, මෙය ඉඳුරාම සත්‍යක් බවත් මට දිවුරා කිව හැකිය. මේ සිදුවීම සිදු වූයේ මීට වසර කිහිපයකට පෙරය. ඉදින් මේ කතාව ගෙන එන්නට නම් මා වසර කිහිපයක් අතීතයට යා යුතු ය.

''සර් ඇවිත් ගොඩක් වෙලාද?'' රංජිත්ගේ හඬ ඇසෙත්ම එතෙක් ගොඩනගමින් සිටි සිතුවිලි ලෝකය මම සැනෙන් බිඳ දැමුවෙමි.

''දැන් ටිකක් වෙලා. මට මේ උදව්ව කරලා දෙනවා රංජිත්. මං තමුසෙට සලකන්නං. ගිය පාර කරපු ෆිල්ම් එකත් ෆේල්. මේකත් ලොස් වුණොත් මට පාරට බහින්න වෙන්නේ.'' මම එතෙක් ඇඟිලි දෙකක රඳවාගෙන සිටි සිගරට් කොටය බිම දමා පයින් පාගා පොඩි කෙරුවෙමි.

''සර් බය වෙන්න එපා. සර්ට ගැළපෙනම කතාවක් තියෙනවා. මර්ඩර් කේස් එකක්. මේක වෙන ඒවට වඩා වෙනස්. සර් ම ඇවිත් බලන්නකෝ. මං මිනිහා එක්ක කතා කරන්න සර්ට කොහොම හරි හදලා දෙන්නං.'' රංජිත් ඔහුගේ බුලත් කහටින් දුර්වර්ණ වුණු දසන් දක්වා සිනාසුණේ ය.

''මර්ඩර් කේස් නං මොනවද රංජිත් ! තමුසෙලම දවසට කීයක් උසාවි දානව ද? ඕක වැඩක් නෑ.'' මගේ අකමැත්ත මුහුණින් ද පෙනෙන්නට ඇත.

''සර් මං කියනවට එක පාරක් ඇවිත් බලන්නකෝ. සර්ට තේරෙයි මං කිව්වේ මොකක්ද කියලා. පිටින් පේන්නේ නං පවුල් ආරවුලක් වෙලා මිනිහා ගෑනිව මරලා දාලා කියලා. ඒත් සර් මේක වෙනස්. සර් ම ගිහින් බැලුවා නං තමයි වටින්නේ. හරි නැත්තන් අයින් කරලා දාන එක පස්සේ බලන්න පුළුවන්නේ.'' රංජිත් හරිම තැනට ඇණය ගැසුවේ ය.

''හ්ම් බලමුකෝ. මට තව විස්තර ටිකක් කියනවකෝ'' අවසානේදී මම රංජිත්ගේ බසට අවනත වූයෙමි.

රංජිත් පැවසූ පරිදි තිස් අට හැවිරිදි ප්‍රසන්න කිත්සිරි යන අය විසින් විසි හතර හැවිරිදි දෝතලු මහිංසා යන අයව නිදි යහනේදීම ඝාතනය කර තිබිණි. උසාවියෙන් වැරැදිකරු කිරීමේදි නිර්දෝෂී බව කෙසේ වුවත් හදිසි කෝපය නිසා සිදු වූ මනුෂ්‍ය ඝාතනයක් බව දැක්වීමටවත් ඔහු උනන්දුවක් දක්වා නොතිබුණි. ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවම නිහඬව ම බාර ගත් ඔහුව වැලිකඩ බන්ධනාගාරය වෙත යවා තිබිණි. තව දින දෙකකින් පසුව ඔහුව මුණ ගැසීමට මග පාදා දෙන්නට පොරොන්දු වූ රංජිත් පිටව ගියේ මගෙන් සන්තෝසමක් ලෙස ලද මොනර කොළ කිහිපය ද සාක්කුවේ රඳවා ගෙන ය. රංජිත් පොරොන්දු වූ ලෙසට ම පසුව ප්‍රසන්න කිත්සිරි යන අයව මට මුණ ගැස්සුවේ ය. මා ප්‍රසන්න වෙතින් බලාපොරොත්තු වූයේ දරදඬු, මුග්ධ පෙනුමක් වූ නමුත් ඔහු තුළ තිබුණු අසාමාන්‍ය නිහඬතාව මා පුදුමයට පත් කළේ ය. ඔහුගේ ගිලී ගිය දෑස් මට කියා පෑවේ කුමක්දැ'යි සිතාගත නොහැකි ව මම උරහිස් හැකිළුවෙමි. නමුත් ඒවායේ වෛරයක සේයාවක හෝ නොවූ බව මට ඉඳුරාම කිව හැකිය. කෙසේ වුව ද මා හඳුනා ගන්නට මෙන් ප්‍රසන්න මා දෙස බලා අනිමිස ලෝචනයේ යෙදී සිටියේ ය.

''මම සෙනරත් ජයවීර. ෆිල්ම් ඩිරෙක්ටර් කෙනෙක්. මං කැමතියි ප්‍රසන්නගේ කතාව අහන්න. ෆිල්ම් එකකට ගැළපෙනවා නම් මේකෙන් ෆිල්ම් එකක් කරන්නත් බලාපොරොත්තුවක් තියෙනවා. ප්‍රසන්න වැරැද්දක් කරලා නැත්නං මං වුණත් මේ

කේස් එක ඇපීල් කරලා දෙන්නම්. සමහර විට මේකෙන් ප්‍රසන්නට නිදහස වුණත් ලැබේවි.'' මා මගේ සුරත දිගු කරමින් පැවසුවේ ප්‍රසන්නගේ විශ්වාසය දිනා ගැනීමට විනා සැබවින් ම ඔහුව නිදහස් කර ගැනීමේ අරමුණෙන් නොවේ. මිනීමරුවෙකු නිදහස් කර ඒ ලේ මගේ දෑත්වල තවරා ගන්නට මා තුළ අංශුමාත්‍රයක හෝ ආශාවක් නොවීය.

''මට නිදහස් වෙන්න ඕනි නෑ!'' ඔහු මා දිගු කළ සුරත තඹේකට ගණන් නොගැනීමෙන් මා තුළ ඇති වූයේ කෝපය මුසු වූ ලැජ්ජාවකි.

''ඇයි මිස්ටර් ප්‍රසන්න එහෙම කියන්නේ? නිර්දෝෂී බව කොහොම වුණත් ලෝකෙට කෑ ගහලා තමුන් මිනී මැරුවේ සාධාරණ හේතුවකට කියලා කියන්න පුළුවන්නේ'' කෝපයත්, ලැජ්ජාවත් මැඬගෙන මම යළිත් පින්සේන්ඩු වුණෙමි.

''මොකටද මහත්තයා? අනික කාට පෙන්නන්න ද?'' ඔහු තුළ වූයේ අවඥා සහගත සිනහවකි.

''ඇයි මනුස්සයෝ මෙතනින් එළියේ ලෝකයක් කියලා එකක් තියෙනවා. ඒක අමතක වෙන්න තමුසේ මැරිලා ඉපදිලා නැනේ. මං කියන්නේ අන්න ඒ ලෝකේ ඉන්න මිනිස්සුන්ට තමුසේ වැරදිකාරයෙක් නෙවෙයි කියලා පෙන්නනවා. පිහියෙන් ඇන්නේ වයිෆ්ට වෙන සම්බන්ධයක් තිබිලා අහුවෙච්ච කේන්තියට කියනවා. නැත්තං වයිෆ් තමුසෙව මරන්න හදපු නිසා ආත්මාරක්ෂාවට කියනවා. අයිසේ, මේ කාලේ ඇත්ත බොරුව කරලා, බොරුව ඇත්ත කරන්න පුළුවන්.'' දැන් නම් මේ මිනිහා මා කෙරෙහි පූර්ණ විශ්වාසය තබන බැව් මට හොඳට ම පැහැදිලි ය.

''ඕන්නෑ මහත්තයා. මං වැරදි නෑ කියලා මං දන්නවා, දෝතලු දන්නවා. ඒ හොඳටම ඇති. එතනින් එහාට ලෝකයක් ගැන මං දන්නේ නෑ. මට වැඩකුත් නෑ. තමන් හරි කියලා තමන් දන්නවා නම් අනිත් මිනිස්සු කියන කතා වැඩක් නෑ. අනික මහත්තයා කිව්වා වගේ දෝතලු නරක කෙනෙක් නෙවෙයි.'' ඔහු උත්සහ

කළේ ම'වෙතින් මිදී යන්නට බැව් මට නොවැටහුණා නොවේ.

''පොඩ්ඩක් ඉන්න. තව ටිකක් කල්පනා කරලා බලන්න. ලෝකෙට කියන්න යන්න ඕන්නෑ. ඒත් අඩු ම ගානේ හිත සැහැල්ලු වෙයි. මං ගිහිං එන්නං මිස්ටර් ප්‍රසන්න.'' මා එතනින් පිටව ආවේ යළි ඔහු හමුවන මානසිකත්වයෙන් නොවේ.

තම බිරිඳ මරා දැමූ මිනීමරුවෙකු ඉදිරියේ දණ නොනැමිය යුතු බව මගේ ගර්වය මට කෑ ගසා කිව්වේ ය. එහෙත් මේ මිනිසා දින කිහිපයක් තිස්සේ මනසේ රැඳෙන්නට වූයේ මගේ ව්‍යාකූල බව වැඩි කරමිනි. කොතෙක් උත්සාහ දැරුවත් ඔහුගේ බලාපොරොත්තු රහිත දෑස් මතකයෙන් ඉවත් කරන්නට මට නුපුළුවන් විය. එහි ප්‍රතිඵලය වූයේ තවත් දින කිහිපයක් ඇවෑමෙන් මා නැවත ඔහු සොයා යෑම ය.

''මං කල්පනා කළා මහත්තයා. මේ කතාව මහත්තයා දැනගත්තත් නැතත් මට හම්බුවෙන දෙයක් නෑ. මහත්තයා අහන් ඉන්නවා නං මං කියන්නං''

මගේ කැමැත්ත මගේ මුහුණින් පෙනෙන්නට ඇත. වහා හිස වනා ප්‍රසන්නගේ අදහස ස්ථිර කළ මම, එතෙක් මා සතුව පැවති ටේප් රෙකෝඩරය ක්‍රියාත්මක කර පසෙකින් තැබුවෙමි.

''මගේ නම ප්‍රසන්න, ප්‍රසන්න කිත්සිරි. වයස අවුරුදු තිස් අටයි. මගේ පුංචි කාලේ ගෙවුණ විදිහ මතක් කරන්නවත් මං ආස නෑ. ඒක අපායක්. අම්මා නෑ, තාත්තා නෑ, අඳින්න ඇඳුමක් නෑ, පුදුම දුකක් වින්දේ. මං ආයේ ආයේ ඒක ගැන කියන්නේ නෑ. මොකද කොච්චර කිව්වත් මහත්තයාට ඒක තේරුම් ගන්න බෑ. ආච්චි තමයි මාව බලා ගත්තේ. ඒත් උන්දෑ බලාගත්තා කියලා වුණ මහ ලොකු සෙතක් නෑ. අපි අඩු කුලේ අය. ගමේ කවුරුත් අපිව ගණන් ගත්තේ නෑ. අපි නිකම්ම ගමෙන් කොන් වුණා. කොහොමහරි නගර සභාවේ පොඩි ජොබ් එකක් හොයාගන්න මට පුළුවන් වුණා. මටත් ඕන වුණා මහත්තයා අනිත් අය එක්ක කතා කරලා සාමාන්‍ය මිනිහෙක් වගේ ඉන්න. ඒත් කවුරුත් මාව

පයිසෙකට ගණන් ගත්තේ නෑ. පුදුම තනිකමක් තිබ්බේ. ආච්චි නැති වුණාම ඒක තවත් වැඩි වුණා. උන්දෑ හිටියා කියලත් අපිට කතා කරන්න දෙයක් තිබ්බේ නෑ. කසාදයක් බැඳගන්න උවමනාව තිබ්බත් කව්රුත් කැමති වුණේ නෑ. මගේ තරුණ කාලේ ගෙවුණෙත් එහෙමයි. දෝතලුව හම්බුණේ ඔහොම කාලයක් යද්දී. මහත්තයා කිව්වට විශ්වාස කරන එකක් නෑ! දෝතලුව මං මුලින් දැක්කේ කනත්තක් ගාවදී'' ප්‍රසන්නගේ මුවින් මොහොතකට සිනාවක් නැගිණි. ''එදා හොඳට ම වහින හවස් වරුවක්. පැත්තම කළුවර වෙලා තිබ්බේ. මං කනත්ත පහු කරං ගියේ ගෙදර යන්න. පළාතක කවුරුත් නෑ. එතකොට තමයි මං දැක්කේ ගෑනු ළමයෙක් කනත්ත ඇතුළේ ඉඳං එළියට දුවගෙන එනවා. ගැහි ගැහි දුවගෙන ඇවිත් කෙළින්ම නැවතුණේ මගේ කුඩේ යට. හොඳටම තෙමිලා හිටියේ. හන්දිය ගාවට වෙනකං ගිහිං දානව ද ඇහුවා. මට ඕන කළේ බෑ කියන්න. ඒත් මගේ කටින් පිටවුණේ හා කියලා. ඒ ගෑනු ළමයට තිබ්බේ පුදුම හිනාවක්. මම වශී වුණේ ඒකට. සුදු, ලස්සන ගෑනු ළමයෙක් වැස්සෙ මාත් එක්ක කතා කර කර යන එක මට ගෙනාවේ අමුතු හැඟීමක්.'' ප්‍රසන්න මොහොතකට නිහඬ විය. මදක් දෑස් පියාගෙන සිටි හෙතෙම යළි කටහඬ අවදි කළේ ය.

''කාලයක් ගියා. දෝතලු මගේ ජීවිතේට ටික ටික ළං වුණා. ඒ කොහොමද කියන්න මං දන්නේ නෑ. මං වැඩ ඇරිලා එද්දි එයා කනත්තේ ඉඳලා එළියට ආවා. දෝතලු කිව්ව විදිහට එයා අපේ ගමේ කෙනෙක් නෙවෙයි. නැතිවුණ නෑ කෙනෙක්ගේ සොහොන බලන්න එනවා කියලා තමයි මාත් එක්ක කිව්වේ. මාත් ඊට වඩා ඒ ගැන අහන්න ගියේ නෑ. කොහොම හරි දෝතලු මගේ ජීවිතේට නැතුව ම බැරි කෙනෙක් වුණා. එපා කියලා හැමෝම අයින් කරපු මාව එයා හරි ආදරෙන් පිළිගත්තා. දෝතලුව මට පෙනුණේ මගේ දුක නැති කරගන්න ආව සුරංගනාවියක් වගේ. දෝතලු කවදාවත් මාව මිනිස්සු ගැවසෙන වෙලාවට හම්බ වෙන්න ආස වුණේ නෑ. මට ඕන වුණේ හැමෝටම පේන්න එයාව එක්කගෙන යන්න. හැබැයි දෝතලුට ඕන වුණේ මිනිස්සුන්ව මග ඇරලා ඉන්න. මං දෝතලු එක්ක රෑ එළිවෙනකන් කියවලා ඇති. ඒත් දවල් දවසෙ

හම්බවෙලා නෑ. දවල් දවසේ තනි වෙච්ච මම දෝතලු නිසා ඊ ජීවිතේට ඇබ්බැහි වුණා. ඔහොම ගිහින් මං දෝතලුගෙන් බඳිමු ද කියලා ඇහුවා. එයාට එහෙම හදිස්සියක් තිබ්බේ නෑ. ඒත් දෝතලුව නැති වෙයි කියලා මං හිටියේ හරි බයෙන්. මමයි දෝතලුයි හැම අතින්ම හරි වෙනස්. නම්වල ඉඳන් ම අපි ගැළපෙන්නෙ නෑ. වයස්වල වුණත් ලොකු පරතරයක් තිබ්බා. දෝතලු සුදුයි, ආයේ ආයේ බලන්න තරං ලස්සනයි. ඒත් මං එහෙම නෑ. කලුයි, කෙට්ටුයි. අපි දෙන්නගේ තිබ්බ එක ම සමානකම අපි දෙන්නට ම අපේ කියන්න කවුරුත් හිටපු නැති එක විතරයි. දෝතලුගේ අම්මයි තාත්තයි නැතිවෙලා. කෙහොමහරි මගේ බල කිරිල්ලට දෝතලු මාව බැන්ඳා. කතා දෙකක් නෑ මහත්තයා දෝතලු කියන්නේ හොඳ බිරිඳක්. මට දැනුණේ මං ආයේ අලුතෙන් ඉපදුණා කියලා.'' ප්‍රසන්න එකවරම සිය කතාව නැවැත්වීය. එතෙක් හැඟීම්වලින් හිස්ව පැවැති ඔහුගේ දෑස් රතු ව ගොස් තිබුණි. අප දෙදෙනා කතාවකින් තොරව මිනිත්තු කිහිපයක් එසේ සිටියෙමු.

''මහත්තයට කම්මැලි ද?'' ප්‍රසන්න නිහඬතාව බින්දේ ය.

''ම්හු, නෑ! මං හරි ආසාවෙන් අහන් හිටියේ'' සැබවින්ම මම ඔහුගේ කතාවේ අතරමං ව සිටියෙමි.

''මං දෝතලුව සතුටෙන් තියන්න පුළුවන් හැමදේම කළා. ඒත් ටික කාලයක් යද්දී එයා හිතේ හිර කරගත්ත දුකකින් ඉන්නේ කියලා මට තේරුණා. මට නොකියපු දුකක් එයාගේ හිතේ තියෙනවා කියලා දැනෙද්දී මං එයාගෙන් ඒක ඇහුවා. හැබැයි දෝතලු කිව්වේ එහෙම දෙයක් නෑ කියලා. මටත් එයාව අවිශ්වාස කරන්න හේතුවක් තිබ්බේ නෑ. අපේ ගේ වුණත් තිබ්බේ ගමේ කොනට වෙන්න. ඕනම වුණ වෙලාවක ඇරෙන්න දෝතලු ගෙදරින් එළියට ගියේ නෑ. ඒ නිසා මටයි දෝතලුටයි තිබ්බේ හරි නිස්කලංක ජීවිතයක්. කවුරුත් හිටපු නැති අපිට හිටියේ අපි විතරයි.

මහත්තයට මං කලින් කිව්ව ද කියලා මතක නෑ මට බල්ලෙක් හිටියා. ඒකා නාවර පෙරාගෙන පාරේ ගිය වල් බල්ලෙක්. කන්න නැතුව වැටිලා ඉද්දී මං ගෙදර උස්සන් ආවා. එතකොට

මායි දෝතලුයි බැඳලා නෑ. බල්ලා මට කොච්චර හීලෑ වුණත් උෟට දෝතලුව පෙන්නන්න බෑ. දැක්ක තැන බුරාගෙන පනිනවා. දෝතලු කොච්චර ටොමීට ළං වෙන්න හැදුවත් ටොමී කළේ ම දෝතලුට කඩාගෙන පනින එක. ඒ නිසා දවස තිස්සෙම ටොමියව බැඳලා දාන්න මට සිද්ධ වුණා. දෝතලු ඇවිත් ටික දවසකින් ටොමී ගෙදරින් කන එක පවා නතර කළා. උෟ කිසි දෙයක් කෑවේ නෑ. මං මොනතරම් ටොමියව සනීප කරගන්න හැදුවත් බැරි වුණා. දවසක් උදේ බලද්දි ටොමී නහයෙන් කටින් ලේ දාගෙන මැරිලා වැටිලා හිටියා. මාත් එක්ක හිටිය ටොමියව හොරු අරන් ගිහින් වගේ මට දැනුණේ. දෝතලු තමයි මගේ ළඟට වෙලා හිත හැදුවේ.

මෙච්චර ආදරෙන් මාව බලාගත්ත දෝතලුව මරලා දාන්න මම කොච්චර පව්කාරයෙක් ද කියලා මහත්තයා හිතනවා ඇති. මහත්තයට කියන්න එක කාලකන්නි රෑක මට පොල්ලෙන් ගැහුවා වගේ හැමදෙයක් ම ඇස් ඉස්සරහා මැවුණා. මොනවා කරන්න ද කියලා හිතාගන්න බැරි වුණා. මං දෝතලුට ආදරේ කළේ අන්ධයෙක් වගේ. ඒ නිසා මට කිසි දෙයක් පෙනුණේ නෑ. මං දිගටම ඒ ගැන කල්පනා කළා. දෝතලු කනත්තෙදි මට හම්බ වුණ විදිහ, දවල් මග ඇරලා රෑ විතරක් හම්බ වෙමු කියපු එක, කාත් කවුරුවත් නෑ කියපු එක, මගේ දුප්පත්කම ප්‍රශ්නයක් නොවුණු එක, ගෙදරින් එළියට බැස්සේ නැති එක, බල්ලා දෝතලුට අකමැති වුණ එක, මේ හැම දෙයක් ම මගේ ඔලුවේ වැඩ කළා.'' ප්‍රසන්න ගැඹුරු හුස්මක් පිට කළේ ය.

දෙවියනේ මේ මොනවද කියන්නේ, මේවා වෙන්න පුළුවන් ද, මේ මිනිහා නොකියා කියන්නේ දෝතලු කියන්නේ අමනුස්ස බලවේගයක් කියල ද! මගේ හිසේ එකවර හෙණගෙඩි සීයක් පුපුරන්නාක් මෙන් විය. මේක වෙන්න බෑ. මම මට ම කියා ගතිමි. ප්‍රසන්නත් මාත් අතර වූයේ අසාමාන්‍ය නිහැඬියාවකි.

''මහත්තයා හිතනවා ඇති මං බොරු කියනවා කියලා. ඒත් ඒ ඔක්කොම ඇත්ත. මං දෝතලුව මග අරින්න ගත්තා. දෝතලුට ඒ වෙනස තේරෙන්න ඇති. ඒ හින්ද ද කොහෙද දෝතලු කිව්වා

එයා ගාව මට කියන්න දෙයක් තියෙනවා කියලා. ඒත් ඒ මොකක්ද කියලා මං ඒ වෙද්දිත් දැනගෙන හිටියේ. මං ඒක දන්නවා කියලා කිව්වහම එයා පුදුම වුණා. එයා මගෙන් ඇහුවා ඒක මට ප්‍රශ්නයක් ද කියලා! මම මුකුත් නොකියා මග ඇරලා ගියා. දෝතලු කියන්නේ යක්ෂයෙක් ද, හොල්මනක් ද කියන්න මං දැනගෙන හිටියේ නෑ. දෝතලුට තේරෙන්න ඇති මං එයා ගැන දැනගෙන කියලා. මං දෝතලුව පුළුවම් තරම් මග ඇරියා. උදෙන්ම ගෙදරින් ගිහින් මහ රෑ වෙලා ගෙදර ආවා. දෝතලු වුණත් මට කතා කරන්න ආවේ නෑ. ඒත් එයා ඒ වෙනුවට වෙන දෙයක් කළා. එයා හැම රෑම හීනෙන් මට කතා කළා. මූණට කියන්නේ නැති ගොඩක් ඒවා හීනෙන් කිව්වා. කොහොම හරි දෝතලු කියන්නේ හිර කරලා තිබ්බ ආත්මයක්. එයාට ඕන කරලා තිබ්බෙ හිර වෙලා තියෙන ආත්මෙට සැනසීමක්. එයා මට කිව්වා එයාව නිදහස් කරන්න කියලා. අන්තිමේදී එයා මගේ නින්ද නැති වෙනකම්ම මට හීනෙන් කරදර කළා. එක ඇඳේ එහා පැත්තේ අහිංසක විදිහට නිදන් හිටපු දෝතලු මුළු රෑ ම මාව හීනෙන් බය කළා. එයා ඉල්លුවේ එයාව මරලා සැනසීම දෙන්න කියලා විතරයි. අන්තිමට මම දෝතලු ඉල්ලපු දේට කැමති වුණා. කැමති වුණාටත් වඩා එයා මාව පොළඹව ගත්තා. මං දෝතලු නිදන් ඉද්දිම පිහියෙන් ඇන්නා. එයා අමාරුවෙන් ඇස් ඇරියා. ඒ ඇස්වල තිබ්බේ පුදුමයක්. සමහර විට අකමැත්තෙන් හරි මං එයාගේ සැනසීම දුන්න නිසා වෙන්න ඇති.

අන්තිමට මට දෝතලුව නැති වුණා. මගේ ජීවිතේ මං ආදරේ කරපු, මට ආදරේ කරපු එක ම කෙනාව නැති වුණා. මං මටත් වඩා එයාට ආදරේ කළා මහත්තයා. ඒ නිසා මං එයා කියපු දේ ඇහුවා.'' ප්‍රසන්න කුඩා දරුවෙකු මෙන් හඬන්නට පටන් ගත්තේ ය. ඔහු මොනවදෝ කියමින් හැඬුම් නවතාගන්නට උත්සහ කළ නමුත් එය ව්‍යර්ථ ව ගිය තැන යළි ඉකි ගසා ඇඬුවේ ය.

''එයා ලෝකෙන් ගිහින් දවස් තුනකට පස්සේ ආයේ මගේ ළඟට හීනෙන් ආවා. එයාව නිදහස් කරපු එකට මට පින් දුන්නා. මහත්තයා ඉතිං හිතනවද මං වැරැද්දක් කළා කියලා? දෝතලු මගෙන් ඉල්ලපු එක ම දේ මං එයාට දුන්නා. එතතින් එහා මං

කිසි දෙයක් දන්නේ නෑ මහත්තයා'' ඔහු ආයාසයෙන් හැඬුම් නවතාගෙන කීවේ ය.

''මට නිදහසක් එපා මහත්තයා. දෝතලු ඉල්ලපු දේ මං දුන්නා. ඒ නිසා මං නිදහස් මිනිහෙක්. ඒ නිදහස මට ඇති මහතත්තයා. ඕක තමයි මගේ කතාව. මහත්තයා දැන් යන්න. මට තනියෙන් ඉන්න ඕනේ.'' ප්‍රසන්න මා වෙතින් මුහුණ ඉවතට හරවා ගත්තේ ය. තවදුරටත් එහි සිට ඵලක් නොවූයෙන් මම ඔහුගේ පිටට තට්ටුවක් දා ක්‍රියා විරහිත කළ ටේප් රෙකෝඩරය ද රැගෙන ඉවතට පැමිණියෙමි.

මට ප්‍රසන්න කෙරෙහි ඇති වූයේ කියාගත නොහැකි අන්දමේ හැඟීමකි. මම සත්‍යයත් මායාවත් අතර පැටලී හුන්නෙමි. එහෙත් ප්‍රසන්න පැවසුවේ සත්‍යය බැව් මගේ සිත කෑ ගසා කීවේ ය. මුළු වෙලාවෙහි ම නොවෙනස් ව පැවතුණ ඔහුගේ දෑස් ඊට සාක්ෂි සැපයුවේ ය. සියල්ල අවසානයේ මා රංජිත් හමු වූයේ ඔහුට ස්තුති කර සමුගන්නට ය.

'' සර්ගේ වැඩේ හරි ද? මිනිහා සේරම වැමෑරුව ද?'' රංජිත් මගෙන් විමසීය.

''හ්ම්. ඒ මනුස්සයා නිදහස් වෙන්න ඕනේ කිව්වොත් මට කියන්න රංජිත්. මගේ මැරිච්ච අම්මාපල්ලා මං ප්‍රසන්න ව එළියට ගන්නවා.'' මා කීවේ සැබැවින් ම අවංකව ය.

''සර් මේකත් බලන්නකෝ. ප්‍රසන්නගේ නඩුවෙ විස්තර ඔක්කොම මේකේ තියෙනවා. අමාරුවෙන් හොයා ගත්තේ. ''රංජිත් මා වෙත පෑවේ දුර්වර්ණ ව ගිය ෆයිල් කවරයකි.

මම අතිශය කුහුලින් යුතු ව එය එතැනම දිග ඇරියෙමි. දෙවන වතාවටත් මගේ හිස මත හෙණ ගෙඩි සීයක් පිපිරුවාක් මෙන් විය.

යම් අපරාධ කල්ලියක් දෝතලුගේ මාපියන් මරා දමා ඇති බවත්, ඉන් දෝතලු පමණක් දිවි බේරාගෙන ඇති බවත්, අතිශය

බියට පත් වූ ඇය සමාජයෙන් හුදකලාව විසූ බවත්, පසුව ප්‍රසන්න කිත්සිරි නම් පුද්ගලයෙකු හා විවාහ වී ඇති බවත් පැමිණිල්ලේ නීතිඥයන් ඔප්පු කර තිබුණි. දිගින් දිගට ම සමාජයෙන් ප්‍රතික්ෂේප වීම නිසා හුදකලා ජීවිතයක් ගත කළ විත්තිකරු අදාළ තරුණියගේ ආගමනයෙන් අතිශය උද්දාමයට පත් ව ඇති බවත්, දිගු කලෙක පටන් පැවති හුදකලාව කරණ කොටගෙන ඔහු මානසික ව්‍යාධියකින් පීඩා විඳි බවත්, මෙම මිනීමැරුම ඔහුගේ මානසික රෝගය මත සිදුවූවක් බවත් එහි තවදුරටත් සටහන් ව තිබිණි.

**ශේන්යා ලක්ෂානි ප්‍රනාන්දු**
**ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය**

# සාවිත්‍රිගේ සිංහල අකුරු

හිරු අවසන් ගමන් යන රතු පාට
තල් ගස් හේඩාවේ සවසට
සමතලා කොට රත් වුණ සුදු වැල්ල
ඉගෙන ගත් සිංහල අකුරු එකතු කොට

අම්මා කියා ලියා ඇඟිල්ලෙන්
කියවා වරින් වර අකුරෙන් අකුර
බලන්නී ඈ වටපිට සැකෙන්
කිසිවෙක් ඇත්ද ඇසෙන මානෙක

එතනම ලියා හුරු පුරුදු
දෙමළ අකුරුද වටකුරු සිංහල අකුරු ළඟ
ගල් ගැසී බලයි මොහොතකට
අකුරුවල ඇති එකම හැඩ

ලිය ලියා සිංහල දෙමළ අකුරු
එකම තැන එක පේළියට
බලයි හිනැහී කලින් නොදුටුව
අසිරියක් ලියූ අකුරුවල

හිරු ගිලී සිතිජ ඉමේ
පත්වෙන හීන් අඳුරත් එක්ව

වියළි කොළ රොඩු අරන් එන සුළඟක්
කියයි වැස්සක පෙර නිමිත්තක්

වැටෙන්නට මහා වැස්සක්
මෝදුවෙයි අහසේ පැත්තකින්
කළු වලා රොත්තක්

බලා අහස පොඩි කරගෙන දෑස් යුග
මුමුණයි හිතට හීන් දුකින් පිරුණ
වැස්සොත් හයියෙන් සේදෙයිද
ලස්සනට මේ ලියූ අකුරු ටික

නෙත් වසාගෙන යැදුමක් දෙවියන්ට
එපා වැස්සට ඉඩ දෙන්න හේදෙන්න
අමාරුවෙන් ලියූ අකුරු ටික
කොච්චර අමාරුද නුහුරු අකුරු
එකින් එක පේළියට අමුණන එක

**රූත් නිම්නා ප්‍රනාන්දු**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය**

# රොකට් එක

ජීවිතයේ වැඩියෙන් ම ආස කරන කාලය මොකක් ද කියලා කවුරුහරි මගෙන් ඇහුවොතින්, අත් දෙකම උස්සලා දෙපාරක් නො හිතා ම කියැවෙන්නේ ඉස්කෝලේ ගිය කාලේ කියලා. ඒ තරම් ම හිතට කා වැදුණු මතක රොත්තක් විශ්වවිද්‍යාල ජීවිතයේදිවත් එකතු වෙන්න ඇති කියලා මට නම් හිතෙන්නේ නෑ. මම උසස් පෙළ කරන කාලේ ඉගෙන ගත්තේ කොළඹ රාජකීය විද්‍යාලයේ. කොහොම හරි මම උසස්පෙළ කළේ කලා අංශයෙන්. අපිට කලා අංශයට ම තිබුණේ පන්ති හතර යි. ඒ 13 වසරේ පන්ති දෙකත් එක්ක යි. ඒත් කොමස්, මැත්ස්, බයෝ පන්ති පහළොවක් - දාසයක් එක වසරකින් විතරක් තිබුණා. එතනත් ඉතිං කලාකාරයට අසාධාරණයක් නේද කියලා මමත් නිකං යුගයේ කලාකරුවා වගේ හිතපු වෙලාවලුත් තිබුණා.

කොහොම වුණත් ඉස්කෝලේ ඇතුළේ කලාකාරයන්ගේ වැඩවල හොඳකම නිසාම ද කොහෙද කලා අංශයේ පන්ති හතර තිබුණේ "පප්පන්ගේ" රූම් එක ළඟට වෙන්න යි. ඒ කියන්නේ ප්‍රිෆෙක්ට් රූම් එක ළඟට වෙන්න යි. ඒ නිසා අපි පොඩි බජව්වක් දාන්න, එහෙම නැත්තං පන්තියෙන් කට්ටි පනින්න වගේ වැඩවල දී බොහොම සැලකිල්ලෙන් කරන්න පුරුදු වුණා. එතනත් ඉතින් කලාකරුවාගේ සිතුවිලි සිර කර තැබීමක් කියලයි අපි ලොකුවට කතා වුණේ. ''ඇයි ඉතිං බං බජව්වක් වත් නිදහසේ දාන්න පුළුවන් ද? '' ඒක තමයි අපේ මූලික තර්කය වුණේ. එහෙමයි කියලා බජව් නො දාපු මහත්තුරු ටිකක් නම් නෙවෙයි අපේ කට්ටිය. මගේ

පන්තිය 12 Arts 2. වාසනාව වැඩිකමට ම ඒක පප්පන්ගේ රූම් එකට මෙහා පැත්තේ පන්තිය. හැබැයි ඒ ඉස්කෝලේ මං දැකපු ලස්සන ම තැන තමයි කලා අංශයේ පන්ති තිබුණ තැන.

අපේ පන්ති පේළියට ඉස්සරහ, කොරිඩෝ එකට පහළින් ලොකු මැද මිදුලක් තිබුණා. ඒකට අපි කිව්වේ කොඩ්ඩෑංගල් එක කියලා. එතන කොළ ම කොළ පාටින් තණ කොළ වවලා පිළිවෙළකට තිබුණා. කොඩ්ඩෑංගල් එකට බහින්න අපි කාටත් තහනම්. ඒකට බහින්නේ පප්පලයි, වැරදි කරලා අහු වුණ අයට දඬුවම් දෙන්නයි, එහෙමත් නැත්තං ක්‍රිකට් ටීම් එක හරි රගර් ටීම් එක හරි මැච් එකකට යන්න කලින් චියර් කරන්න වගේ දේකට. කවුරුවත් කොඩ්ඩෑංගල් එකට බහින්නෙ නම් නෑ. කොඩ්ඩෑංගල් එකට යන්න වෙන තරම් වැරැද්දක් කරන්න ළමයි කොහොමත් බය වුණා. එතන දෙන දඬුවම් ටිකක් සැර වැඩි යි. රූපියලේ කාසියකින් කොඩ්ඩෑංගල් එකේ දුර මනින්න වගේ දඬුවම් එපා වෙන මට්ටමේ ඒවා වෙන්නේ අමාරුවෙන් මැනගෙන ගියත් ''ගාණ වැරදියි. ආයෙ  ම මැනගෙන එන්න'' කියලා කිව්වහම යි. අනික හැමෝට ම පේන නිසා ලැජ්ජාව විතරක් නෙවෙයි, ප්‍රින්සිපල් සර් ඒ හරියෙන් යද්දි දැක්කොත් ලැබුණු දඬුවමට අමතර ව වේවැල් පාරක රසත් බලන්න පුළුවන් වෙනවා නො වැරදී ම.

කොහොම හරි එදා සිකුරාදා දවසක් කියලා නම් මතක යි. ඒකට හේතුව නම් අපේ පන්තියේ අපිට ඉස්ලාම් භක්තික යාළුවෙක් හිටපු නිසා එයාට පල්ලි යන්න ඉස්කෝලෙන් වේලාසනින් යන්න ඕනි කියලා තිබුණ නිස යි. එදා අපේ පන්තියට තමයි උදේටයි දවල්ටයි ඉස්කෝලේ බුද්ධ මන්දිරයට බුද්ධ පූජාව තියන්නයි, ස්වාමීන් වහන්සේලාට දානය පූජා කරන්නයි බාර වෙලා තිබුණේ. මම එදා දානෙ කැවිලිවලට අරං ගියේ කොණ්ඩ කැවුම්. අපි උදේ ම ගිහින් බුද්ධ පූජාව තියලා පන්ති කාමරයට එද්දි ම පළමුවෙනි පීරියඩ් එක පටන් ගන්න බෙල් එක වැදෙන්න ගත්තා. මටයි මගේ යාළුවෝ ගැන්සියටයි උදේ ම පීරියඩ් දෙක තිබුණේ දේශපාලන විද්‍යාව. ඒ විෂයට අපි එහා පන්තියට යන්න ඕනි නිසා පොත් ටිකත් අරන්, බුද්ධ පූජාවට අමතර ව අම්මා ගෙනියන්න දුන්න

කැවුම් ගෙඩියක් කඩාගෙන කට්ටිය එක්ක කටේ දාගෙන අපි එහා පන්තියට ගිහින් වාඩි වුණා.

''ආයුබෝවන් ළමායි...''

සර් පන්තියට එන ගමන් කියාගෙන ම ආපු නිසාත්, අපේ කට්ටියත් වෙන වෙන කතාවල හිටපු නිසාත් කලබලේට ''දඩාස්'' ගාලා ඩෙස් පුටු පෙරළ ගන්නෙ නැතුව නැගිට ගත්තේ කට්ටිය ම බොහොම අමාරුවෙන්. සර් අපිට වාඩි වෙන්න කියලා අතින් සංඥුවක් දීලා ගුරු පුටුව පස්සට ඇදලා අරන් සර්ත් වාඩි වුණා.

''අද පාඩමක් කරන්නේ නෑ ළමයි. ඔයාලගේ පොත් අරන් එන්න බලන්න. නෝට් ටිකයි, පෙරේදා දුන්න හෝම් වර්ක් එකයි පේළියෙන් පේළිය අරන් එන්න බලන්න ''

එහෙම කියලා සර් එයාගේ කණ්ණාඩි කුට්ටම දාගෙන, රතු පෑනකුත් අතට අරන් පළමුවෙනි පෝළිමේ කෙළවරේ හිටපු ළමයට එන්න කියලා අතින් සංඥුවක් දුන්නා.

''ඔය කෙළියේ තාප්පෙට. හෙට පොත් බලනවා කියලා කලින් දවසේ කිව්වා නම් සැර්ලගේ පඩියෙන් අඩු වෙනව ද බං''

මට එහා පැත්තේ හිටපු සුදේශ් හෙමීට කිව්වේ එයාගෙ පොතේ හෝම් වර්ක් එකට අතවත් තියලා නැති එක ගැන මතක් වෙලයි. සුදේශ් එහෙම කිව්වහමයි මටත් මතක් වුණේ මගේ පොතෙත් දවස් දෙකක නෝට්ස් අඩුයි කියලා. අපි හිටියේ තුන්වෙනි පේළියේ නිසා සර් අපේ පොත් බලන්න කලින් ටිකක් හරි සම්පූර්ණ කරගන්න වෙලාව තියෙන නිසා යාළුවෙක්ගෙන් පොතක් ඉල්ලගෙන මමත් අඩුපාඩු නෝට්ස් ටික සම්පූර්ණ කරන්න පටන් ගත්තා.

''කවුද මේක එව්වේ? එවපු කෙනා ඉදිරිපත් වෙන්න, එහෙම නැත්නම් මේක එවනවා දැකපු කෙනෙක් ඉන්නවා නම් කවුද කරේ කියලා කිව්වොත් හොඳයි... ''

එකපාරට ම සර්ගේ කෑ ගැහිල්ලට මමත් ලිවිල්ල නවත්තලා ඒ දිහා බැලුවා. සර්ගෙ අතේ කඩදාසි රොකට් එකක් තිබුණා. සර් ගුරු පුටුවෙන් නැගිටලා කණ්ණාඩි කුට්ටමත් ගලවලා මේසය උඩින් තියලා තීරණාත්මක බැල්මකින් මුළු පන්තිය දිහා ම බලාගෙන හිටියේ හරිම කේන්තියෙන්. පොත පෙන්න පෙන්න හිටපු රොෂානුත් අන්දුන් කුන්දුන් වෙලා වගේ සර්ට මෙහා පැත්තෙන් අත් දෙකත් පිටිපස්සට බැඳගෙන බලාගෙන හිටියා. රොකට් එකක් යවලා කියලා නම් තේරුම් ගියාට වෙච්ච සිද්ධිය හරියට ම දැනගන්න ඕනි නිසා මං එහා පැත්තේ හිටපු සුදේශ්ට තට්ටුවක් දාලා හෙමීට ඇහුවා.

''මොකෝ බං වුණේ ?''

''පිටිපස්සෙ එවුන් ටික රොකට් එකක් යවලා බං. ඒක ෆෑන් එකේ වැදිලා ගිහින් සර් බල බල හිටපු රොෂාන්ගෙ පොත උඩට වැටිලා. ඔක්කෝට ම හපන් බං මුං ඒකේ ''දැවාස් එයාර් ලයින්'' කියලා ලියලා තිබිලා. මුං ඉතිං ඉල්ලගෙන පශ්චාත් භාගේ මාමයිට් ගාගන්නවනේ''

සුදේශ් දත් ටික වත් හොල්ලන්නේ නැතුව කට තද කරන් කියාගෙන ගිය ටික තේරුම් ගන්න මට අමාරු වුණේ නෑ.

''අප්පටසිරි කිච්ච ලූ. දැන් ඉතින් ඉවරයිනේ පුතේ.''

මමත් සුදේශ්ට හෙමීට කිව්වා. රොකට් එකට නම් ඔච්චර කේන්ති යන්න විදිහක් නැති වුනත්, ලියලා තියෙන වචනෙ නිසා නම් ගැලවීමක් නැති වෙයි කියලා නම් මට තේරුණා.

''දැවා'' කියලා අපි අන්වර්ථ නාමයෙන් හඳුන්වන්නේ සමරනායක සර්ට ම යි. ඒකට හේතුව නම් ඉතින් සර් කොයි වෙලෙත් කතා කරද්දි ''දැවා, දැව ද?'' කියලා වැඩියෙන් ඒ වචනෙ භාවිත කරන නිස යි. සර් ගාල්ල මාතර පැත්තේ නිසා එහෙ තියෙන ප්‍රාදේශීය ව්‍යවහාර හුරුව නිසයි එහෙම කතා කරන්නේ කියලා සර් ම දවසක් අපිට කියලා තියෙනවා. ඒ නිසා සර්ට ළමයි ''දැවා'' කියලා කියනවා කියලත් සර් දැනගෙන හිටියා.

''කියනවද? නැද්ද? කවුද මේක එව්වේ? කොඩ්ඩුෑංගල් දැවට පස්සෙ මට මොකුත් කියන්න එපා ''

සර් දෙවෙනි පාරටත් කෑ ගැහුවා. ඒත් මුළු පන්තිය ම මීයට පිම්බා වගේ හරිම නිස්සද්ද යි. එක එක්කෙනා හොරෙන් හොරෙන් අනික් අයගේ මූණු බලනවා මිසක් කිසි කෙනෙක් කටක් හොල්ලන්නේ නැතුව හිටිය නිසා සර් බැරි ම තැන පේළියෙන් පේළියට අහන්න ගත්තා. ''දන්නේ නෑ කියන'' උත්තරේ ඇරෙන්න වෙන කිසිම උත්තරයක් ලැබුණේ නැති නිසා සර්ගේ කේන්තියේ සීමාව පැන්නා.

''ඉඳිල්ලකෝ එහෙනම් මම කරපු එකා හොයාගන්න...''

හොඳට ම කේන්තියෙන් සර් පන්තියෙන් එළියට ගිහින් ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තට යනවා පෙනුණ නිසා ඒ ලැබුණු ඉඩෙන් පන්තියේ ලොකු කසුකුසුවක් පටන් ගත්තා. ඒත් අපිත් ඒ වෙද්දිත් දන්නේ නෑ කවුද ඒක කළේ කියලා. ටික වෙලාවකින් කට්ටියගේ කසුකුසුව නැවතුණා සර් එනවා දැකලා. සර් පප්පලා (ප්‍රිෆෙක්ට්ස්ලා) දෙන්නෙකුත් එක්කගෙනයි ආවේ.

''පුතාලා මුන් ටික කොඩ්ඩුෑංගල් දාන්න. කවුද මේ වැඩේ කරේ කියලා හොයාගෙන ඒ පෝරිසාදයා ව මගෙ ළඟට අරන් එන්න. මේකලා එකෙක් වත් උත්තර දෙන්නේ නෑ''

සර් එක දිගට කියාගෙන ගියේ නිකං අපරාද කල්ලියක් අල්ලගෙන පොලීසියට ප්‍රශ්න කරන්න බාර දෙන්න වගේ. එහෙම කියලා සර් ගුරු මේසෙ ළඟට ගිහින් සර්ගෙ කණ්ණාඩි කුට්ටම බෑග් එකට දාගෙන ''බලපු නැති පොත් ටික සබ්ජෙක්ට් මොනිටර් අතේ ස්ටාෆ් රූම් එකට එවන්න'' කියලා පන්තියෙන් එළියට ගියා.

''ආ... මල්ලිලා ටික යමු එහෙනම්. එහා කෙළවරේ පඩිපෙළින් බැහැගෙන ඇවිත් කොඩ්ඩුෑංගල් එක මැද්දෙන් පේළියට හිටගන්න.''

ආපු අයියලා දෙන්නාගෙන් එක්කෙනෙක් එහෙම කියලා අපි ව පන්තියෙන් එළියට ගත්තා. අපි පේළියට එතැනට

යනකොටත් එකොළහ වසරෙ විතර මල්ලි කෙනෙක් අව්වේ හිටග න්න දාලා තිබ්බා. මිනිහා ටිකක් නටනවා වගෙ දැකපු නිසා මම ඒ පැත්ත පොඞ්ඩක් බැලුවා. හෙඩ් සෙට් එකක් විතරක් කනේ ගහගෙන සින්දු අහනවා වගෙ රඟපාන්න දීලා. අනිවාර්යයෙන් හොරෙන් ෆෝන් එකක් ගෙනත් සින්දු අහනකොට අහුවෙලා ද කොහෙද. ඒ වගේ වැරැද්දකට සාමාන්‍යයෙන් ඔහොම දඬුවමක් තමයි ලැබෙන්නේ. දැන් ඉතින් රොකට් එකකින් පේළියට හලාගෙන ගියපු බෝම්බ කැලි ටිකක් වගේ අපිත් හිටගෙන හිටියා.

උදේ පාන්දර ම පළමුවැනි පීරියඞ් එකේ ම මැද මිදුලෙ අව්ව තපින එක ගැන සුදේශ් කිව්වේ ''කමක් නෑ බං, විටමින් ඞී හරි ලැබෙනවනෙ'' කියලා.

''අනේ ඔව් බං. වාසනාවට වගේ ආදරණීය ප්‍රින්සිපල් සර් ආවොතින් කට්ටියටම ''ඒ'' අකුරේ ඉඳන් ''ඉසෙඞ්'' වෙනකම් ම විටමින් ලැබෙයි පුතේ.'' කියලා මං සුදේශයට උත්තර දුන්නා.

දෙවෙනි පීරියඞ් එක ඉවර වෙන බෙල් එක වැදිලා ටික වෙලාවකින් පප්පලා හතර දෙනෙක් අපි ඉන්න තැනට ආවා.

''මේ වැඩේ කළේ කවුද කියලා දැන්ම කිව්වොතින් පන්තිවලට යන්න පුළුවන්. නැත්තන් මල්ලි ඔයාලා කොයි මොහොතේ හරි කියනකන් හවස් වෙනකම් වුණත් අපිට ඔයාලට මෙතන ඉන්න දෙන්න පුළුවන්.''

අපි ඉන්න තැනට ආපු පප්පලා හතර දෙනාගෙන් එක අයියා කෙනෙක් එහෙම කියලා, එයාලා අපි ඉස්සරහින් හිට ගත්තා.

''අඩුම තරමේ මේක කරපු එකා ඉදිරිපත් වෙයන්. උඹ හින්දා උඹේ යාළුවෝ පනිෂ්මන්ට් කනවා පේන්නේ නැද්ද?''

එහෙම අහලා අයියලා ටික වෙලාවක් බලන් හිටියා. අපේ කවුරුවත් වචනයක්වත් පිට කළේ නැති නිසා අපිට එහා පැත්තෙන් උදේ ඉඳන් බොරුවට සින්දු අහන මල්ලි ව පන්තියට යවලා, අයියලත් ප්‍රිෆෙක්ට් රූම් එකට ගියා. ඒත් එක්ක ම කොරිඩෝ

එකේ මෙහා කෙළවරෙන් සමරනායක සර් අපි දිහා බලන්නෙවත් නැතුව එනවා පෙනුණා. අනික් පැත්තෙන් අපේ පන්තිභාර මිස් කොරිඩෝ එකෙන් ඇවිත් අපි ඉන්න හරියෙන් නතර වුණා. අපේ මිස් අපි දිහා බලන් ඉන්නවා දැකලා සමරනායක සර් ඇවිත් මිස්ට විස්තරේ කියනවා පෙනුණා. අපි හිතුවේ දැන් බුද්ධ පූජාවටත් යන්න ඕනි නිසා මිස් සර්ට කියලා අපි ව බේරගනී කියලා. මිස් අපි දිහා බලලා සර් එක්ක කතාව ඉවර කරලා අපේ පන්තියට ගිහින් වෙනත් විෂයන්වලට ගිහින් ආපු ළමයි ටිකත් එක්ක බුද්ධ පූජාව අරන් යනවා දැකපු හර්ශ, ''මිසුත් අපිට එහෙම කොළා එහෙනම්.'' කියලා කියනවා ඇහුණා. සමරනායක සර්ත් අපි දිහා නො බලා ම 13 වසරේ පන්තියකට යනවා පෙනුණා. සුදේශ් කිව්ව විටමින් ඕ එක ඩබල් වෙලා ලැබෙන බව තේරුණේ ඔළුවේ ඉදන් දාඩිය බේරෙන්න ගත්ත වෙලාවෙදි යි.

විවේක කාලය ඉවර වෙලා දෙවෙනි පාරට නම් ලකුණු කරන්න ළමයි ටික බලාගන්න ද කොහෙද මිස් ඇවිත් ළමයි ටික ගණන් කරගෙන ගියා. කොහොම හරි දොළහට කලින් අලීට පල්ලි යන්න ඕනි නිසා එයා ටිකක් කලබල කළා. අයියලත් එතනට ඇවිල්ලා අලීගේ පල්ලි යෑම පිටින් දාලා වැරදිකාරයා අල්ල ගන්න හදපු උත්සාහය වැරදුණු නිසාත්, පන්තියේ හැමෝ ම වැරදිකාරයා අලී නෙවෙයි කියලා පිළිගත්ත නිසාත් අලියට එතනින් නිදහස් වෙලා පල්ලි යන්න දුන්නා. කවුරුවත් මොකුත් නො කියන නිසා අයියලා ළමයි එක එක්කෙනාගෙන් වෙන වෙනම ප්‍රශ්න කරන්නත්, ඒ ගමන් ම රැවුල්, කොණ්ඩ වගේ ම ඇඳුම්වල අඩුපාඩුත් හොයන්න පටන් ගත්තා.

''මල්ලී උඹ ද මේ වැඩේ කළේ? උඹ නම් කළේ පිළිගනින්. යාළුවෝ ඔක්කොම අමාරුවෙන් ඉන්නේ.''

මගේ ඉස්සරහට ආපු අයියා කෙනෙක් ඇහුවා.

''නෑ අයියේ මම කළේ නෑ'' මම එහෙම්ම ම උත්තර දුන්නා.

''උඹ එහෙනම් කරපු එකා ව දැක්කනේ. ඒක වත් කියපන්. බලපන් දැන් කොච්චර වෙලා මෙතන ද?''

''නෑ අයියේ. මම දැක්කේ නෑ. සර් අපේ පොත් බලන්න ගත්ත නිසා මම මගේ පොතේ තිබ්බ නෝට් කම්ප්ලීට් කර කර හිටියේ. ඒ නිසා මම දැක්කේ නෑ අයියේ.''

මම සිද්ධිය නො දකින්න හේතුවත් එක්ක ම උත්තර දුන්න නිසා ඒ අයියා වෙන ළමයෙක් ළඟට ගියා. ඔය විදිහට අහගෙන යනකොට හැමෝම ''දන්නේ නෑ'' ''දැක්කේ නෑ'' වගේ උත්තර කියනවා ඇහුණා.

''අයියේ මම රොකට් එක යවපු කෙනා ව නම් දැක්කේ නෑ. හැබැයි රොකට් එක යන සද්දේ නම් ඇහුණා''

අපි හැමෝ ම ඒ කතාව ඇහුණු පැත්ත බැලුවා. ''කවුද බං ඒ බොරුව කියපු එකා?'' එහෙම අහගෙන අනික් අයියලත් ඒ පැත්තට කිට්ටු වුණා. අයියලා හැමෝම හිනා වෙනවා හොඳට ම. අපිත් බොහොම අමාරුවෙන් හිනාව තද කරන් හිටියා. ඒ කතාව කියලා තියෙන්නේ අපේ එහා පන්තියේ හිටපු අංජන. මනුස්සයා ටිකක් කලබල වුණා ම කියන දේ පටලවගෙනයි කතා කරන්නේ.

''ඒ මල්ලි චුට්ටක් ඉස්සරහට එන්නකෝ.'' අයියා කෙනෙක් අංජනට ඉස්සරහට කතා කළා. අංජනත් ඒ එක්ක ම අඩි දෙකක් විතර ඉස්සරහට ගියා.

''කියපන් මල්ලි. උඹට කොහොම ද කඩදාසි රොකට් එකක් යන සද්දයක් ඇහුණෙ? එහෙම අහපු අයිය ම රොකට් එකක වගේ සද්දයක් කටින් දාලා; ''ඒ වගේ ද මල්ලි?'' කියලා අහලා හිනා වුණා.

තවත් අයියා කෙනෙක් ඇහුවේ ''නැත්තම් මල්ලී, බෲම් බෲම්... පීක් පීක්... ගෑව ද?'' එහෙම අහලා ආයෙමත් ඔක්කොම කට්ටිය හිනා වුණා.

''නෑ අයියේ. මම කිව්වේ ඒක ෆෑන් එකේ වැදිලයි සර් ගාවට ගියේ. ෆෑන් එකේ වදින සද්දෙයි මට ඇහුණේ. ''

අංජන බොහොම අමාරුවෙන් කියාගත්තා. ''උඹලා ඔක්කොම සිද්ධිය වෙච්ච විදිහ දැකලා. හැබැයි යවපු කෙනාව විතරයි දැකලා නැත්තේ. හරි හරි යනවා ආපහු පේළියට.'' අයියා කෙනෙක් එහෙම කියලා අංජන ව ආපහු පේළියට එව්වා.

ඊට පස්සේ පේළියේ ප්‍රශ්න කරපු නැති අය ගාවට අයියලා ගිහින් ආයෙත් ප්‍රශ්න කරන්න පටන් ගත්තා. පේළියේ කෙළවරේ රවීන් කියලා අලුතෙන් ආපු ළමයෙක් හිටියා. රවීන් වෙන ඉස්කෝලෙක ඉදලා එදා උදේ තමයි ඇවිල්ලා අපේ පන්තියට එයාව අම්මලා භාර දීලා ගියේ. කරුමේ තරම කියන්නේ මිනිහගෙ පළමුවෙනි පීරියඩ් එකේ ම අකරතැබ්බෙකට මූණ දෙන්න සිද්ධ වුණා. අයියලා රවීන් ළඟට ගිහින් ප්‍රශ්න කරද්දි මිනිහා එදයි ඉස්කෝලෙට ආවේ කියලා දැනගෙන රවීන් ව ටිකක් ඈතට අරගෙන ගියා. අයියලා හැමෝම වට වෙලා රවීන්ගෙන් ප්‍රශ්න කරනවා අපිට පෙනුණා. අපේ කට්ටියත් කිසිම සද්ද බද්දයක් නැතුව සිද්ධ වෙන්නේ මොකද්ද කියලා බලාගෙන හිටියා. රවීන් හොඳට ම බය වෙලා, අඬන්න වගේ කඳුළු පිරිච්ච මූණකින් අපේ පේළිය දිහා බලලා පේළියේ මැදට වෙන්න හිටපු නිලුපුල් ව පෙන්නුවා. අයියලා ඇවිත් නිලුපුල්වත් අරගෙන ගිහින් වෙනම ම ප්‍රශ්න කරන්න ගත්තා. ටික වෙලාවෙකින් නිලුපුල්ට ටිකක් සැරෙන් බනින විදිහක් අපිට පෙනුණා. එතනින් අපේ පේළිය පැත්තට ආපු අයියා කෙනෙක් ''ආ දැන් පන්තිවලට යනවලා කට්ටිය ම. තව දෙයක්, හැමෝම ගිහින් සමරනායක සර්ගෙන් සමාව ගන්නෝනි අනිවාර්යයෙන්.'' එහෙම කියලා නිලුපුල් ව ප්‍රශ්න කරන්න ගෙනියපු තැනට ආපහු ගියා. අපිත් මිටින් හල කුරුල්ලෝ වගේ එතනින් අතුරුදන් වුණා.

අපි පන්තියට යන්න කලින් ටැප් එක ළඟට ගිහින් වතුර ටිකක් එහෙම බීලා පන්තියට යද්දි අනික් අය කතා වෙද්දි තමයි මමත් දැනගත්තේ නිලුපුල් තමයි වැඩේ කළේ කියලා. කොහොම හරි අපි පන්තියට යද්දි රවීන් පන්තියේ වාඩි වෙලා හිටියා. අපි කට්ටිය ගිහින් රවීන් ව වට කර ගත්තා. රවීන් ආයෙත් බයවෙලා වගේ අපි දිහා බලද්දි හර්ශ ඇහුවා ''අයියලා මොනාද උඹට කිව්වේ කියලා.''

''මම අදයි ඉස්කෝලෙට ආවෙ කියලා කිව්වහම අයියලා මම ඉස්කෝලෙට ඇවිත් පැයක් යන්නත් කලින් කම්ප්ලේන් එකක් තියෙනවා කියලා ප්‍රින්සිපල් සර් ගාවට එක්කන් යනවා කිව්වා. ඊට පස්සේ සර් අම්මලාට කතා කරලා මාව ආයෙත් අස් කරන් යන්න කියාවි කියලා කිව්ව නිසා මම බයට ම කවුද කළේ කියලා කිව්වා.''

රවීන් අඬන්න ඔන්න මෙන්න වගේ මූණ හදාගෙන කියාගෙන කියාගෙන ගියා.

''එතකොට උඹ කොහොමද දන්නේ රොකට් එක යැව්වේ නිලුපුල් කියලා?'' සුදේශ් රවීන්ගෙන් ඇහුවා. නිලුපුල් ඒක යවනවා රවීන් දැක්ක බව රවීන් අපිට කිව්වා. ආපු පළමුවෙනි දවසෙ ම මිනිහට වෙච්ච සිද්ධිය නිසා අපිට රවීන් ගැන දුකත් හිතුණා. අපි රවීන්ට ''ඔච්චා ගණන් ගන්න එපා බන්.'' කියලා පිටට තට්ටුවකුත් දාලා ඇවිත් අපේ පුටුවල අපි වාඩි වුණා. හැමෝම නිලුපුල්ට බැන්නේ කට්ටිය අර තරම් කට්ටක් කද්දිවත් ඉදිරිපත් වෙන්න කොන්දක් නො තිබ්බ එක ගැන කියල යි. පාවා දුන්නා කියලා රවීන්ට බනින්න කවුරුත් ආවේ නැත්තේ වෙලාවේ හැටියට මිනිහ වැටුණ අමාරුවේ තරම තේරුණ නිස යි. නිලුපුල්ට නම් ප්‍රින්සිපල් සර්ගෙන් හොඳ කෑමක් ලැබිලා කියලා නම් ඇඹරි ඇඹරි, තැලිච්ච කජු ලෙල්ල වගේ මූණත් හදාගෙන පන්තියට ආපු විදිහෙන් තේරුණා.

සමරනායක සර් අපේ පොත් බලලා එහා පන්තියට එවලා කියලා ලැබුණ පණිවිඩය නිසා මමයි සුදේශයයි එහා පන්තියට ගියේ අපේ පොත් අරන් එන්න. එතන ගුරු මෙසේ උඩ එතකොටත් අර රොකට් එක තිබුණා. ''දැවා ස් එයාර් ලයින්'' රතු පාට පෑනකින් ඒ රොකට් එකේ ලියලා තිබ්බා. මම ඒක අරන් සාක්කුවේ දාගෙන ගෙදර අරන් ආවා. අදටත් ඒක මං ගාව පරෙස්සමට තියෙනවා, බොහොම සුන්දර මතකයක් විදිහට.

**ජී. ඒ. අමිල නුවන් ශ්‍රී ශාන්**
**මානවවිද්‍යා අධ්‍යයනාංශය**

# නෙළුමක් (නො) වෙමි

අනේ හිමියනි පාට නැතුවට මමත් නෙළුමක් ඉස්සර
වනේ හැංගී මඩේ පිපුණත් මඩ නොගැවී ඉස්සුණ
බණේ වපුරන එවුන් වූවත් මිනිස් වේසෙන් හිස් වුණ
දනේ නාමෙන් විකිණුනා තරගෙට පුදසුනක බිම පස්වුණ

දැමුණු වෙස්ගත් මිනිස් පහසින් නටු අගින් මල ගැලවුණේ
හැංගිලා තිබු පෙති එකින් එක බලෙන් පුප්පා එළි වුණේ
එක වරයි පෙති ඇරෙන්නේ හිත නිවන් යන්නට සැරසුණේ
අනේ හිමියනි නොදන්නාකම නිසයි නෙළුමට වැරදුණේ

නම නොදන්නා දෙවි කෙනෙක් ළඟ උදේ වරුවේ සැතපුණා
මහා බල ඇති ලොකු ගහක් යට හවස් වරුවේ මිරිකුණා
හෙට උදේටත් ගන්න හින්දා පැන් කළේ තුළ හිරවුණා
පෙති හැලෙද්දිත් ආයේ ආයේ කාසිවලටම විකිණුනා

ගාට ගාටා නොකර බැරිවට මල් අසුන් වෙත ඇදුණට
දාට සමහර අඬද්දි පිනි වගේ එළියට පෙනුණට
කාටවත් මගෙ දුක දැනුණෙ නෑ කෝ නොගන් හිමි ඇහුවට
පාට හේදුණු නෙළුම් මලකට නිවන් යන්නට අකැපද

**ශේන්යා ප්‍රනාන්දු**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**

# ලියුම් කඩදාසිය

ආදරණීය අම්මේ,

අම්මාගේත්, නංගිගේත්, මල්ලිගෙත් සැප සනීප කොහොමද කියලා අහලා මේ ලියුම පටන් ගන්න බෑ මට. අපේ ගෙදර ජීවිතය හැමදාම දුක් කරදරවලින් පිරිල තියෙන වග හොඳටම දැනගෙන කොහොමද මං එහෙම අහන්නේ !

තාත්තා මියැදුණාට පස්සේ බොහෝ දුක් දොම්නස් නිකං අකාරුණික වර්ෂාවක් වගේ අපේ ගෙපැලට කඩාවැටුණු වග මට රහසක් වුණේ නැහැ අම්මේ. තාත්තගේ හත් දවසේ දානෙ ඉවර වෙලා ආයෙත් මේ පන්සල හතර මායිමට එන්න මගේ හිතේ අඹ මල් රේණුවක තරම්වත් මනාපයක් තිබුණේ නැත්තේ ඒකයි.

ඒත්, එදා අම්මගේ ඇස් ගෙඩිවලින් ගලාගෙන ගිය කඳුළු ගංගාව මාව ආයෙත් පන්සලට පා කරලා එව්වේ හරියට "හබල් බිඳුණු ඔරුවක් ආයෙත් ගොඩ සුළඟට ගහගෙන එනවා වගේ " මං එදා ආයේ මේ ගමන ආවේ තාත්තා ගැන වියෝ දුකින් තෙහෙට්ටු වුණු අම්මාගේ හිත තවත් පාරවන්න බැරි නිසා මිසක් කැමැත්තට නම් නොවේ.

අම්මාගේ ලොකු පුතා පන්සලේ පුංචි සාමණේර කෙනෙක් වෙච්ච දවස අම්මට කොහොමටවත් අමතක වෙන්න බෑ. මටත් අද වගේම මතක තියෙනවා. එදා අම්මගේත් තාත්තාගේත් හිත් පිනාගියේ හතර වර්ගයම නිවන් දක්වන්නයි කියන මහා පින්කමක් සිද්ධ කරපු හින්දාම නොවෙයි. තාත්තා දුක් මහන්සියෙන් හම්බ

කරන සොච්චම දිහාවට ඇරිලා තිබුණු තවත් කටක් අඩුවෙන හින්දා කියලා කිව්වොත් මුසාවක් වෙන්න බෑ කීයටවත්.

මං මහණ වෙන්න දවස් ගානකට ඉස්සෙල්ල දවසක් අම්මා දොරකඩ ළඟ ගෙපිලේ ඉදගෙන මාව උකුලෙ තියාගෙන ඔලුව අතගාමින් අන්දකාර හිස් අහස දිහා බලාගෙන කියපු දේවල් මට අද වගේ මතකයි. උඹ මහණ වුණාම පුතේ...... මේ වගේ නෙවෙයි. උඹට හොඳට කන්න බොන්න හම්බ වෙයි. ඔය බණකට පිරිතකට වැඩියම පිරිකර එහෙමත් ලැබෙයි. එතකොට මේ නංගිටයි මල්ලිටයි උගන්න ගන්න පුළුවන්.

මං මහණකමට කැමති කරවා ගන්න අම්මා ඒ වගේ කොයිතරම් දේවල් කියන්නට ඇද්ද? ඒ හැම දෙයකම තිබුණේ හෙට දවස ගැන බලාපොරොත්තුවක් බව මම දන්නවා. මුදල් හදල් අතින්, කෑම බීම අතින් ඇත්තටම වැටිලා හිටපු අම්මලාට එහෙම හිතන්න සිද්ධ වෙලා තිබුණා.

සමහරවිට අම්මා වචනවලින් නොකිව්වට කවදාහරි දවසක අම්මාගේ පොඩි සාදු, ලොකු හාමුදුරුවෝ නමක් වෙලා සැප පහසු රියක යන එන එක ගැන අම්මා අනන්ත ප්‍රමාණයෙන් හීන දකින්න ඇති. ඒ වුණාට මම මහණ වෙන්න සිතුවේ ඒ කිසිදෙයක් හන්ද නොවෙයි. අහිංසක තාත්තාගේ පිටේ තිබුණු බරට තවත් බරක් වෙන්න බැරි හින්දා.

මං මහණ කරපු දවස්වල පන්සලට කිසිම දානයක් නොලැබිච්ච වෙලාවල් අනන්තයි. ඒත් අම්මා මට කීවේ බොරු කියලා මම ඒ වෙලාවට හිතුවා. එහෙම දවස්වල වැඩියෙන්ම අපි ගත කෙරුවේ බඩගින්නෙන්. ගෙදරදි නම් ඒ වගේ වෙලාවට කොස් මදුලක් හරි තම්බලා දුන්නු අම්මව මට මතක් වුණා බඩගින්න වැඩි කමට.

මේ පන්සලට අයිති කුඹුරු වතුපිටි අක්කර ගණන් තිබුණත් ඒවාගෙන් ලැබෙන වී හාල් පොල් අල්ලන්න තරම් අවසර අපට තිබුණේ නැහැ. ඒ දවස්වල පන්සලේ හිටපු පස් හය නමටම පාන් රාත්තලක් විතරයි ලැබුණේ.

අපි හැමෝම වේලිච්ච පාත් ලෙල්ලෙන් තොල තෙමා ගන්නකොට ලොකු හාමුදුරුවන්ගේ කුටියෙන් “milk powder" සුවඳ හැමුවා අපූරුවට.

ඒත් ඒ දවස්වල වගේ නොවෙයි දැන් අම්මේ. දාන ගෙවල්, පින්කම් ගෙවල් වැහි වැහැලා. ඒ වගේම පන්සල්ට ගොඩක් දවස්වලට දාන දෙක තුන ලැබෙනවා.

අම්මා එදා මට කිව්වේ ඇත්ත කියලා අද මට හිතෙනවා. බලු කපුටන්ට කාල ඉවර කරන්න බැරි තරම් කෑම කන්දරාවක් කසළ ගොඩට එක් වෙනවා දවස ගානේ. මට ඒ වෙලාවට අම්මාත්, නංගීත් මල්ලීත් මතක් වෙනවා ඉබේටම. මේ ගමේ එදා වේල කන්න නැතිව දුප්පත් මිනිස්සු කොච්චර හිටියත් ඒ දානෙ ටිකක් කන්න පන්සලට ගොඩ වෙන්නේ නෑ කොල්ලො කුරුට්ටෙක්වත්. ඒවා සාංඝික දේවල් කියලා මිනිස්සු බයයි භුක්ති විඳින්න.

ඉස්සරට වැඩිය දැන් දැන් දානය වැඩියෙන් ලැබෙන්නේ පින්කම් වැඩියෙන් කෙරෙන්නේ මිනිසුන්ගේ ශ්‍රද්ධාව වැඩි වෙලාවත්, ගොවියන්ගේ ගොවිතැන් සාරෙට හරි ගිහිල්ලවත්, කම්කරුවන්ගේ පඩි වැඩි වෙලාවත් නම් නොවෙයි. ඉස්සරට වැඩිය දැන් මිනිස්සු මැරෙනවා වැඩියි. එක ගමක දවසකට මළ ගෙවල් දෙක තුනයි. සුළි සුළං, ගං වතුර, නාය යෑම්, වෙඩි තැබීම්, කඩුවලින් දිවි හානි කර ගැනීම්, හදිසි අනතුරු වගේ දේවල්වලින් මිනිස්සු ජීවිතයට වැඩියෙන් මරණයට ළං වෙනවා.

පාංශුකූල, තුන් මහේ දාන, අවුරුද්දේ දානේ ගෙවල් අතරතුරේ සල්ලි භාගෙ වැඩි අය කිසි හේතුවක් නැතුවත් විශාල දාන පින්කම් කරනවා නම්බුව තත්ත්වය රැක ගන්න. කෑම බීම විතරක් නොවෙයි දැන් හැමෝටම පිරිකර අතේ බරට ලැබෙනවා. ඒත් ඒ දායකයන් අපේ අතට පූජා කරන තුවා, සුදු රෙදි, සබන්, ඇඳ ඇතිරිලි වගේ දේවල් අතේ රැඳෙන්නේ පින්කම් ගෙදර ඉඳලා පන්සලට එනකම් විතරයි. ඉන්පස්සෙ ඒවා “නාස්ති නොකර ටික ටික ප්‍රයෝජනයට ගන්න කියලා" ලොකු හාමුදුරුවෝ උන් වහන්සේගේ පෙට්ටගමේ තැන්පත් කරනවා. ඒවා අයේ කවදාවත් අපිට නම් දකින්න ලැබෙන්නේ නෑ.

අම්මේ ගමේ පන්සලට ගිහින් පෝයට සිල් ගන්න සුදු රෙදි කෑල්ලක් වත්, බෝධිය වදින කොට වැලි මලුවෙ එලා ගන්න තුවා පොඩ්ඩක්වත්, අම්මා නමින් පූජා කරන්න පුළුවන් කමක් නෑ. අම්මේ... මේ පුංචි සාදුගේ මූණ පිහන තුවායත් ඉරිලා රැලි වෙලා.

ඒත් දුක් වෙන්න එපා අම්මේ... අම්මාවරු දහසක් අතුරින් තමන්ගේ ලේ මස්වලින් හැදිච්ච දරුවන් හතර දෙනා ගෙන් රට ජාතිය වෙනුවෙන් තුන්වෙනි පුතා ශාසනයට පූජා කරන්න පුළුවන් වුණානේ කියල සතුටු වෙන්න. මොකද දැන් අම්මාවරු උදරය නෙරාවි, පියයුරු කඩා හැලේවි, රූපශ්‍රීය නැතිවේවි කියල නම්බුව රැක ගන්න දරුවෙක් දෙන්නෙක් හදනවා.

ලොකු හාමුදුරුවන් වහන්සේගෙන් අලුත් තුවායක් ඉල්ලුවාම උන්වහන්සේ කියන්නේ "ඕක තව ටික කාලයක් පාවිච්චි කරන්න පුළුවන්නේ පොඩිනම කියලා" මට වෙලාවකට හිතෙනවා මේ පන්සලේ ගොඩ ගහ ගෙන ඉන්න හැම දෙයක්ම බලහත්කාරයෙන් අරන් දුප්පත් මිනිසුන්ට බෙදා දෙන්න. ඒක පවුකාර සිතුවිල්ලක් නොවන හින්දා බුදු හාමුදුරුවෝ වුණත් අමනාප නොවේ නේද අම්මා?

අම්මා..... මෙහෙ යන එනකොට දැකලා ඇතිනේ ඉරිච්ච සරමක් ඇඳගෙන බීඩි කොටයකුත් කනේ ගහ ගෙන පන්සල් වත්තේ පොල් කඩන්න එන මනුස්සයා. මිනිහා දැන් තුන් මාසයකට විතර ඉස්සරවෙලා මේ වත්තේ පොල් ගහකින් වැටිලා මියැදුණා. ඒ මනුස්සයාගේ පාංශුකූලෙට පන්සලෙන් දුන්න සුදු රෙදි කෑල්ලටත් ලොකු හාමුදුරුවෝ ඒ පවුලේ අයගෙන් මුදලක් ගත්තා. "කාසි නොගෙන බෑ ඉතින් මේවා සාංඝික දේවල් නොව" ලොකු හාමුදුරුවො එදා කීවේ ඒ විදිහට.

ඒ මනුස්සයාගේ තුන් මාසේ දානය යෙදිලා තිබුණේ මේ පහු වුණු දොහේ. ඒ ගැන පන්සලට දන්වලා තිබුණේ ඒ මිනිස්සු කල් ඇතිවම. බණක් පිරිතක් කියලා දහ පහළොස් නමකට දානයක් පිළිගන්වන තරම් වත්කමක් නැති හින්දා, පන්සලට දහවල් දානය සූදානම් කරගෙන එන්නටයි මේ මිනිස්සු අදහස් කරලා තිබුණේ. ගමේ මුදලාලි කෙනෙකුගේ තවත් දානයක් යෙදිලා තිබුණා එදාටම.

පන්සලේ දෙතුන් නමක් නතර කරලා, ලොකු හාමුදුරුවෝ දනට වඩියි කියලයි අපිනම් හිතුවේ.

"මුදලාලිගේ දානය ගෙදර යන්න සුදානම් වෙන්න කට්ටියම"

ලොකු හාමුදුරුවො අපට දැනුම් දුන්නා. අපි මතක් කරන්න අමතක කළේ නෑ අර දුප්පත් මනුස්සයාගේ දානය ගැන. ඒත්.....

"ඒ වගේ ද පොඩි නම මේ දානගේ. මේකට ගියාම මොන තරම් කෑම බීම තියේවිද? අනික හැම නමකටම අටපිරිකර. අර ගෙදරින් ගේන පොල් සම්බෝලෙයි බතයි වගේද?

ඒවායින් කාරියක් නෑ.... හැමෝම ලෑස්ති වුණොත් හොඳයි ඒ ගමන යන්න"

ලොකු හාමුදුරුවෝ කීවේ ඒ විදියේ කතාවක්. අපි ලොකු හාමුදුරුවන්ගේ සුවච කීකරු ගෝලයෝ හින්දා උන්වහන්සේ පිටුපසින් මුදලාලිගේ දාන ගෙදරට නිශ්ශබ්දව වැඩම කළා.

පන්සලේ හරියටම ඉතිරි වුණේ ඇබිත්ත කොලුවා විතරයි. අර දුප්පත් ගෙදරින් ගෙනාපු දානෙ ගිලලා වූ ඌ මිනිස්සුන්ට හීනෙන්වත් පින් දෙන්න නැතුව ඇති. ඉතින් අම්මේ.... මං මේ හැමදෙයක්ම අම්මට ලියලා එවන්නේ මට කොයි තරම් මේ ජීවිතේ රටාවක් බව අවබෝධ වූවාදැ'යි කියන්න. ඒකෙන් අම්මාගේ හිත රිදුණා නම් සමාවෙන්න.

අම්මේ මම එදා හිතුවේ ලොකු හාමුදුරුවෝ හාමුදුරුවෝ වහන්සේ නමක් වෙලාත් මෙච්චර ඇයි ලෝභ කියලා. දැන් තමා මට තේරෙන්නේ.... කැකිරාව මහවැලි සී කලාපයේ පන්සල් හතළිස් අටටම පොඩි හාමුදුරුවරුන් හතර නමයි. ඉතුරු ඔක්කොම අවුරුදු පනහට වඩා වයසක ලොකු හාමුදුරුවරු. හෙට කෙනෙක් මහණ වෙලා, ඒ පැත්තට ආවොත් පන්සල් දහයකට වඩා ඔප්පු එක්ක දෙන්න තියෙනවා. නමුත් අම්මේ මේ හැම පන්සලකම දැන් හාමුදුරුවරු නෑ. ඔක්කොම පන්සල් අතහැර ගිහිල්ලා.

අපේ පන්සලේ ලොකු හාමුදුරුවෝත් වයසට ගිහිල්ලා අවුරුදු පනහ පැන්නට පස්සේ තමා මහණ වෙලා තියෙන්නෙ. ඒ නිසාම උන්වහන්සේට දහම ගැනවත්, මේ වස්තු සම්භාරය ගැනවත්, අනිත්‍ය ගැනවත් අවබෝධයක් නැතුවයි මට මේ විදිහට සැලකුවේ කියලා අද තේරෙනවා. එදා හාමුදුරුවරු වගේ පොඩි කාලේ සිට ශාසනයේ රැඳුන අය අදත් හිටිය නම් මීට වඩා හොඳ හාමුදුරුවරු හමුවෙන්න තිබුණා. ඒක සමහරවිට රටේ අවාසනාව වෙන්න ඇති අම්මේ....

අම්මා මාව මහණ කරපු දවසේ තාත්තා සොයන සොච්චමට හැරී තියෙන එක කටක් අඩු වෙයි කියලා විතරද හිතුවේ! ඇයි අම්මේ හිතන්න බැරි වුණේ අම්මලා ජීවත් කරන්න තියෙන අත් දෙකකුත් ඒ එක්කම අඩු වෙනවා කියලා. ඔව්.... අම්මේ, මට පුළුවන් තාත්තාගේ අත් දෙකෙන් අපි හැමෝම ජීවත් කළා වගේ අම්මාවයි නංගිවයි ජීවත් කරන්න. තාත්තා කරපු දේවල් භාගයක් හරි කරන්න.

ජීවිතයෙන් පලා ගිහින් මට විතරක් තනියම බුදු වෙන්න ඕනි නෑ අම්මේ.... මගේ ප්‍රාර්ථනාව අපි හැමෝම එක දවසක බුදු වෙන්නයි. එහෙම දවසක් උදා කරගන්න මේ චීවරය දරාගෙන ඉන්නම්. "මේ මහා විශ්වය රටාවක් බව කුඩා කල සිට මා හට කියා දුන් ලොකු හාමුදුරුවන් වහන්සේ වයසට ගොස් පැවිදි වූ නිසා සිල් පුරන්න නොහැකි වුණත්, මා ඇකයෙහි පණ කෙන්ද හෙළුවේ පරණ සිවුරු කඩ දරාගෙන ''කළ සියල්ලම, තැනූ සියල්ලම ආරක්ෂා කර අනාගතයට රැක දෙන්න පොඩි නම කියමින්.....''

ඒ හින්දා..... එදා අම්මාගේ ආශිර්වාදය ලබා ගෙන පොරවා ගත්තු මේ චීවරය ඉදිරියටත් දරා ගෙන, අවසානයේ ඔබ සැමට නිවනේ මඟ පෙන්වන්න ආශිර්වාද කරන්න.

අම්මේ..
මම පොඩි සාදු.

**පූජ්‍ය පෙනලබොඩ ඥාණාලෝක හිමි**
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය**

# සුදු හාමිනේ

හේනේ ගෙදරට නෙළුම් මල නුඹ මටම පමණක් හිමි වෙනා
මගේ ගෙපැලට එළිය දෙන්නට තවත් පහනක් නැත වෙනා
ගමෙන් ලස්සන ටිකක් සෝබන හැඩකාරි වග දන්නවා
හේනේ මාමාට දණින් වැටිලා මම අනේ නුඹ ඉල්ලුවා

දෙපැත්තෙම හරි නාඩගම් වී නුඹව කැන්දන් ආ හැටි
දෑවැද්ද මදි වී සුමානෙන් අම්මා රොස් වී උන් හැටි
ගේ හරියේ පොඩි එකෙක් නෑ තව සතුහරෙන් ආ කෙනෙහිලි
සමන් ගිර මහ පච්ච වාගේ නුඹත් නොසැලී උන් හැටි

අවුරුදුත් තව පස් මසක් දොස් යවා උඹ හිනැහුණු දිනේ
ගොයම ළා දලු නිල ගැහිල තිබුණ හැටි මට මතක නේ
හෙමි හෙමින් රෑ කන අගිස්සට දැම්ම පැණි පොද අගේ නේ
රන් කිරක් කට ගාන්නට මට පින් බොහෝ කළ බව සිතේ

පන්සලේ මහ කරඬුවක් වගේ නුඹ රැක්ක හැටි මං දනී
නුඹත් පාරමිතා පුරන්නැති නව මසක් කුස දරමිනි
අඹ ඉඹුල් දම් පේර නාරං දැක නුඹේ ඇස් ඉගිලුණී
අතීතයේ අලු ගසාලා ඇය අම්මගෙත් සෙනෙහේ වුණී

නුඹෙන් විලි බර ගන්න වුණි නම් මමත් ගෙන නුඹ රකිනෙමි
නුඹට දින ලැබ් ඒ දිනේදි ම අහස් කුස ගොරහැඩි වුණි
මොර වහින වැහි වැව් පුරෝ ගෙන ඉවුරු ඉහිරන් වැගිරුණි
අහස් වැහි දෙය්යනේ නුඹ පැලෙන් ඈ ගෙන හැංගුණි

මාල හත ඔසරියෙන් හැඩවුණු දීගෙකට යන මගෙ දුවේ
අම්මා අද නුඹේ හිටිය නම් මට පාළුවක් නං නොම දැනේ
බැනෝ නුඹ හට ඇයව දෙන්නට බොහෝ දුක් අපි ඉහිලුවේ
අම්මාවත් නුඹ වාගෙමයි මං මගේ ගෙපැලට ගෙන ගියේ

මගේ සුදු හාමිනේගේ වත දෝණිගෙන් මට පෙනෙනවා
ගෙපැල සිරියක් කැන්දුණේ ඇගෙ සිනාවෙන් යැ'යි හිතෙනවා
නුඹත් වාගෙම ඇයත් ගෙපැලක් එළිය කරනට හිඳිනවා
හාමිනේ ගිය නිවන් සිරි පුර යන්ට මං දින ගණිනවා

ශ්‍රීම්ලා රන්දිනී හෙට්ටිමුල්ල
මානවවිද්‍යා අධ්‍යයනාංශය

# ලිලී මල

"ආහ්... හරි..දැන් ඇස් අරින්න."

"ඕහ් මයික්... ඔයා මාව පුදුම කළා..."

"ඇත්තම ද?"

"ඇයි නැත්තේ..." කියමින් ඇය මට වැලමිටෙන් පහර දී ලිලී මල් කළඹ ගෙන සුවඳ බැලුවාය.

"ඔයා දන්නවානේ මම ලිලී මල් වලට ගොඩක් කැමති විත්තිය. ඒත් මං හිතන්නේ මේ තමයි මට ලැබුණු හොඳ ම ලිලී මල් කළඹ... ඒ මම වැඩියෙන් ම ආදරය කරන කෙනාගෙන් මම කැමති ම තැන දී මට මේක ලැබුණ නිසා වෙන්න ඇති. මේ මල් හරි ම නැවුම්. ඒ වගේ ම හරි ම සුවඳයි." ඇය නැවත වරක් ලිලී මල් කළඹෙහි සුවඳ බැලුවාය.

"මට හිතුණා බෙලා... ඔයා මේකට කැමති වෙයි කියලා. අනික අපි පැරීසියට ආවට පස්සේ මට ඔයාට මුකුත් අරන් දෙන්නත් බැරි වුණානේ... මේ ඒකට..." මම ඇසක් ඉගි මැරුවෙමි.

"ගොඩක් ස්තූතියි මයික්. මම ඔයාට ගොඩක් ආදරෙයි."

"මමත්..." මම ඇගේ නළලත සිප ගත්තෙමි.

"ම්ම්... මට ඉවසිල්ලක් නැහැ අයිෆල් කුළුණ ළඟට යනකන්... එහෙනම් අපි යමු ද?"

"අනිවාර්යයෙන් ම..."

****

බෙලා... මගේ ආදරණීය පෙම්වතිය. නැහැ. දැන් ඇය මගේ ආදරණීය බිරිඳයි. අපි පෙරේදා විවාහ වූවෙමු. මුල දී බෙලාගේ ගෙදරින් මට අකැමති විය. එක අතකින් බෙලාගේ ගෙදර අය අකැමති වෙන එක සාධාරණය. මොක ද බෙලා කියන්නේ උගත් තරුණියකි. ඇය ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ප්‍රංශ භාෂාව පිළිබඳ උපාධිධාරිකනියකි. මේ වන විට ඇය භාෂා පරිවර්තිකාවක ලෙස සේවය කළ ද, මා ඇයව හැඳින ගන්නා කාලයේ දී ඇය විශ්වවිද්‍යාලයේ අවසන් වසරෙහි ඉගෙනුම ලැබුවාය.

බෙලාව මගේ කර ගන්න තිබුණු කැමැත්ත නිසා ම දැන් මගේ ම කියලා අවන්හලක් තිබුණ ද ඒ වන විට මට ලන්ඩන්වල හෝටලයක වේටර්වරයෙකු ලෙස වැඩ කළෙමි. බෙලාව මුණ නොගැහුණා නම් සමහර විට මා තවමත් ඒ හෝටලයේ වේටර්වරයෙකු ලෙස වැඩ කරනවා විය හැකිව තිබුණි. කොහොම වුණත් බෙලාව මට මුණ ගැහුණෙත් ඒ හෝටලයේදී ම එක් හැන්දෑවකය. ඒක හරි ම අහඹු සිදුවීමකි.

"සමාවෙන්න..." ඒ කට හඬ ඇහෙන කොට මම හිටියේ මේසයක් පිරිසිදු කරමින් සිටියෙමි.

"ඔව්... කියන්න" මම හැරුණෙමි.

ඒ තමයි මා බෙලාව දැක්ක මුල් ම දවසයි. බෙලා ඇවිත් හිටියේ ඇගේ යෙහෙළියන් තිදෙනෙකු සමඟ ය. ඇගේ නිකැළැල් පැහැපත් වටකුරු මුහුණෙහි වූ දීප්තිමත් නෙත් යුගලෙහි පෙර මතක රැඳි හුරු පුරුදු බවක් මට දැනුණි. එදා ඇය ඇඳ සිටි ලැවැන්ඩර් දම් පාට කෙටි ගවුම මට අද මෙන් මතකය. ගෙල තෙක් වූ රන් පැහැති රැලි කොණ්ඩය ඇයට ගෙනාවේ අපූර්වත්වයකි. ඇයත් ලැවැන්ඩර් මලක් වගේ ම ලස්සනයි. මට සිතුණි. මම ඈ දෙස කොපමණ වේලාවක් බලා උන්නා දැයි නොදනිමි.

නමුත් එය සුළු වේලාවක් නොවන බව ඇගේ කට හඬින් පියවි සිහියට එන විට ඇගේ යෙහෙළියන් එකිනෙකාට ඉඟි බිඟි පාමින් උන් ආකාරයෙන් මට වැටහුණි. ඉන් මා පමණක් නොව බෙලා ද අපහසුතාවයට පත්ව සිටියාය.

"ආහ්... මේ... අපිට පේස්ට්‍රි හතරකුයි බීම හතරකුයි ඕන." ඈ වචන ගැළපීය.

"ආහ්...හරි ඉන්න මම අරන් එන්නම්." මම වහා ඉන් පිටත් වුණෙමි. නමුත් ඔවුන්ගේ සිහින් සිනා හඬ මට ඈතට යන විටත් ඇසුණි. මට දැණුන ලැජ්ජාව මෙන් ම බෙලාගේ මුහුණ අමතක කිරීමට මා තුළ වූ නොහැකියාව ද විස්තර කිරීමට නොහැක. ඔවුන්ගේ ඇනවුම රැගෙන එන විටත් ඔවුන් කසුකුසු ගාමින් උන් අතර මා ළංවත් ම දැඩි නිහඬතාවක් ඇති කිරීමට ගත් උත්සහය අසාර්ථක නොවීය. ඇනවුම භාර දුන් මා එතැනින් පිටත්ව ගිය ද ඉඩ ලද විටෙක මා හොරැහින් ඈ දෙස නොබැලුවා ම නොවෙයි. එසේ කරන්නට ගොස් බෙලාට හසු නොවුණාම ද නොවෙයි.

අඩ හෝරාවක් පමණ කාලය ගත කළ ඔවුහු ගෙවීම් සිදු කොට නික්ම ගියෝය. මා ඈ දෙස බලා උන්න ද ඈ මා දෙස නොබැලුවාය. ඉන් මා තුළ උපන් වේදනාව මට දැනුදු අමතක කළ නොහැක. තවමත් වීදි පහන්වලින් ආලෝකමත් නොවූ වීදියේ ඔවුන් ගමන් කරන සැටි බලා මම උන්නෙමි. අඩුම තරමින් ඇගේ නමවත් දැන ගන්න තිබුණා නම්... එලක් නැත. අතහැර දමනවා මිස. සමහර විට මේ ඈ දකින අවසන් අවස්ථාව ද විය හැකිය. බිඳුණු හදවතින් මා ඔවුන් සිටි මේසය වෙත ගියේ එය පිරිසිදු කරන අටියෙනි.

"මේ මොකක් ද....?" ඈ වුන් අසුනේ මුදල් පසුම්බියක්. මගේ සිත ප්‍රීතියෙන් පිනා ගියේය. නවකතාවල මෙවැනි දේ සිදු වූවත් සැබවින් ම මෙය විය හැකි ද?. මම එය ගෙන විවෘත කර බැලුවෙමි. එය ඇයගේ ම විය. බෙලා ඇන්ඩර්සන් ලෙස එහි නම සටහන්ව තිබුණි. මිතුරියන්ගෙන් වෙන් වී යමින් උන් ඇගේ සේයාව

තවමත් වීදියෙන් නොමැකී ගොස් තිබූ බැවින් මම හනික ඈ වෙත දිව්වෙමි. පිස්සෙකු මෙන් දිව්වෙමි. අවසන ඈ වෙත ළං වූයෙමි.

"මිස් බෙලා..." මම ගැහෙන හඬින් ඇමතුවෙමි. ක්ෂණයෙන් ඈ මා වෙත හැරී දෑස් විසල් කොට බැලුවාය.

"මම හිතන්නේ මේක ඔයාගේ වෙන්න ඕනි..." මම නිහඬතාව බිඳ පසුම්බිය ඈ වෙත පෑමි.

"අනේ... මේක... මේක මගේ තමයි. මට කොහොම අමතක වුණා ද දන්නෙ නැහැ" ඈ එය දෑතින් ම ගනිමින් කීවාය. මම සිනාසුණෙමි.

"හොඳ වෙලාවට අමතක වුණේ..." මම සිතින් සිතුවෙමි.

"ඔයාට ගොඩක් ස්තුතියි..."

"මම මයික්" මම ඉස්සර වුණෙමි.

"ගොඩක් ස්තුතියි මයික්." ඈ සිනාසුණාය.

"ඕක සුළු දෙයක්නේ..." අපි නිහඬව බලා වුන්නෙමු.

"ම්ම්...අපි එහෙනම් පස්සෙ හමු වෙමු. නේද?" ඈ කීවාය.

"ඔව්... අනිවාර්යෙන් ම..."

ඈ නික්මුණාය. ඒ මා වෙතින් මිස මගේ හදවතින් නොවෙයි. ඉන් පසුව ද මට බෙලාව අවන්හලේ දී කිහිපවතාවක් ම මුණ ගැසුණාය. පසුකාලීනව එය ඇගේ පුරුද්දක් බවට පත් විය. ඉදින් අපි මිතුරන් වීමු.

පසුව... ඔව්... අපි පෙම්වතුන් වීමු. අතීතයට හැරී බලන කල අපේ ආදර අන්දරය ද නවකතාවකට දෙවැනි නැත.

****

පැයක් වැනි කාලයක් තුළ දී අපි අයිෆල් කුළුණ ළඟට පැමිණියෙමු. සැබවින් ම එය මා හිතුවාටත් වඩා විශාලය. මෙය මාගේ පළමු පැරිස් සංචාරය වුව ද බෙලාට නම් එය එසේ නොවේ.

"ඕහ් මයික්... මේ බලන්නකෝ... මේ අයිෆල් කුළුණ ගිය සැරේ දැක්කට වඩා තව ටිකක් මිටි වෙලා වගේ කියලයි මට හිතෙන්නේ" ඈ කෑ ගසා සිනාසුණාය.

"ඇත්තට ම එහෙම දෙයක් වෙන්න පුළුවන්නේ බෙලා... මොක ද මම මේ අයිෆල් කුළුණට වඩා උසයිනේ..." මම ඇඟිලි වලින් ඉස්සී කීමි.

"ඕහ් මයික්..." ඈ මගේ පපුවට පහර දී සිනාසුණාය.

"අපි ෆොටෝ එකක් ගමු ද?" ඒ බෙලාය.

"එකක් නෙවෙයි. සීයක් ම ගමු."

****

පැය කිහිපයක් අපි අයිෆල් කුළුණ ළග ගත කළෙමු. ඉන් පසුව අපි අයිස් ක්‍රීම් කමින් අපි නොදන්නා වීදි පුරා ඇවිද්දෙමු.

"මයික්... අර බලන්න... පරණ බඩු විකුණන කඩයක්..."

"පරණ බඩු ?" මම බැලීමි.

"ඔව්... ඔය වගේ තැන්වල ලස්සන පරණ ආයිත්තම ගොඩක් තියෙනවා. පරණ පොත පත්... තව ගොඩක් පරණ දේවල් තියෙනවා. ඒවා ටිකක් මිලයි නම් තමා. ඒ වුණාට ගොඩක් වටිනවා. මමත් කැමතියි පරණ ප්‍රංශ පොත් ටිකක් මිලට ගන්න. මොකද කියන්නේ?. ඔයත් කැමති දෙයක් තියෙනවා නම් බලන්න පුළුවන්. අපි යමුද?" ඈ මගේ දෑසට එබුණාය.

"අපි යමු... හැබැයි මම නම් හිතන්නේ නැහැ මට හරි යන දෙයක් ඔතන තියෙයි කියලා..."

අපි සාප්පුව තුළට ගියෙමු. සැබවින් ම එය විසිතුරු අපූරු එකකි. නොයෙක් පැරණි ආයිත්තමවලින් එය පිරී තිබුණි. බෙලා පොත් තෝරන අතරතුරේ දී මම සාප්පුව තුළ ඔබ මොබ ඇවිද්දෙමි. එහි දී වම් කෙළවරෙහි වූ කැටයම් දැමූ මේසයක් මත වූ තද දුඹුරු පැහැති හම් බෑගය වෙත මගේ ඇස් යොමු විය. එය පැරණිය. නමුත් එහි අමුතු ම ලස්සනකුත් හුරු පුරුදු බවකුත් විය. මම එය අතට ගෙන බැලුවෙමි.

"ඔයා ඕකට කැමති ද මයික් ?" පොත් කිහිපයක් අතැ'තිව උන් බෙලා ඇසුවාය.

"එහෙම ම නැහැ. ඒත් මේකේ අමුතු ම ලස්සනක් තියෙනවා නේ ?"

"එහෙනම් අපි ඕක අනිවාර්යෙන් ම ගමු." ඈ සිනා සී කීවාය.

****

අතරමගදී ම රාත්‍රී ආහාරය ගත් අපි නවාතැන්පළට එන විට රාත්‍රී දහයයි තිහ පසු වී තිබුණි. අපි බෙහෙවින් වෙහෙසට පත්ව සිටියෙමු. බෙලා නාන කාමරයට ගිය අතර මම ඇඳට වැටුණෙමි. යන්තමින් දෑස් පියවෙන්න හදන විට ම මගේ සිහියට ආවේ දහවල් මා මිලට ගත් බෑගයයි. "ඒක හරියට බලන්නවත් බැරි වුණානේ..." එය මේසය උඩ තිබෙනු දුටු මම එය රැගෙන ඇඳට විත් විපරම් කොට බැලීමි.

ඒ තද දුඹුරු පැහැති හම් බෑගය බර එකක් විය. මේකත් නරක ම නැහැ. එය විශාල පොකට් දෙකකින් සමන්විත විය. නැත. පිටුපස විශාල පොකට් එක තුළ වූ තවත් කුඩා රහස් පොකට් එකක් මට සොයා ගත හැකි විය. මම එය විවෘත කොට බැලීමි.

"මේ මොකක් ද ?"

ඒ පොකට්ටුව තුළ නවන ලද අඳුරු පැහැති කඩදාසියක් විය. පත්තර කොළයක් ද ?. මම එය දිග හැර බැලුවෙමි. එය

ලියමනක් බව මට වැටහුණි. එය තද කළු තීන්තෙන් ප්‍රංශ බසින් ලියන ලද්දකි. බැලූ බැල්මට එය කලබලයෙන් ලියන ලද්දක් බව පිටුව පුරා විසිරී තිබුණු තීන්ත බිඳු කිහිපයෙන් මට වැටහුණි. මගේ හිත කුතුහලයෙන් පිරී ඇත. මේ ලියමනේ මොනවා ලියලා ඇත් ද ?. මට ප්‍රංශ බස බැරි වුණාට මොකද බෙලා නම් මෙය ඉතා පහසුවෙන් කියවාවි. ඉන් මම සැනසුණෙමි.

"මයික්... ඔයා නාන්නේ නැද්ද ? දැන් හොඳට ම රෑ වෙලා" මම ගැස්සුනෙමි.

"බෙලා... මේ බලන්න මට ලැබුණ දේ..."

"ඔය මොකක් ද ?" ඈ හිස පිසදමමින් ඇසුවාය.

"ලියමනක්... අපි අද ගත්ත බෑග් එකේ තිබුණේ"

"බෑග් එකේ තිබුණා."

"හ්ම්... දිනයක් සටහන් කරලා නැති වුණත් පෙනුමින් ගොඩක් පරණ එකක් වගේ."

"හ්ම්..."

"මොනවද ලියලා තියෙන්නේ ?"

බෙලා ලියමන පුරා ඇගේ දෑස් යොමු කළාය. "මයික්... මේක පෙම් හසුනක් වගෙයි"

"පෙම් හසුනක් ? ඉතිං... ඉතිං මොනවද ලියලා තියෙන්නේ"

"මේකේ ලියලා තියෙන්නේ..."

*ආදරණීය ඇලිස්,*

*කොහොම ද මගේ ලිලී මලට ? මම ඉල්ලනවා ඔයාගෙන් මේ ලියුම රෑට කියවන්න කියලා... මොකද මම මේ ලියුම ලියන වෙලාවේ අහස තරුවලින් පිරිලා. ඉතිං ඔයා මේ ලියුම රෑට අහස දිහා බලාන කියවන කොට දැනෙයි මම ඔයා ළඟ ඉන්න විත්තිය.*

*මුලින් ම මට සමාව දෙන්න කියලා ඉල්ලනවා ඔයාට ලියන්න ප්‍රමාද වුණාට. මේ ප්‍රංශ හමුදා කඳවුරේ මුළුතැන්ගෙයි වැඩවල නම් ඉවරයක් නැහැ. ඒ වුණත් මම මගේ මේ ලිලී මල වෙනුවෙන් කොහොම හරි වෙලාවක් හොයා ගත්තා. යුද්ධයත් එන්න එන්නම දරුණු වෙනවා කියලයි ආරංචිය. මේ දේවල් දරා ගන්න ටිකක් අමාරු වුණත් ඊටත් වැඩියෙන් දරා ගන්න අමාරුයි ඔයාව නොදැක ඉන්න එක ඇලිස්. එදා මම දුම්රියට නගින වෙලාවෙ ඔයාගේ ඇස්වල තිබුණු කඳුළු තවමත් මාව රිද්දනවා. හැම වෙලාවෙම මට හිතෙනවා ඔයා ළඟ හිටියා නම් කියලා. මට හැම වෙලාවෙම ඔයා ළඟ ඉන්න ඕන. ඉතිං මම තීරණය කළා හමුදාවෙන් අස්වෙන්න. මම මේ ගැන කපිතාන් ජෙරම්ගෙන් කිහිප වතාවක් ම ඉල්ලීම් කළා. ඔහු නම් කියන්නේ යුද්ධයත් දරුණු නිසා සලකා බලන්නම් කියලයි. බය වෙන්න එපා. දෙවියන් වහන්සේ හැම දෙයක් ම හොඳින් විසඳාවි.*

*මම හිතා ගෙන ඉන්නේ ආපහු ගමට ආවම පොඩියට අවන්හලක් කරන්න. මොකද කියන්නේ ?. ඔයා කැමතියි නේද ?. ඊටත් කලින් අපි විවාහ වෙමු නේද ?. මට ම කියලා පවුලක් නැති එකේ ඔයාගේ පවුලේ අයටයි අපේ යහළුවන්ටයි කියලා පල්ලියේ දී විවාහ වෙමු. ඊට පස්සේ අපේ ම කියලා ගෙදරක අපේ දරුවොත් එක්ක සතුටින් ජීවත් වෙමු. ඔයා කැමතියි නේද මගේ ලිලී මල ?.*

*මේ ලියමනත් එක්ක මම මගේ පීවිතය ඔයාට ඇඳලා එවනවා. ඒ ඔයයි මගේ ලිලී මල. මේක ඇඳලා ඉවර කරන්න මට ටිකක් කල් ගියා. මම හිතනවා ඔයා ඒකට ගොඩක් කැමති වෙයි කියලා. දැනට මම නවතින්න ද ?. මොකද මම මේ ලියමන නිවාඩු එන සැරයන් ලියොන්ට තැපැල් කරන්න දෙන්න ඕන. මම පොරොන්දු වෙනවා ඉක්මනට ම ඔයාව බලන්න එනවා කියලා. ආදරෙයි හැමදාමත් ඔයාට. පරිස්සමෙන් ඉන්න. දෙවි පිහිටයි.*

"පව් නේද මයික්...?"

"මටත් හිතා ගන්න බැහැ බෙලා..." මම දුකින් කීවෙමි.

නිරායාසයෙන් ම මට දිගු සුසුමක් පිට විය. ඒ එඩ්වඩ් සහ ඔහුගේ ලිලී මල නාමයෙනි. මක් නිසා ද යත් ඒ ලියමන දැන් මා සතු නම්... එඩ්වඩ් ලියූ ලියමන ඇලිස්ට නොලැබෙන්නට ඇති. නැතිනම් සැරයන් ලියොන් තැපැල් නොකරන්නට ඇති. එසේත් නැතිනම් සැරයන් ලියොන්ට ඔහුගේ බෑගය මඟ හැරුණාවත් ද?. එහෙම වුණා නම් මෙපමණ කලක් මේ බෑගය කොහෙද තිබුණේ?. සමහර විට... අනේ මන්දා... කරුණු කෙසේ වුවත් එඩ්වඩ් ඇලිස් ආදර කතාව සතුටින් නිම නොවන්නට ඇතැයි මට සිතුණි. මට එසේ සිතීම ද අසාධාරණ නොවෙයි.

"ඇලිස් මේ ලියමන එනකන් බලාන ඉන්න ඇති නේද මයික්...?"

"හ්ම්..."

"මයික්... ලියමන විතර ද තිබුණේ ? මේකේ හැටියට නම් එඩ්වඩ් ඇඳපු ඇලිස්ගේ සිතුවමකුත් තියෙන්න ඕනි."

"ඉන්න මම බලන්නම්..." මම බෑගයට අත පෙවීමි.

"ඕහ්... තියෙනවා...තව කොළයක් තියෙනවා" මම කෑ ගැසුවෙමි.

"කෝ... ගන්න බලන්න" බෙලා ද මා මෙන් ම නොසන්සුන්ය.

බෑගයෙන් පිටතට ගත් කඩදාසිය මම සෙමින් දිග හැරියේ එය ලාවට දිය වී ඇති බවක් මට දැනුණු බැවිනි. අවසන මම එඩ්වඩ් අතින් ඇඳි සිතුවම දුටිමි.

"මේ මොකක් ද මේ... ?" මට කෑ ගැසුණි.

"කෝ බලන්න..." බෙලා එබුණාය. "දෙවියනේ... මේ... මේ... මමනේ ?" ඈ මා දෙස බලා බෙරිහන් දුන්නාය.

සැබෑවකි. සිතුවමෙහි උන්නේ බෙලාමය. මගෙ බෙලාමය. දෙවියනේ මොනව ද මේ වෙන්නේ ? එතකොට... එතකොට බෙලා

කියන්නේ ගිය ආත්මයේ ඇලිස් ද? එඩ්වඩ් ඇලිස්ට කියන්නේ ලිලී මල කියලා. බෙලාත් ලිලී මල් වලට ගොඩක් කැමතියිනේ. ඒත් එහෙම දෙයක් වෙන්න පුළුවන්ද? වෙන්න බැහැ. මම බෙලා දෙස බැලුවෙමි. ඕ බිය වී මදෙස බලා උන්නාය.

"මයික්..." බෙලා වෙව්ලන කට හඬින් මා ඇමතුවාය.

"ම්ම්..."

"ඇලිස් කියන්නේ ගිය ආත්මයේ මම ද? එහෙමනම්... එතකොට ඔයා...? ඔයා... එඩ්වඩ් ද ?

**ඩී. එල්. එන්. විජේරත්න**
**භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය**

# සැලුන් වාසේ

රුවැති ළඳුනගේ දිගු ඇහිබැම් අඬුවලින් ඇද හැඩට ගලවමි
සුදු ටිෂූ තබා ඇස් පාමුල ඔවුනැසින් වට කඳුළු වියළමි

සිත් බඳින දිගු කැරලි කෙහෙරැලි රුවට ඇද ඇර කෙළින් කරනෙමි
කඩා හැලෙනා කුරු හිසකේ නව නවා මුදු කැරලි ම වනෙමි

ඉලන්දාරින්ගෙ කෙටි කෙස්වැටි ජෙල් අහුරැලමි - ෆර්ම් කරනෙමි
අඳුරු මලකඩ දුඹුරු පාටින් හිසේ තැන් තැන් ටින්ට් කරනෙමි

භින්නරුචි යුත් මෙලෝ අබියස - මවිත වෙමි මුත් කිසිත් නොදොඩමි
දිරන බව දිනෙක මේ කෙහෙරැලි සිහි තබා 'හිස්' හරඹ කරනෙමි

නේක නෝනාවරුන් මහතුන් නරකෙසෙහි කාල පැහැ තවරමි
නොවන වනගත ඔවුන් හිස් අස අසීමිත කමටහන් ලබනෙමි

රූ වඩා නෙක පාට තවරා ලත් මුදල එලවැලට තවරමි
දුවේ උඹ බුදුවෙයන් පතනා අන්ධ මව් පොහොණි කර සනසමි

ලවන් නිය නේකයුරු සායම් අතර දිවියේ ගැඹුර පසිඳමි
අරන් වැසි තපස්වරියක වී සැලුන්වාසේ බවුන් වඩනෙමි

**සදර්ශී කුසුම්වර්ෂා රණසිංහ**
**ඉංග්‍රීසි සහ වාග්විද්‍යා අධ්‍යයනාංශය**

නිර්මාණ සංග්‍රහය

ප්‍රකාශනය
පීඨ ප්‍රකාශන කමිටුව
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**Tel : +94 (0) 11 2803196**
**Fax : +94 (0) 11 2803196**
**Web : http//fhss.sjp.ac.lk**

මිල රු. 300/-

ISBN 978-624-5360-12-3